# ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය

# 2018 වසර කාර්යසාධන වාර්තාව

07 වෙනි මහල
සෙත්සිරිපාය
අදියර II
බත්තරමුල්ල

2019 - මැයි



**ගරු අර්ජුන රණතුංග මැතිතුමා (පා.ම.)**
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය

**கௌரவ அர்ஜுன ரணதுங்க அவர்கள் (பா.உ)**
போக்குவரத்து மற்றும் சிவில் விமான
சேவைகள் அமைச்சர்

**Hon. Arjuna Ranathunghe (M.P.)**
Minister of Transport and Civil Aviation



**ගරු. අශෝක් අබේසිංහ මැතිතුමා (පා. ම.)**
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා රාජ්‍ය අමාත්‍ය

**கௌரவ அஷோக் அபேசிங்க அவர்கள் (பா.உ)**
போக்குவரத்து மற்றும் சிவில் விமான
சேவைகள் இராஜாங்க அமைச்சர்

**Hon. Ashok Abeysinghe (M.P.)**
State Minister of Transport and Civil Aviation



**එල්. පී. ජයම්පතී මහතා**
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශ ලේකම්

**திரு. எல்.பி. ஜயம்பதி அவர்கள்**
போக்குவரத்து மற்றும் சிவில் விமான
சேவைகள் செயலாளர்

**Mr. L. P. Jayampathy**
Secretary to the Ministry of Transport and Civil Aviation

# දැක්ම

ශ්‍රී ලංකාව කලාපය තුළ ප්‍රමුඛතම මහජන කේන්ද්‍රීය ප්‍රවාහන පද්ධතිය සහිත රට බවට පත් කිරීම.

# මෙහෙවර

ජනතාවගේ ජීවන තත්වයන් නගා සිටුවීම උදෙසා නව්‍යතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම.

# පටුන

## I කොටස


**1. හැඳින්වීම 13**

**2. ආයතන අංශය විසින් ඉටු කරන ලද කාර්යභාරය 14**

2.1 2018 වර්ෂය තුළදී ආයතන පාලන අංශය විසින් ඉටුකරන ලද කාර්යයන් 14

2.2 අභ්‍යන්තර පාලන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් 16

2.2.1 ප්‍රවාහන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් 18

2.3 2018 වර්ෂය තුළදී ඉඩම් අංශය විසින් ඉටුකරන ලද කාර්යයන් 19

2.4 2018 වර්ෂය තුළදී දුම්රිය පාලන අංශය විසින් ඉටුකරන ලද කාර්යයන් 22

2.5 නීති අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් 26

2.6 කැබිනට් අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් 27

**3. 2018 වර්ෂය තුළදි සැලසුම් අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් 29**

**4. මූල්‍ය කළමනාකරණය හා ප්‍රගතිය 33**

4.1 ප්‍රසම්පාදන කමිටු 33

4.2 ගිණුම් වාර්තා සකස් කිරීම සහ කාර්යක්ෂමතාවය 33

**5. 2018 වර්ෂය තුළදි ගුවන්සේවා අංශය විසින් ඉටු කරන ලද කාර්යයන් 41**

**6. 2018 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකරන ලද විමර්ශන රාජකාරී පිළිබඳ විස්තර සාරාංශය 44**

**7. නව දුම්රිය මාර්ග සංවර්ධන අංශය 45**

7.1 මාතර - කතරගම නව දුම්රිය මාර්ගය 46

7.1.1 දුම්රිය මාර්ගය ඉදිකිරීම මඟින් ලැබෙන සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ 46

7.1.2 ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය 47

7.1.3 දේශීය අරමුදල්වලින් ව්‍යාපෘතිය තුළ සිදුකල වැඩ කටයුතු 47

7.1.4 මූල්‍ය ප්‍රගතිය 48

7.2 කුරුණෑගල - හබරණ නව දුම්රිය මාර්ගය 48

7.3 කොළඹ තදාසන්න දුම්රිය විදුලිකරණය කිරීමේ ව්‍යාපෘතිය (CSRP) 49

7.4 කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 51

7.5 කැලණිවැලි දුම්රිය මාර්ග සංවර්ධනය 53

7.6 GPS තාක්ෂණය භාවිතා වන දුම්රිය මෙහෙයුම් තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල තොරතුරු පද්ධතිය සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධතිය සමඟ සම්බන්ධ කිරීම 53

## II කොටස


**1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 56**

1.1 හැඳින්වීම 56
1.2 සමස්ත විග්‍රහය 56
1.3 යටිතල පහසුකම් 58
1.3.1 දුම්රිය මාර්ග, ගොඩනැගිලි, පාලම් වැඩි දියුණු කිරීම 58
1.3.2 දුම්රිය ඇණිය 59
1.3.3 සංඥා හා විදුලි සංදේශ පද්ධතිය 59
1.4 මූල්‍ය ප්‍රගතිය 60
1.5 අභියෝග හා ගැටලු 60
1.6 දුම්රිය සේවාවේ ගුණාත්මක හා විශ්වසනීයත්වය ඉහළ නැංවීම සඳහා 2018 වසරේ ක්‍රියාත්මක කළ හා ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් 61

**2. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 62**

2.1 හැඳින්වීම 62
2.2 දෙපාර්තමේන්තුවේ කාර්යයන් 62
2.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 64
2.3.1 රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම 64
2.3.2 ඉ - මෝටරින් ව්‍යාපෘතිය 65
2.4 අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය 65
2.5 2018 වර්ෂයේ කාර්යසාධනය 67
2.6 2018 වසර සඳහා ඇස්තමේන්තු කළ ආදායම හා තත්‍ය ආදායම 68
2.7 2019 වර්ෂයේ අපේක්ෂාවන් 68

**3. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 69**

3.1 හැඳින්වීම 69
3.2 2018 වර්ෂයේ බස් රථ ධාවනය තුළින් ලබා ගෙන ඇති ප්‍රගතිය 69
3.3 සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය 70
3.4 මෙහෙයුම් තත්ත්වය 71
3.5 2018 වර්ෂය තුළදී සේවා සැපයුම වර්ධනය කර ගැනීම සඳහා උපයෝගී කරගත් නව ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග 71
3.6 මූල්‍ය ප්‍රගතිය 72
3.7 2018 වර්ෂය තුළදී බස් රථ ඇණියේ වර්ධනය හා බස් රථ පුනරුත්ථාපනය 73
3.8 යටිතල පහසුකම් 73
3.9 වෙනත් සංවර්ධන වැඩසටහන් 74
3.10 2018 දෙවන අර්ධ වාර්ෂිකය හා 2019 වර්ෂය තුළ යෝජිත සැලසුම් හා වැඩසටහන් 75

**4. ජාතික ගමනාගමන කොමිෂන් සභාව 78**

4.1 හැඳින්වීම 78
4.2 ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කාර්යයන් සහ එහි ප්‍රගතිය 78
4.3 2018 වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දුන් අභියෝග 85
4.4 2019 වර්ෂයේ අපේක්ෂාවන් 86

**5. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය 87**

5.1 හැඳින්වීම 87

5.2 පරමාර්ථ 87

5.3 ආයතනයේ කාර්යයන් 87

5.4 වර්තමාන කාර්යසාධනය 88

5.5 වෙනත් සංවර්ධන වැඩසටහන් 89

5.6 ආයතනයේ මූල්‍ය ප්‍රගතිය 89

5.7 2018 වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දුන් අභියෝග 89

5.8 2019 වර්ෂයේ අපේක්ෂාවන් 89

**6. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය 91**

6.1 හැඳින්වීම 91

6.2 කාර්යසාධනය -2018 91

6.2.1 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කාර්මික අංශ 91

6.2.2 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ තාක්ෂණික නොවන අංශ 97

6.2.3 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ඒකක 101

6.3 වර්තමාන සුභ සාධන කටයුතු 103

6.4 මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීම 104

**7. සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම 105**

7.1 හැඳින්වීම 105

7.2 ආයතනික මෙහෙයුම් / ක්‍රියාකාරකම් 105

7.3 2018 වර්ෂය තුළ ගුවන් තොටුපොළ හා ගුවන්සේවා සමාගමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 105

7.3.1 භෞතික ප්‍රගතිය 105

7.3.1.1 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ගුවන් සංචලන 105

7.3.1.2 මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ගුවන් සංචලතා 106

7.3.1.3 මඩකලපුව ගුවන් තොටුපොළ නැවත විවෘත කිරීම 106

7.3.1.4 ගුවන් සංතරණ ඉංජිනේරු ව්‍යාපෘති 106

7.3.1.5 වසර 2030 දක්වා වූ රත්මලාන ගුවන් තොටුපොළෙහි ප්‍රධාන සැලැස්ම 107

7.3.1.6 මගීන් සඳහා වූ ක්ෂණික ප්‍රතිපෝෂණ ක්‍රමවේදය සහ පැමිණිලි කළමනාකරණ පද්ධති 107

7.3.1.7 අන්තර් ජාතික සිවිල් ගුවන්සේවා සංවිධානයේ ආරක්ෂක අධීක්ෂණ විගණනය 108

7.3.1.8 ගුවන් ගමනාගමන පාලක පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම 108

7.3.1.9 ගුවන් තොටුපොළ හා ගුවන්සේවා සමාගමේ 35 වන සංවත්සරය 108

7.3.1.10 නව ගුවන් සමාගම් සේවාවන් ඇරඹීම 108

7.3.1.11 මූලික නොවන ව්‍යාපාරික කටයුතු බාහිරකරණය කිරීම 109

7.3.1.12 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ඇති සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම 109

7.3.1.13 2018 වසරේ ජාතික ව්‍යාපාර විශිෂ්ටතා රිදී සම්මාන දිනාගැනීම 110

7.4 2018 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 110

7.4.1 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි දෙවැනි ගුවන් මගී පර්යන්ත ව්‍යාපෘතිය 110

7.4.2 ගුවන් තොටුපොළ හෝටලය 110

7.4.3 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි පවතින ගුවන් මගී පර්යන්ත ගොඩනැගිල්ල (PTB) ප්‍රතිව්‍යුහගත කිරීම හා එහි ආකෘතිය නැවත පිළිසකර කිරීම 111

7.5 2018 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රගතිය 111

**8. සීමාසහිත ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම 112**

8.1 හැඳින්වීම 112

8.2 2018 වර්ෂය තුළදී ආයතනය ලබා ඇති ප්‍රගතිය (භෞතික හා මූල්‍ය) 112

8.3 2018 වර්ෂයේ දී ආයතනයේ කාර්යසාධනය 112

8.4 ප්‍රගතිය 113

8.5 2019 වර්ෂයේ සිදුකිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 113

**9. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව 114**

9.1 මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණු 114

9.2 මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්තව්‍යයන් හා බලතල 114

9.3 2018 වර්ෂය තුළ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම් 115

# I කොටස

## අමාත්‍යාංශයේ කාර්යසාධනය

## 1. හැඳින්වීම

රටක සංවර්ධනය යනුවෙන් හඳුන්වන්නේ එරට ජනතාවගේ ජීවන තත්ත්වය තිරසාරව ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමයි. ජීවන තත්ත්වය ඉහළ මට්ටමක පවත්වා ගෙන යාම සඳහා ඔවුනගේ මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට සුදුසු අවස්ථා ආර්ථිකය තුළ බිහිවිය යුතුය. මෙම මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමේ යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාවය තීරණය කිරීමෙහිලා ප්‍රධාන සාධකයක් වන්නේ එරට ප්‍රවාහන ක්ෂේත්‍රයයි. මෙසේ රටෙහි ආර්ථික වර්ධනය කෙරෙහි ඍජුව බලපාන ප්‍රවාහනය, මහජන හිතකාමී අයුරින් පවත්වාගෙන යාම මහජනයාට ඉතා සමීප අමාත්‍යාංශයක් වන ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය වෙත පැවරී ඇති මූලික වගකීම වේ.

මෙම වගකීම මනාව වටහා ගෙන ඇති ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය පෞද්ගලික හා රාජ්‍ය ප්‍රවාහන මාධ්‍ය ජනතාවට හිතකර අන්දමට හැසිරවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ව්‍යාපෘති හඳුන්වාදීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම තුළින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ අරමුණු සඵල කර ගැනීමට කටයුතු කරයි. විශේෂයෙන්ම මාර්ගස්ථ මගී ප්‍රවාහන වෙළෙඳපළින් බස් මගී ප්‍රවාහන කොටස පහළයාමේ අභියෝගයට මුහුණදීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කෙරෙන සාධනීය පියවර රාශියක් මේ වන විට ක්‍රියාත්මක කර ඇත. එසේම දිනෙන් දින වර්ධනය වන මාර්ගස්ථ අනතුරු අවම කිරීම සඳහාත්, ගුවන් මගී සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහාත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

විශ්වාසදායී, ගුණාත්මක හා සුවපහසු වැනි ප්‍රමිතීන් පවත්වාගනිමින් ඉහළ ඵලදායිතාවය, කාර්යක්ෂම සම්පත් උපයෝජනය, ඉහළ සේවක සුරක්ෂිතතාවය තුළින් සමාජීය ප්‍රතිලාභ මහජනතාවට ලබාගත හැකි ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම උදෙසා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර 2018 වසරේදී ක්‍රියාත්මක කරන ලද එවන් වැඩසටහන් මෙම කාර්යසාධන වාර්තාව මඟින් ඉදිරියේදී පෙළ ගැස්වෙනු ඇත.

## 2. ආයතන අංශය විසින් ඉටුකරන ලද කාර්යභාරය

### 2.1 2018 වර්ෂය තුළදී ආයතන පාලන අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්

ආයතන පාලන අංශයට 2018 වර්ෂය තුළ ලිපි 2,500 ක් පමණ ලැබී ඇති අතර ඒ සම්බන්ධයෙන් අදාළ ආයතනවලට යොමුකර අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

I. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළ ආයතනික කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු නිසි පරිදි සිදුකරන ලද අතර පහත කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදුකරන ලදී.

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විශේෂ ශ්‍රේණියේ මෝටර් වාහන පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

- වාහන වායු විමෝචන භාරකාර අරමුදල වසා දැමීමට මුදල් අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයක් නිකුත් කර ඇති අතර එම අරමුදල නැවත ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

- රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ප්‍රායෝගික පරීක්ෂණය බාහිර පාර්ශව වෙතින් ඉටුකරවා ගැනීම සඳහා සුදුසු පාර්ශව හඳුනාගැනීම සම්බන්ධව පත් කරන ලද කමිටුවේ වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය අමාත්‍ය මණ්ඩල සටහනක් මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට තීරණය විය. මෙම ක්‍රමවේදයට විරුද්ධව ද මේ වන විට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත.

II. 2018 වර්ෂයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අදාළව ආයතනික කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු නිසි පරිදි සිදුකරන ලද අතර පහත කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදුකරන ලදී.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අදාළ ව්‍යාපාර සැලැස්ම සකස් කිරීමට උපාය මාර්ගික ව්‍යවසායකත්ව ආයතනය (SEMA) වෙත භාර දී තිබූ අතර, එය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බඳවා ගැනීම් පරිපාටිය සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමග සාකච්ඡා කර කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි සඳහන් වැටුප් ව්‍යුහය අනුව ප්‍රාථමික ශ්‍රේණීයන්හි තනතුරු (PL 1, PL 2, PL 3) පදනම් කර ගෙන 2018.10.01 දින සිට ක්‍රියාත්මක වන සේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 හි විධිවිධාන අනුව ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අදාළ වැටුප් ව්‍යුහය මාස 04ක් වැනි කාලයක් තුළදී සකස් කිරීමට උපදේශකවරයා ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂවරයෙකු වන වී.ඩබ්.ධනසේන මහතා 2018.10.12 දිනැතිව පත් කර ඇත.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ජනතා සන්තක බස් සමාගම් වල සේවා නියුක්තිකයන්ට නිකුත් කරනු ලැබූවා වූ කොටස් සම්බන්ධයෙන් වන්දි මුදල් ගෙවීමට අදාළව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරන ලද අතර, 2017.12.12 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දන්වා ඇති වාර්තාව හා කොටස් හිමියන්ගේ නාමලේඛනය 2018.09.13 වන දිනැතිව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අවශ්‍ය ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මිලදී ගන්නා ඉන්ධන වෙනුවෙන් 3%ක වට්ටමක් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල අබලි අමතර කොටස් විකිණීමේ කටයුතු සඳහා අමාත්‍යංශයේ නියෝජනයක් ලබාදීම.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සහ ප්‍රශ්න පිළිබඳව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.

- ජූලි වැඩවර්ජකයින් සඳහා සහන ලබාදීමට කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යංශය හා මැදිහත් වී කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අදාළ ආයතනික කටයුතු සිදු කිරීම සහ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

III. 2018 වර්ෂයේ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයට අදාළ ආයතනික කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු නිසි පරිදි සිදුකරන ලද අතර පහත කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදුකරන ලදී.

- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ කාර්ය මණ්ඩලය 2017.11.23 දින අනුමත වී ඇති අතර, ආයතනයේ බඳවා ගැනීම් පරිපාටිය අනුමත කර ගැනීමේ කටයුතු මේ දිනවල සිදු කෙරෙමින් පවතී.

- සීමාවාසික පුහුණුව අවසන් කර ඇති වෛද්‍යවරු ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවය සඳහා යොමු කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සටහන ඉදිරිපත් කර ඇත. ඒ අනුව, සෞඛ්‍ය අමාත්‍යංශයේ වෛද්‍යවරුන්ගේ ව්‍යවස්ථාව අධ්‍යයනය කර ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වෛද්‍යවරුන් සඳහාම සුවිශේෂී වූ ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා පියවර ගැනීමට සාකච්ඡා සිදු කර ඇත.

- විශේෂඥ වෛද්‍යවරයෙකු, වයස අවු 60ට වැඩි වෛද්‍යවරු සහ වයස අවු 60ට වැඩි වෛද්‍ය රසායනාගාර තාක්ෂණික විද්‍යාඥයින් 2019 වසර සඳහාත් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවයට යොදවා ගැනීම වසරකින් දීර්ඝ කර ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

IV. ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගමට අදාළ ආයතනික කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු නිසි පරිදි සිදුකරන ලද අතර පහත කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදුකරන ලදී.

- ආයතනයේ සංවිධාන ව්‍යුහය කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගැනීමට කටයුතු කරන ලද අතර අදාළ බඳවා ගැනීමේ පරිපාටි සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ඇත.

- සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා පුරප්පාඩුව පවතින තනතුරු කිහිපයක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර ඇත.

V. 2018 වර්ෂයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට අදාළ ආයතනික කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු නිසි පරිදි සිදුකරන ලද අතර පහත කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදුකරන ලදී.

- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2018 ක්‍රියාකාරී සැලැස්මට අදාළව රිය අනතුරු, මාර්ග අනතුරු වළක්වාලීමට දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම

- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂන් සභාවක් බවට පත් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීමේ කටයුතු මොරටුව විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වෙමින් සිදු කරගෙන යාම

VI. 2018 වර්ෂයේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් විදේශීය පුහුණු වැඩසටහන් හා වැඩමුළු සම්බන්ධයෙන් වන ප්‍රගතිය පහත පරිදි වේ.

| | පුහුණු වැඩසටහන් ගණන | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| විදේශීය | 27 | 36 |
| දේශීය | 22 | 91 |

## 2.2 අභ්‍යන්තර පාලන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

| වැඩසටහන | ක්‍රියාකාරකම් |
|---|---|
| 01. දෛනික තැපැල නඩත්තුව | i. ලිපි බාර ගැනීම හා බාර දීම<br>ii. මුද්දර යන්ත්‍රය නඩත්තු කිරීම |
| 02. පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව | i. වැටුප් වර්ධක ලබාදීම<br>ජ්‍යෙෂ්ඨ මට්ටම - 28<br>තෘතියිය මට්ටම - 05<br>ද්විතිය මට්ටම - 108<br>ප්‍රාථමික මට්ටම - 45<br>ii. 2019.01.01 ට ඉහත නිලධාරීන් 186 දෙනෙක් සඳහා වැටුප් පරිවර්තන සිදුකිරීම<br>iii. විශ්‍රාම ගැන්වීම හා ස්ථාන මාරු<br>iv. වත්කම් හා බැරකම් ප්‍රකාශ<br>v. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම<br>➢ රියදුරන් සඳහා දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණද<br>➢ කා.කා.ස සඳහා තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇත. |

| වැඩසටහන | ක්‍රියාකාරකම් |
|---|---|
| 03. අග්‍රහාර රක්ෂණ කටයුතු | i. අග්‍රහාර රක්ෂණාවරණයේ සාමාජිකත්වය ලබාදීම<br>ii. ප්‍රතිලාභ ලබා ගැනීමට ඉල්ලුම් කිරීම |
| 04. බිල්පත් පියවීම | i. දුරකථන, ජල, විදුලි, පවිත්‍රතා, පුවත්පත් යන බිල්පත්වල ගෙවීම් සම්බන්ධ කටයුතු |
| 05. හැඳුනුම්පත් හා ගමන් බලපත්‍ර | i. සේවක හැඳුනුම්පත් ලබාදීම<br>ii. නිදහස් බස් ගමන් බලපත්‍ර ලබා දීම<br>iii. දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත් ලබා දීම.<br>} සියලුම කාර්ය මණ්ඩලයට ලබාදී ඇත. |
| 06. නිවාඩු සම්බන්ධ කටයුතු | i. නිවාඩු ලේඛනය යාවත්කාලීන කිරීම<br>ii. අතිකාල, ගමන් වියදම්, නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර<br>iii. විදේශ නිවාඩු |
| 07. සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබා දීම | බලපත්‍ර 88ක් නිකුත් කර ඇත. |
| 08. රැස්වීම් හා උත්සව සංවිධානය කිරීම | i. මාණ්ඩලික නිලධාරි රැස්වීම් පැවැත්වීම - මෙතෙක් මාසිකව පවත්වා ඇත.<br>ii. වෙනත් රැස්වීම් හා උත්සව පැවැත්වීම |
| 09. තොරතුරු පනතට අදාළ කාර්යයන් ඉටු කිරීම | i. තොරතුරු ඉල්ලීම් ලියාපදිංචි කිරීම - 102<br>ii. තොරතුරු ලබා දීම - 63<br>iii. ප්‍රතික්ෂේප කිරීම - 14<br>iv. වෙනත් ආයතනවලට යොමුකිරීම - 18<br>v. කටයුතු කරමින් පවතින - 07 |
| 10. අමාත්‍යංශයේ කාර්ය මණ්ඩල තොරතුරු | i. කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම<br>- මාසිකව යාවත්කාලීන කරනු ලැබේ<br>- කාර්තුවකට වරක් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවනු ලැබේ.<br>ii. තනතුරු අනුමත කර ගැනීම - අවශ්‍ය පරිදි සිදුකරනු ලැබේ. |
| 11. සේවක ණය ලබා දීම | i. ආපදා ණය<br>- ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව - 102<br>- ලබාදුන් සංඛ්‍යාව - 59<br>- ප්‍රතික්ෂේප සංඛ්‍යාව - 06<br>- කටයුතු කරමින් පවතින - 37<br>ii. උත්සව අත්තිකාරම්, දේපල ණය, විශේෂ අත්තිකාරම් |
| 12. අමාත්‍යංශය යටතේ පවතින දුම්රිය ව්‍යාපෘති වල බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම | ➢ කුරුණෑගල හබරණ දුම්රිය ව්‍යාපෘතියේ තනතුරු 03 ක් සඳහා පත්වීම් ලිපි ප්‍රදානය කර ඇති අතර තනතුරු 5ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතයි.<br>➢ කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ තනතුරු 17 ක් සඳහා පත්වීම් ලිපි ප්‍රදානය කර ඇත. |
| 13. දුම්රිය සංචාරක බංගලා වෙන් කිරීම් | ලැබෙන ඉල්ලීම් අනුව දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් සංචාරක බංගලා වෙන් කිරීම හා ඒ සඳහා මුදල් අය කිරීම |

| වැඩසටහන | ක්‍රියාකාරකම් |
|---|---|
| 14. මැතිවරණ කටයුතු | මැතිවරණ සංගණන කාර්යයන් සඳහා ඉල්ලුම් පත්‍ර මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත යැවීම |
| 15. ගරු අමාත්‍යතුමාගේ සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය සම්බන්ධ කටයුතු | i. ගරු අමාත්‍යතුමාගේ සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය පත්කිරීම් සේවය අවසන්කිරීම්, වැටුප් පරිවර්තන කටයුතු<br>ii. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලබා ගැනීම සඳහා අවශ්‍ය ආයතනික කටයුතු |
| 16. බාහිර ආයතන හා සබඳතා | i. විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධව බාහිර ආයතන හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම<br>ii. බාහිර ආයතනයන් දන්වනු ලබන කරුණු සම්බන්ධව අමාත්‍යාංශය දැනුවත් කිරීම් සිදුකිරීම |

**2.2.1 ප්‍රවාහන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්**

- 2018 වර්ෂයේ දී ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයට වාහන 71 කින් යුක්ත රථ ඇණියක් පැවතුණි.
- එම රථ ඇණියෙන් 2018 වර්ෂයේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ පැවති වාහන පහත දක්වා ඇති ආකාරයට විවිධ ආයතනවල ඉල්ලීම පරිදි එම ආයතනවලට අයිතිය පවරා දීමට කටයුතු කරමින් පවතී.

| අනු අංකය | පවරා දීමට කටයුතු කරන ආයතනය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 02 (GQ-9674,JX-9999) |
| 2 | දුම්රිය දෙපාර්තමේන්තුව | 01 (GC-0341) |
| 3 | ලක්දිව ඉංජිනේරු ආයතනය | 02 (PB-3851,KH-7216) |
| 4 | ජර්මන් කාර්මික අභ්‍යාස පුහුණු ආයතනය | 01 (KA-6798) |

- එම රථ ඇණියෙන් 2018 වර්ෂයේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ පැවති වාහන පහත දක්වා ඇති ආකාරයට විවිධ ආයතනවල ඉල්ලීම පරිදි එම ආයතනවලට අයිතිය පවරා දී ඇත.

| අනු අංකය | පවරා දීමට කටයුතු කරන ආයතනය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 01 (KA-6098) |
| 2 | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 01 (57-8178) |
| 3 | ලක්දිව ඉංජිනේරු ආයතනය | 02 (201-6138,YR-0224) |
| 4 | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 01 (KR-5682) |

- වාහන 11 ක අයිතිය පැවරීමෙන් පසු අමාත්‍යාංශයේ මුළු රථ ඇණිය 2019 වර්ෂයේ දී 60 ක් වේ.

- 2018 වර්ෂය තුළදී අමාත්‍යාංශය සතු වාහන 11 ක් හදිසි අනතුරු ආපදාවන්ට ලක්ව අලුත්වැඩියා කරන ලදි. එම හදිසි අනතුරු සම්බන්ධ මු.රෙ. 104 අනුව පරීක්ෂණ සිදු කරමින් පවතී.

- 2017 වර්ෂය තුළ සිදු වූ හදිසි අනතුරු 9 න් 7 ක මු.රෙ. පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

## 2.3 2018 වර්ෂය තුළදී ඉඩම් අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්

01. දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය රක්ෂිත ඉඩම් සම්බන්ධ කටයුතු

### i. දුම්රිය රක්ෂිත ඉඩම් පරිපාලන කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් මුළු දුම්රිය රක්ෂිත ඉඩම් ප්‍රමාණය දළ වශයෙන් අක්කර 14,129 ක් පමණ වන අතර ඉන් අක්කර 8,756 ක් පමණ දුම්රිය ස්ථාන, මාර්ග, ධාවනාගාර, කාර්යාල හා දෙපාර්තමේන්තුවේ අනෙකුත් සේවාවන් සඳහා ද අක්කර 5,364 ක් පමණ බදු පදනම යටතේ ලබා දිය හැකි දුම්රිය රක්ෂිත වශයෙන්ද හඳුනාගෙන ඇත. නමුත් විධිමත්ව බදු පදනම මත විවිධ පාර්ශව වෙතට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය 10% ක් පමණ ඉතා අඩු ප්‍රතිශතයක් වන අතර විශාල දුම්රිය රක්ෂිත ඉඩම් ප්‍රමාණයක් අනවසර පරිහරණයට ලක් වී ඇත. මෙම අනවසරකරුවන් අතරින් බහුතරය සාමාන්‍ය ජනතාව වේ.

දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය රක්ෂිත ඉඩම් බදු දීමේ බලතල දුම්රිය සාමාන්‍යාධිකාරි සතු වුවද එකී කාර්යයට අදාළ පරිපාලන කටයුතු අමාත්‍යාංශය මඟින් නිරතුරුව අධීක්ෂණය කරන ලදී.

දුම්රිය රක්ෂිත ඉඩම් සඳහා වාර්ෂික බදු ආදායම් එකතුව සාපේක්ෂව පහල අගයක පවතින බව නිරීක්ෂණය වීම මත බදු දීම් හා හිඟ බදු එකතු කිරීමේ ක්‍රමවේද අධ්‍යයනය කිරීමට අමාත්‍යාංශයේ අවධානය යොමු විය. එකී අධ්‍යයනයේදී වාණිජ අධිකාරී කාර්යාලයේ නඩත්තුවන ලිපිගොනුවල දත්ත, ICTA ආයතනය මඟින් හඳුන්වා දී තිබූ පරිගණක තොරතුරු පද්ධතියකට ඇතුළත් කර ඇති බව වාර්තා විය. 2016 වර්ෂයේදී දුම්රිය මාර්ග පදනමින් සලකා බලා සිදුකරන ලද මෙම අධ්‍යයනයේදී දිස්ත්‍රික්ක පදනමින් පවතින දුම්රිය රක්ෂිත ප්‍රමාණයන් හා එවකට ලිපි ගොනු 8,897 ක දත්ත ඇතුළත් කර තිබූ නමුත් එකී දත්ත යාවත්කාලීන වී නොතිබුණි.

වාණිජ අධිකාරී කාර්යාලය වෙතින් ලබා දුන් දත්ත අනුව ලිපි ගොනු සංඛ්‍යාව 5,977 ක් ලෙස සඳහන් කර ඇත. ඉන් ලිපි ගොනු 735 ක බදු ගෙවන බවත් 5,242 ක් බදු නොගෙවන බවටත් දක්වා ඇත. මෙහිදී ICTA පරිගණක වැඩසටහන හා වාණිජ අධිකාරී කාර්යාලය මඟින් ලබා දුන් දත්ත පරස්පර වන බවක්ද නිරීක්ෂණය විය.

එහෙයින් අනවසර නියමානුකූල කිරීමේ වැඩසටහන යටතේ පරිහරණකරුවන් හඳුනා ගැනීමේදී මෙම දත්තද යාවත්කාලීන කිරීම ආරම්භ කරන ලදී.

### ii. ගිවිසුම් සහිත බදු ඉඩම් වල හිඟ බදු අයකිරීම් සම්බන්ධීකරණය හා අධීක්ෂණය

උක්ත බදු නොගෙවන ලෙස සඳහන් කර ඇති ලිපිගොනු 5,242ට අදාළව හිඟ අයකර ගැනීම කඩිනම් කිරීමට 2018 පෙබරවාරි මස ගරු අමාත්‍යතුමා හා ලේකම්තුමා ලබා දුන් උපදෙස් මත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී මූලික කොටස් 03 ක් (විෂය භාර නිලධාරීන්, ශාඛා ප්‍රධානීන්, සහකාර වාණිජ අධිකාරීවරුන්) යටතේ වගකීම පැවරෙන ලෙස මෙම වැඩසටහන සකස් කරන ලද අතර ඒ අනුව 2018 මාර්තු මස සිට දිස්ත්‍රික්ක වශයෙන් ජංගම වැඩසටහන් පවත්වා රු. මි. 12 කට ආසන්න මුදලක් හිඟ බදු ලෙස අයකර ගන්නා ලදී.

මීට අමතරව දුම්රිය රක්ෂිත ඉඩම් පරිහරණය කිරීම වෙනුවෙන් රජයේ හා රජයට අනුබද්ධ ආයතන වෙතින් රු. 493,033,577.01 ක මුදලක් අයවිය යුතුව තිබූ අතර එම හිඟ මුදල් අය කර ගැනීම සඳහා අදාළ ආයතන වල නිලධාරීන් කැඳවා සාකච්ඡා පවත්වන ලදී. එම සාකච්ඡා වලදී ලබා ගත් තීරණ අනුව දුම්රිය දෙපාර්තමේන්තුව විසින් හිඟ මුදල් අයකිරීමේ ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

**iii. රාජ්‍ය හා රජයට අනුබද්ධ හෝ වෙනත් පාර්ශවයන් වෙත දුම්රිය රක්ෂිත නිදහස් කිරීම් හා අත්පත් වලට අදාළ කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය**

- රජරට නවෝදය - "පිබිදෙමු පොළොන්නරුව" සංවර්ධන වැඩසටහනෙහි මූල්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා දුම්රිය රක්ෂිත ඉඩම් නිදහස් කිරීම.

- නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ දුම්රිය රක්ෂිත ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීම
  - 537 වත්ත (දෙමටගොඩ පොලීසිය ඉදිරිපිට)
  - මාලිගාවත්ත ශ්‍රී සද්ධර්ම මාවතේ මූලික පිඹුර කොළඹ 9219 කැබලි අංක (හෙක්. 1.3145) හා මූලික පිඹුර කොළඹ 9294 (හෙක්. 2.8390)

- නෙළුම් කුළුණ ව්‍යාපෘතිය දුම්රිය රක්ෂිත ඉඩම් නිදහස් කිරීම

**iv. අනවසර පරිහරණයන් නියමානුකූල කිරීමේ වැඩසටහන යටතේ බදු දීම් සම්බන්ධීකරණය හා අධීක්ෂණය**

- දුම්රිය රක්ෂිත විශාල වශයෙන් අනවසර පරිහරණයට ලක් වීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු ආදායම නොලැබී යාමටද විසඳුමක් ලෙස හා රජයට ලැබිය යුතු බදු අයකර ගැනීමේ පරමාර්ථයෙන් ආරම්භයක් ලෙසට පොළොන්නරුව හා බදුල්ල දිස්ත්‍රික්කයන් ආවරණය වන සේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය මගින් සම්බන්ධීකරණය කරමින් දුම්රිය රක්ෂිතයන්හි අනවසර පරිහරණයන් නියමානුකූල කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- එකී වැඩසටහන් වලදී හඳුනා ගැනීමට හැකි වූ ප්‍රාදේශීය ලේකම් සනාථ කරන ලද අනවසර පරිහරණකරුවන් පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | පරිහරණය වර්ෂ 10 ට වැඩි පරිහරණකරුවන් සංඛ්‍යාව | පරිහරණය වර්ෂ 10 ට අඩු පරිහරණකරුවන් සංඛ්‍යාව | මුළු පරිහරණ කරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | පොළොන්නරුව | 607 | 641 | 1,248 |
| 2. | බදුල්ල | 576 | 171 | 747 |

- ඒ අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයට අදාළව අයදුම්පත් 1,248 ක්ද බදුල්ල දිස්ත්‍රික්කය සඳහා අයදුම්පත් 747 ක්ද ඉදිරිපත් විය. නමුත් දුම්රිය දෙපාර්තමේන්තුව සතුව "නගරාශ්‍රිතව පිහිටි ඉහළ වටිනාකමකින් යුතු අනවසර ඉදිකිරීම් සිදු කර ඇති ඉඩම්" යන මැයින් අංක අමප/16/0512/709/028 හා 2016.04.07 දින දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉදිරි කටයුතු සිදු කල හැක්කේ පරිහරණ කාලය වර්ෂ 10 ඉක්ම වූ පරිහරණකරුවන් සඳහා පමණකි.

- පොළොන්නරුව දිස්ත්‍රික්කයට අදාළව පරිහරණ කාලය වර්ෂ 10 ඉක්මවූ බවට සඳහන් වූ ඉඩම් කොටස් මැණුම් හා තක්සේරු කරනු ලදුව හිඟ මුදල් කැඳවීම සිදු කරන ලදී. හිඟ මුදල් තක්සේරු කිරීමේදී පරිහරණ තත්වයන් නේවාසික, ව්‍යාපාරික, වගා හා පුන්‍ය ලෙසට විවිධ වන අතර ඊට අනුරූපව තක්සේරු වටිනාකම් ද විවිධ වේ. ඒ අනුව ව්‍යාපාර අරමුණු සඳහා භාවිතා වන බදුකරයන් හැර අනෙකුත් පරිහරණයන් ඉහළ ආදායමක් නොමැති පරිහරණකරුවන් විසින් පරිහරණය කරනු ලබන බැවින් ඔවුන්ට විශාල මුදලක් හිඟ මුදලක් ලෙසට එකවර ගෙවීමට අපහසු බවට වාර්තා විය. ඒ අනුව එකී කරුණ අමාත්‍ය මණ්ඩලයේ අවධානයට නැවතත් යොමු කරනු ලදුව අංක අමප/17/1040/709/042 හා 2017.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම මුදල් කොටස් වශයෙන් අයකිරීමේ ක්‍රමවේදයකට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුවද නැවත බිල්පත් සංශෝධනය කර 97 දෙනෙකු වෙත (රු. 22,472,914.65) යවන ලද නමුත් එමගින් අයකිරීම් සාර්ථක නොවුනි.

- ඒ අනුව නැවත අමාත්‍ය මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදුව "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු දුම්රිය රක්ෂිතයන් අනවසරයෙන් පරිහරණය කරනු ලබන පරිහරණකරුවන් වෙතින් හිඟ මුදල් අයකර ගැනීම" මැයින් අංක අමප/18/0898/808/003 හා 2018.05.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලද අතර එමගින් නිලධාරී කමිටුවක් පත්කර කරුණු අධ්‍යයනය කර නිරීක්ෂණ වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියෝග ලබා දී ඇත. මෙම වාර්තාව මේ වන විට සකස්කර අවසන්ව, සාමාජිකයන් වෙත පරීක්ෂා කර අත්සන් කිරිමට ඉදිරිපත් කර ඇත.

- මීට අමතරව "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දුම්රිය රක්ෂිත ඉඩම්වල පදිංචිව සිටින දුම්රිය සේවකයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම" මැයින් අංක අමප/18/0098/709/004 හා 2018.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය කමිටුවක් නම් කර ඇති අතර ඒ අනුවද කටයුතු කරමින් පවතී.

**v. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු ඉඩම්**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩම් පහත දක්වා ඇති ක්‍රමවේද 7 ක් යටතේ පැවරී ඇති ඉඩම් වන අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශික කාර්යාල 12 ක් ඩිපෝ 107 ක්, උප ඩිපෝ 13 ක්, ප්‍රාදේශීය වැඩපොල 12 ක් හා රියදුරු පුහුණු අභ්‍යාස විද්‍යාල 22 ක් මෙම ඉඩම් වල පිහිටුවා ඇත.

ඒ අනුව,

- 1957 අංක 48 දරණ පනත යටතේ බස් සමාගම් ජනසතු කිරීමේ දී එකී පනතේ 20(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංගමය වෙත ගැසට් නිවේදන මගින් පැවරී ඇති ඉඩම්
- ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පෞද්ගලික අයිතිකරුවන් වෙත ශ්‍රී ලංගම මුදල් ප්‍රතිපාදන මගින් වන්දි ගෙවා අත්කර ගෙන ඇති ඉඩම්
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්යයන් සඳහා භාරදී ඇති රජයේ ඉඩම්
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් මිලදී ගැනීමේ පදනම මත ලබා ගත් ඉඩම්
- දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ශ්‍රී ලංගම කටයුතු සඳහා භාර දී ඇති ඉඩම්
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ශ්‍රී ලංගම කටයුතු සඳහා භාර දී ඇති ඉඩම්
- බාහිර පෞද්ගලික පාර්ශ්ව වෙතින් ශ්‍රී ලංගම ප්‍රතිපාදන මගින් මිලදී ගත් ඉඩම්

මෙසේ අත්කර ගන්නා ලද බොහොමයක් ඉඩම් අඛණ්ඩව භුක්ති විඳිමින් පැවතියද ඇතැම් ඉඩම් සඳහා හිමිකම් තහවුරු කෙරෙන ඔප්පු හෝ සහතික නිකුත් කර නොතිබීම දැනට ශ්‍රී ලංගම මුහුණ දී ඇති උග්‍ර ගැටලුවක් බවට පත්ව ඇත. ඒ අනුව ශ්‍රී ලංගමයේ අවශ්‍යතාවය අමාත්‍යංශය වෙත ඉදිරිපත් කරන ලද පරිදි ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සඳහා මැදිහත් වී ඇති අතර ඒ සඳහා අමාත්‍යංශයේ දායකත්වය ලබාදුන් මූලික අවස්ථා කිහිපයක් පහත දක්වා ඇත.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් වසර 40 කට අධික කාලයක් අඛණ්ඩව භුක්ති විඳිමින් සිටි, ඒකල වැඩපල පිහිටුවා තිබූ ඉඩම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත (460 පරිච්ඡේදය) 44 වෙනි වගන්තිය යටතේ බලය පැවරීමේ සහතිකය ලබා ගත් අතර 2018.07.20 දින එකී ඉඩමේ කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් අනතුරුව සම්පූර්ණ ඉඩම නැවත මිණුම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලදි.

- මට්ටක්කුලිය ඩිපෝව පිහිටුවා ඇති රජයේ ඉඩම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත නිදහස් දීමනා පත්‍රයක් මඟින් පවරා ගැනීමට ශ්‍රී ලංගම හා සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරන ලද අතර ඉදිරියේ දී එම දිමනා පත්‍රය ශ්‍රී ලංගම වෙත ලැබීමට නියමිතය.

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් වේරහැර ඉඩමේ දැනට ඉඩම භාවිත කරනු ලබන ආරක්ෂක අමාත්‍යංශය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඇතුළු පාර්ශව සඳහා නිත්‍යානුකූලව එම ඉඩම් කොටස් පවරාදීම ට මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වෙමින් අමාත්‍යංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංගම වෙත අවශ්‍ය සහය ලබා දෙන ලදි.

- සේවක අර්ථසාධක අරමුදල සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ගෙවිය යුතු සමුච්චිත හිඟ දායක මුදල් ගෙවීමට අදාළව ශ්‍රී ලංගමය විසින් වන්දි හා පොලී මුදල් ගෙවා තිබියදී අයිතිය පැවරී නොමැති ඉඩම් සඳහා බලය පැවරීමේ සහතික ලබා ගැනිමට හා නිදහස් දිමනා පත්‍ර ලබා ගැනීමට සාකච්ඡා පවත්වා ස්ථානීය පරීක්ෂා සිදු කර අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය කටයුතු කරන ලදි.

- එසේම ශ්‍රී ලංගම සතු සියලුම නිරවුල් නොවූ ඉඩම් මේ වන විට ලේඛනගත කිරීමට කටයුතු කරමින් පවතින අතර එම ඉඩම් මැනුම් කර නිදහස් දීමනා පත්‍ර ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇත.

## 2.4 2018 වර්ෂය තුළදී දුම්රිය පාලන අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්

- දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම තනතුරු හා සේවාවන්ට අයත් පත් කිරීමේ සිට විශ්‍රාම යාම දක්වා වූ මාරු කිරීම්, විනය රාජකාරී, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අදාළ රාජකාරී කටයුතු කිරීම හා නැවත සේවයේ පිහිටුවීමට අදාළ රාජකාරී කටයුතු අමාත්‍යංශය මඟින් අදාළ වෙනත් ආයතන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ඉටු කිරීම

- විදේශ නිවාඩු, හදිසි අනතුරු නිවාඩු, හදිසි අනතුරු වන්දි පිළිබඳව රාජකාරී ඉටු කිරීම

- වෘත්තීය සමිති කටයුතු සඳහා සේවයෙන් නිදහස් කිරීම, වෘත්තීය සමිති ඉල්ලීම් හා වෙනත් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

- භාවිතයෙන් ඉවත් කළ රේල්පීලි, සිල්පර කොට ඇතුළු අබලි ද්‍රව්‍ය සහන මිලට ගැනිම සඳහා විවිධ පාර්ශවයන් විසින් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම

- දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටි දේශපාලන පලිගැනීම්වලට හා ජූලි වැඩ වර්ජනයට ලක්වූවන් තවදුරටත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධ අදාළ රාජකාරි ඉටු කිරීම

- දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව නව කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014.04.30 දින අනුමත කර ඇති අතර, එයට අදාළව බඳවා ගැනීමේ පටිපාටි හා වැටුප් පරිමාණ සම්බන්ධව තවදුරටත් සංශෝධනය කෙරෙමින් පවතී.

- අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක : අමප/15/0939/630/015-1 හා 2015.06.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දුම්රිය දෙපාර්තමේන්තුව සුවිශේෂී ආයතනයක් ලෙස සලකා නව තනතුරු හා නව වැටුප් පරිමාණයන් ලබා දී ඇත. මෙහිදී ඇති වී ඇති ගැටලු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අනු කමිටුවක් පිහිටුවා නව වැටුප් ව්‍යුහයක් සකස් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

- පහත සඳහන් තනතුරු සඳහා නව බඳවා ගැනිම් පරිපාටි මේ වන විට අනුමත කර ඇත.
  - ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණය
    අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
  - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපන්තිය
    දුම්රිය රියදුරු, කාර්යභාර නිලධාරී
  - කළමනාකරණ සහකාර අධි පන්තිය සඳහා වන සේවා ගණය
    - දිස්ත්‍රික් පරීක්ෂක (ප්‍රවාහන හා වාණිජ)
    - පුහුණු කිරීමේ නිලධාරී
    - ලේඛනාධිකාරී
  - නීති නිලධාරී තනතුර
  - කළමනාකරණ සහකාර (අධි පන්තිය) ශ්‍රී ලංකා තාක්ෂණ සේවය
    - සැලසුම් ශිල්පී තනතුර
  - කළමනාකරණ සහකාර III, II, I ශ්‍රේණි
    - ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී තනතුර
  - කළමනාකරණ සහකාර (අධි පන්තිය)
    - ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පර්යේෂණ සහකාර තනතුර
  - කළමනාකරණ සහකාර III, II, I ශ්‍රේණි
    - ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පර්යේෂණ සහකාර තනතුර
  - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපන්තිය
    - දිස්ත්‍රික් පරීක්ෂක (යාන්ත්‍රික)
  - විධායක සේවා ගණය
    - අධිකාරී, නියෝජ්‍ය අධිකාරී, සහකාර අධිකාරී (දුම්රිය ආරක්ෂක සේවා)
  - විධායක සේවා ගණය
    - සහකාර ප්‍රවාහන අධිකාරී (බලශක්ති සංරක්ෂණ) හා සහකාර අධිකාරී (යාන්ත්‍රික)
  - කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණය
    - දුම්රිය එන්ජින් රියදුරු සහායක

- අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන
  - උපදේශක තනතුර
- විධායක සේවා ගණය
  - සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්)
  - සහකාර අධිකාරී / නියෝජ්‍ය අධිකාරී(වාණිජ/ගමනාගමන)
  - සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ(පිරිවැය)
  - නියෝජ්‍ය අධිකාරී(වෙළඳ හා අලෙවි)
  - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)
  - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(වාණිජ)
  - නියෝජ්‍ය අධිකාරී (ගමනාගමන)
  - අධිකාරී(වාණිජ)
  - අධ්‍යක්ෂ(සැලසුම්)
- කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බාණ්ඩ 02 සේවා ගණය වාප්පු ලිපිකරු, වාප්පු පරිපාලක, ප්‍රවේශපත්‍ර සංග්‍රාහක, සැරයන්, නිදන මැදිරි සේවක, බට්ලර්, ෂන්ටර්, සංඥාකරු, බඩු පරීක්ෂක, සංචාරක ප්‍රවේශපත්‍ර, විභාගකරු, නඩත්තු පරිපාලක, සංචාරක ප්‍රවේශපත්‍ර පරීක්ෂක තනතුරු

පහත සඳහන් තනතුරු සඳහා රා.ප.ච. 6/2006 අනුව මේ වන විටත් නව බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අනුමත කරවා ගෙන ඇතත්, එම පරිපාටි තවදුරටත් සංශෝධනය වෙමින් පවතී.

- අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) අධි පන්තිය
  - දුම්රිය ස්ථානාධිපති සේවය
  - දුම්රිය ස්ථානාධිපති අධි පන්තිය
- අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික
  - ස්ථිර මාර්ග පරීක්ෂක තනතුර
  - ගොඩනැගිලි පරීක්ෂක තනතුර
  - පාලම් පරීක්ෂක තනතුර
  - යාන්ත්‍රික ෆෝමන් තනතුර
  - ධාවනාගාර ෆෝමන් තනතුර
  - සංඥා හා විදුලි සංදේශ තනතුර
  - දුම්රිය රියදුරු සේවය
  - දුම්රිය නියාමක සේවය
- කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 02 සේවා ගණය
  - දුම්රිය එන්ජින් රියදුරු (ෂන්ටින්)
- කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණය
  - දුම්රිය කාර්මික කළමනාකරණ සහකාර තනතුරු
- කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 02 සේවා ගණය
  - දුම්රිය තාක්ෂණ කළමනාකරණ සහකාර තනතුරු
- ආශ්‍රිත නිලධාරී සේවා ගණය
  - ප්‍රසම්පාදන නිලධාරී
  - ගමනාගමන පිරිවැය නිලධාරී
- විධායක සේවා ගණය
  - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)
  - අධිකාරී (ප්‍රසම්පාදන)
  - සහකාර අධිකාරී (ප්‍රසම්පාදන)

මේ වන විට පහත සඳහන් තනතුරුවල බඳවා ගැනීම් පරිපාටි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතියට යොමු කර ඇත.

- ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය
  - ලේඛන සහායක
  - දුම්රිය කාර්ය සහායක
  - කාන්තා විශ්‍රාම ශාලා සේවිකා
  - නවාතැන්/බංගලා සහායක

- අනෙකුත් තනතුරුවලින් තනතුරු 02ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටි කෙටුම්පත් කර ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ හා වැටුප් කොමිෂන් සභා ලේකම්ගේ නිර්දේශ ලබා ගෙන ඇත. තවත් තනතුරු 03ක් සඳහා ජාතික වැටුප් කොමිෂන් සභා ලේකම්ගේ හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ ද නිර්දේශ ලබා ගැනීමට යොමු කර ඇත.

- බඳවා ගැනීමේ පටිපාටි අනුමත වී ඇති තනතුරු කිහිපයක් සඳහා අලුතින් බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

- දුම්රිය දෙපාර්තමේන්තුවේ අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීම් පරිපාටි සකස් කරමින් පවතී.

- දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 47 දෙනෙකුගේ ඇප මුදල් නිදහස් කිරීම් ද, ඇටෝර්නි බලය අවලංගු කිරීම් 153 ක් ද සිදු කර ඇත.

- දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව පහත සඳහන් ව්‍යාපෘති සඳහා සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතුවලට අදාළව විදේශිකයින් සඳහා පහත පරිදි වීසා බලපත්‍ර නිකුත් කර ඇත.

| Institution /Project/Other | No. of Entry Visa Issued | No. of Residence Visa Issued | No.of Extension of Residence Visa |
|---|---|---|---|
| 1. Matara – Beliatta Rail Track (6859) | 04 | 04 | 53 |
| 2. Northern Province signaling & Telecommunication (6853) | 36 | 05 | 01 |
| 3. Madu – Taleimannar Rail Track (6822) | 11 | 44 | 20 |
| 4. Dimo | 01 | 01 | 11 |
| 5. SLTB | - | - | 02 |
| 6. Chinese Engineer of After Sale Service Work (7008) | - | - | 01 |
| 7. Visa Miscellaneous | 08 | 06 | - |

## 2.5 නීති අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

**2018 වර්ෂයේ කටයුතු කරන ලද නඩු සංඛ්‍යාව - 42**

**අදාළ වන ආයතන අනුව**

| | | |
|---|---|---|
| • මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | - | 12 |
| • ජාතික ගමනාගමන කොමිෂන් සභාව | - | 04 |
| • සිවිල් ගුවන් සේවා අධිකාරිය | - | 02 |
| • ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | - | 09 |
| • ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | - | 01 |
| • ගරු අමාත්‍යතුමා වගඋත්තරකරු කරමින් පවරා ඇති නඩු | - | 14 |

**මානව හිමිකම් පැමිණිලි සංඛ්‍යාව - 04**

**අදාළ වන ආයතන අනුව**

| | | |
|---|---|---|
| • මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | - | 02 |
| • ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | - | 01 |
| • ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | - | 01 |

### පනත් හා රෙගුලාසි කෙටුම්පත් කිරීම හා සම්මත කිරීමට අදාළ කටයුතු

**1. මෝටර් වාහන පනත සංශෝධනය කිරීම**

**1.1. බරපතල වැරදි කිහිපයක් සඳහා දඩ මුදල් සංශෝධනය කිරීමට අදාළ පනත් කෙටුම්පත**

ඉහත කරුණට අදාළව මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර නීතිපතිවරයාගේ අනුකූලතා සහතිකය ද ලැබී ඇත. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීමට හා අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

- මෝටර් වාහන පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි - 05

(i) මෝටර් වාහන (ස්ථානීය දඩ) නියෝග:
අංක 2054/9 - 2018.01.15 දිනැති ගැසට් නිවේදනය

(ii) මෝටර් වාහන (කොඩ්රිසයිකල්) නියෝග:
අංක 2054/7 - 2018.01.15 දිනැති ගැසට් නිවේදනය

(iii) මෝටර් වාහන (ගාස්තු) නියෝග:
අංක 2054/6 - 2018.01.15 දිනැති ගැසට් නිවේදනය

(iv) මෝටර් වාහන (අධිවේගී මහා මාර්ග) නියෝග:
අංක 2054/8 - 2018.01.15 දිනැති ගැසට් නිවේදනය

(v) මෝටර් වාහන (පොදු සේවා) මෝටර් ට්‍රයිසිකල් නියෝග:
අංක 2081/44 - 2018.07.26 දිනැති ගැසට් නිවේදනය

- නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කර ඇති රෙගුලාසි

(i) මෝටර් වාහන (හදිසි අනතුරු වාර්තා කිරීමේ) නියෝගඃ

(ii) මෝටර් වාහන (ආරක්ෂක හිස්වැසුම්) නියෝගඃ

(iii) මෝටර් වාහන (අධිභාර) නියෝගඃ

**2. 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 26 වගන්තිය සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත**

ඉහත පනතේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම සඳහා කෙටුම්පත සකසා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමෙන් අනතුරුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් මූලික කෙටුම්පතක් සකසා එවන ලදි. එම කෙටුම්පත සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිරීක්ෂණ ද ලබාගෙන නීති කෙටුම්පත් සම්පාදක වෙත නැවත යොමු කර ඇත.

## 2.6 කැබිනට් අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

### i. පාර්ලිමේන්තු ප්‍රශ්න හා පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනා

2018 වර්ෂය තුළදී පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න 15 ක් හා පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනා 02 ක් සඳහා පිළිතුරු ලබා දී ඇති අතර පනත් හා රෙගුලාසි පිළිබඳ විවාද 05 ක් පවත්වා ඇත. මීට අමතරව ගිණුම් කාරක සභා 07 ක් සඳහා කටයුතු සම්බන්ධීකරණය කර ඇත.

### ii. මහජන පෙත්සම් කාරක සභා

2018 වර්ෂයේදී මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් 03 ක් පාර්ලිමේන්තුවේදී පැවති අතර, එහිදී සාකච්ඡාවට ලක් වූ මහජන පෙත්සම් 10 ක වැඩ කටයුතු අවසන් කරන ලදි. ඊට අමතරව 2018 වර්ෂයේදී නව මහජන පෙත්සම් 20 ක් පමණ ලැබී ඇති අතර මීට පෙර ලැබී කටයුතු අවසන් නොවී පවතින පෙත්සම්ද ඇතුළුව අදාළ සියලූ මහජන පෙත්සම් සම්බන්ධයෙන් වන වාර්තා අදාළ ආයතන වෙත යොමු කිරීම හා ඒ සම්බන්ධයෙන් වන වාර්තා කැඳවීම සම්බන්ධීකරණය කිරීම් සිදු කරන ලදී.

### iii. ආංශික අධීක්ෂණ කාරක සභා

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අමාත්‍යාංශ විෂයය පථයට අදාළව ඉදිරිපත් කරනු ලබන මහජනතාවගේ ගැටලූ හා පොදු ප්‍රශ්න සම්බන්ධයෙන් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධකර ගනිමින් පිළිතුරු ලබා දීම සිදු කරන ලදී.

### iv. අමාත්‍ය මණ්ඩල සංදේශ

2018 වර්ෂය තුළදී අමාත්‍ය මණ්ඩල සංදේශ 134 ක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කර ඇති අතර එම සංදේශයන් සම්බන්ධයෙන් ලද තීරණයන් අදාළ ආයතන/අංශයන් වෙත යොමු කිරීමේ කටයුතු සිදු කර ඇත.

| # | ආයතනය /අංශය | අමාත්‍ය මණ්ඩල සංදේශ ගණන |
|---|---|---|
| 1 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 58 |
| 2 | සිවිල් ගුවන්සේවා අධිකාරිය | 21 |
| 3 | සි/ස ගුවන් තොටුපොළ හා ගුවන්සේවා සමාගම | 18 |
| 4 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 12 |
| 5 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 12 |
| 6 | ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 07 |
| 7 | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 02 |
| 8 | අමාත්‍යාංශය | 04 |
| | **එකතුව** | **134** |

### v. අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ

2018 වර්ෂයේදී, අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 25 ක් සම්බන්ධයෙන් නිරීක්ෂණයන් ලබා දී ඇත.

## 3. 2018 වර්ෂය තුළදී සැලසුම් අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

1. දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංගම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, සිවිල් ගුවන්සේවා අධිකාරිය, සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම හා ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම යන ආයතන සමඟ සංවර්ධන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු සිදු කිරීම

2. 2018 වර්ෂය සඳහා අමාත්‍යාංශය සහ අදාළ ආයතන සමඟ ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම සඳහා පූර්ව වැඩමුළු පැවැත්වීම හා එම කටයුතු සම්බන්ධීකරණය

3. 2018 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශ කාර්යාලයේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම හා අමාත්‍යාංශය යටතේ පවතින අදාළ ආයතනවල සංයුක්ත සැලැස්ම සකස් කිරීම සම්බන්ධව දායකත්වය සැපයීම හා අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

4. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල මාසික, කාර්තුමය හා වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, වාර්තා සැකසීම හා ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම

5. 2018 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා ආයතන සම්බන්ධීකරණය සහ එම සාකච්ඡා වලට සම්බන්ධ වෙමින් ගිණුම් අංශය සමඟ කටයුතු කිරීම

6. ප්‍රවාහන අමාත්‍යාංශයට සම්බන්ධ ව්‍යාපෘති වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම, වාර්තා පිළියෙළ කිරීම හා මුදල් අමාත්‍යාංශය, ජනාධිපති කාර්යාලය හා අගමැති කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම

7. පාර්ලිමේන්තු අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති සියලූ ආයතන වලට අදාළව ප්‍රගති වාර්තා සකස් කිරීම හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

8. 2017 වසර අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම

9. 2018 දිළිදුකම පිටු දැකීම යන වැඩසටහන යටතේ ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ එක්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

10. ජනාධිපති කාර්යාලය මඟින් සම්බන්ධීකරණය කරනු ලබන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා අවශ්‍ය වාර්තා හා ඉදිරිපත් කිරීම් (presentation) සකස් කිරීම හා ඉදිරිපත් කිරීම

11. 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම / ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ගැනීම උදෙසා අමාත්‍යාංශ නිලධාරීන් හා ආයතන නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් පැවැත්වීම

12. ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා ප්‍රවාහන හා තොරතුරු තාක්ෂණය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කමිටුවේ උපදෙස් පරිදි යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම

13. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් තාක්ෂණික සහයෝගිතා පදනම යටතේ අමාත්‍යංශය වෙත ලබා දෙන විශේෂ අධ්‍යයනයන් හා අමාත්‍යංශය විසින් හඳුනා ගනු ලබන විශේෂ ව්‍යාපෘති සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම

14. ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයට අයත් නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම (අමාත්‍යංශයේ විශේෂ උත්සව, විවාත කිරීම් වැනි අවස්ථාවන් පිළිබඳ වාර්තා දැන්වීම්, ඡායාරූප, වීඩියෝපට පල කිරීම හා ප්‍රසම්පාදන, ගැසට් නිවේදන හා සේවක බඳවා ගැනීම් පිළිබඳ නිවේදන පල කිරීම.)

15. ජාතික තොරතුරු කේන්ද්‍රය (1919) සමඟ සම්බන්ධීකරණයෙන් අමාත්‍යංශය හා ඒ හා සම්බන්ධ ආයතන වල තොරතුරු ලබා දීම.

16. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය සමඟ සම්බන්ධීකරණයෙන් රාජ්‍ය ජාලය LGN - ii පහසුකම් ලබා ගැනීම.

17. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය සමඟ එක්ව ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළව පරිසර වැඩසටහන් සඳහා අමාත්‍යංශයේ දායකත්වය ලබා දීම

   - Nationally Appropriate Mitigation Action Plan on Transport Section (NAMAs)
   - ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා ජාතිකව නීර්ණය කරන ලද දායකත්වයන් (Nationally Determined Contributions ) NDCs) සකස් කිරීම
   - ප්‍රවාහන දත්ත පදනම් කර ගනිමින් මිණුම් කිරීම, වාර්තා කිරීම හා විචක්ෂණය කිරීමේ පද්ධතියක් පිහිටුවීම (Establishment of MRV System) - මෙම ව්‍යාපෘතිය යටතේ වැඩමුළු 3ක් පවත්වා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ සියලුම පාර්ශව කරුවන් දැනුවත් කොට ඇත.
   - Preparation of Fuel Quality Road Map
   - Preparation of National Adaptation Plan
   - Contribution to the Clean Air 2025 Programme
   - වායු දූෂක හා කාබන්ඩයොක්සයිඩ් අඩු කිරීම සඳහා පාරිසරික රියදුරු පුහුණු පාඨමාලා වැඩසටහන් 4ක් කුරුණෑගල, පොතුහැර, නාරාහේන්පිට යන ස්ථාන වල පැවැත්වීම

18. අනෙකුත් රේඛීය අමාත්‍යංශ හා විවිධ ආයතන විසින් මෙහෙයවනු ලබන සංවර්ධන කටයුතු වලදී අදාළ රැස්වීම් හා වැඩමුළු සඳහා සහභාගී වෙමින් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

19. ජනාධිපති කාර්යාලය මඟින් යොමු කරනු ලබන මහජන දුක් ගැනවිලි අවශ්‍ය ආයතන වලට යොමු කිරීම හා ඒවාට පිළිතුරු ලබා දීම.

20. මාතර කතරගම දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති කාර්යාල හා සම්බන්ධීකරණය සිදුකරමින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කිරීම

21. ලංකාණ්ඩුව විසින් අනුග්‍රහය දක්වනු ලබන ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
   - SAARC/UNESCAP/BIMSTEC/ACD/SASEC වැනි ජාත්‍යන්තර සමුළුවලට අදාළව ප්‍රවාහන ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ නියෝජනයට අදාළ කාර්යයන් සිදුකිරීම

22. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලට සහභාගිවීම හා තීරණ ක්‍රියාත්මක කිරීමේ පසු විපරම් කටයුතු සිදු කිරීම

23. සැලසුම් අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අනෙකුත් රේඛීය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ කෙටුම්පත් කිරීම

24. අමාත්‍යාංශයට අයත් ආයතන වල දත්ත ලබා ගැනීම, එම තොරතුරු මඟින් අමාත්‍යාංශ වෙබ් අඩවියේ සංඛ්‍යා ලේඛන මෙනුව යාවත්කාලීන කිරීම හා සංඛ්‍යා ලේඛන ඇතුළත් කුඩා වාර්තාවක් සකස් කිරීම

25. මෙම අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳ වාර්තා, ඉල්ලීම් මත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත යොමු කිරීම

26. මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා මෙම අමාත්‍යාංශයේ හා එයට අයත් ආයතන වල නිලධාරීන්ගේ දායකත්වය ලබාදීම

27. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව සඳහා අමාත්‍යාංශය නියෝජනය කිරීම

28. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ පාර්ශවකාර ආයතනයන්ගේ සම්බන්ධීකරණ ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා අමාත්‍යාංශය නියෝජනය කිරීම

29. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ 2018 අගෝස්තු මස 30, 31 හා සැප්තැම්බර් මස 01 දින වල පැවති V 2025 එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා අමාත්‍යාංශය හා එයට අයත් ආයතන වල සක්‍රීය දායකත්වයෙන් ආකර්ශනීය ප්‍රදර්ශන කුටි ඉදිකරමින් ජනතාව දැනුවත් කිරීම

30. කොළඹ කොටුව සිට බත්තරමුල්ල දක්වා බස් ප්‍රමුඛත්ව මං තීරුවක් (Bus Priority Lane) සකස් කිරීමට අදාළව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, කොළඹ මහ නගර සභාව, ශ්‍රී ලංකා පොලීසිය හා මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම, කමිටු හා රැස්වීම් වලට සහභාගී වීම

31. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ කටයුතු සඳහා ප්‍රධාන නවෝත්පාදන නිලධාරි (Chief Innovation Officer) වශයෙන් අමාත්‍යාංශය නියෝජනය කරමින් කමිටු රැස්වීම් වලට සහභාගි වීම.

32. අයවැය කතාව මත පදනම්ව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම .

33. ගරු අමාත්‍යතුමා හා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සහභාගි වන වැඩසටහන් සඳහා ඉදිරිපත් කිරීම් හා දේශන සැකසීම.

34. වෙරළ සංරක්ෂණය හා සංචාරක කර්මාන්තයට අදාළ ගැටලු නිරාකරණය කිරීම සඳහා පිහිටුවන ලද පාර්ලිමේන්තු අනුකාරක සභාවට දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළ කරුණු සාකච්ඡාවට ලක් කිරීමේ රැස්වීම් නියෝජනය කිරීම.

35. අනතුරු හා මාර්ග තදබදය වලක්වා ගැනීම සඳහා CCTV Operation System හඳුන්වා දීමේ ICTA වැඩසටහන යටතේ පවත්වන ලද පාර්ලිමේන්තුවේ සභා රැස්වීම් නියෝජනය කිරීම.

36. නාවික හමුදාව, යුධ හමුදාව හා පොලීසියට ලබා දෙන නිදහස් ගමන් බලපත්‍ර ගාස්තු අයවීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සාකච්ඡා කර විසඳුම් ලබා දීම.

37. Millennium Challenge Cooperation ආයතනය සහ අග්‍රාමාත්‍ය කාර්යාලය සමඟ එක්වී බස් ක්ෂේත්‍රය නවීකරණය කිරීමේ වැඩසටහන (Bus Sector modernization) සඳහා දායකත්වය ලබා දීම.

38. අමාත්‍යංශය විසින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන විවිධ කමිටු සඳහා දායකත්වය ලබා දීම.
   - කාර්යාල මගී ප්‍රවාහන බස් රථ නියාමනය කිරීමේ කමිටුව
   - පාසල් වෑන් රථ හා ත්‍රීරෝද රථ නියාමනය කිරීම සඳහා වන කමිටුව

39. ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම

40. ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම හා ඒ මඟින් අමාත්‍යංශ නිලධාරීන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම

41. අමාත්‍යංශ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරිමේ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

## 4. මූල්‍ය කළමනාකරණය හා ප්‍රගතිය

### 4.1 ප්‍රසම්පාදන කමිටු

| අනු අංකය | ප්‍රසම්පාදන කමිටුවේ නම | ක්‍රියාත්මක වූ ප්‍රසම්පාදන සංඛ්‍යාව | අවසන් වූ ප්‍රසම්පාදන සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | අමාත්‍ය මණ්ඩල විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු | 51 | 12 |
| 02 | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු | 56 | 30 |

### 4.2 ගිණුම් වාර්තා සකස් කිරීම සහ කාර්යක්ෂමතාව

| අනු අංකය | කාර්යයන් | ගත් ක්‍රියා මාර්ගය |
|---|---|---|
| 01 | 2018 වර්ෂයේ ගිණුම් වාර්තා සකස් කිරීම සහ භාණ්ඩාගාරය සමඟ සැසඳීම | සියලුම වාර්තා සකස් කර භාණ්ඩාගාර පොත් සමඟ සසඳා ඇත. |
| 02 | කාර්යක්ෂමතාවය වැඩි කිරීමට කළ කාර්යයන් | නිලධාරීන් කාර්යක්ෂමතාවයෙන් යුතුව රාජකාරි කටයුතු කරන අතර, පුහුණුවීම් අවශ්‍ය වන නිලධාරීන් ඒ සඳහා යොමුකරනු ලබයි. |

## EXPENDITURE REPORT As At 31.12.2018

Head - 114 - Ministry of Transport & Civil Aviation
Programme - 01 - Operattional Activities
Project - 01 - Minister's office

| Sub Project | Object Code | Category/ Object Title | Total Net Provision | Total Actual Expenditure end of Desember | % Expenditure |
|---|---|---|---|---|---|
| 0 | | **Recurrent Expenditure** | **49,600,000.00** | **43,131,140.72** | **86.96** |
| | | **Personal Emuluments** | **24,100,000.00** | **20,677,451.65** | **85.80** |
| | 1001 | Salaries & Wages | 13,800,000.00 | 11,732,478.51 | **85.02** |
| | 1002 | Overtime and Holiday payments | 5,500,000.00 | 4,952,423.67 | **90.04** |
| | 1003 | Other Allowances | 4,800,000.00 | 3,992,549.47 | **83.18** |
| | | **Travelling Expences** | **3,300,000.00** | **2,425,553.85** | **73.50** |

| Sub Project | Object Code | Category/ Object Title | Total Net Provision | Total Actual Expenditure end of Desember | % Expenditure |
|---|---|---|---|---|---|
| | 1101 | Domestic | 2,300,000.00 | 2,300,000.00 | **100.00** |
| | 1102 | Foreign | 1,000,000.00 | 125,553.85 | **12.56** |
| | | **Suppliers** | **9,900,000.00** | **8,267,890.43** | **83.51** |
| | 1201 | Staionery & Office Requisites | 800,000.00 | 800,000.00 | **100.00** |
| | 1202 | Fuel | 9,000,000.00 | 7,404,249.43 | **82.27** |
| | 1203 | Diets & Uniform | 100,000.00 | 63,641.00 | **63.64** |
| | | **Maintanance Expenditure** | **8,600,000.00** | **8,283,204.57** | **96.32** |
| | 1301 | Vehicles | 8,000,000.00 | 7,995,972.56 | **99.95** |
| | 1302 | Plant Machinery & Equipment | 500,000.00 | 236,367.01 | **47.27** |
| | 1303 | Building & Structures | 100,000.00 | 50,865.00 | **50.87** |
| | | **Services** | **3,700,000.00** | **3,477,040.22** | **93.97** |
| | 1401 | Transport | 500,000.00 | 500,000.00 | **100.00** |
| | 1402 | Postal & Communication | 2,200,000.00 | 2,082,417.22 | **94.66** |
| | 1409 | Other | 1,000,000.00 | 894,623.00 | **89.46** |
| | | **Capital Expenditure** | **5,000,000.00** | **2,976,209.30** | **59.52** |
| | | **Rehabilitation and Improvement of Capital Assets** | **3,000,000.00** | **1,002,404.30** | **33.41** |
| | 2001 | Building & Structures | 500,000.00 | 0.00 | **0.00** |
| | 2002 | Plant Machinery & Equipment | 200,000.00 | 0.00 | **0.00** |
| | 2003 | Vehicles | 2,300,000.00 | 1,002,404.30 | **43.58** |
| | | **Acuisition of Capital Assets** | **2,000,000.00** | **1,973,805.00** | **98.69** |
| | 2102 | Funiture & office Equipment | 1,000,000.00 | 999,130.00 | **99.91** |
| | 2103 | Plant Machinery & Equipment | 1,000,000.00 | 974,675.00 | **97.47** |
| | | **Project Total** | **54,600,000.00** | **46,107,350.02** | **84.45** |

# EXPENDITURE REPORT As At 31.12.2018

Head - 114 - Ministry of Transport & Civil Aviation
Programme - 01 - Operattional Activities
Project - 2 - Administration & Establishment Services

| Sub Project | Object Code | Category/ Object Title | Total Net Provision | Total Actual Expenditure end of Desember | % Expenditure |
|---|---|---|---|---|---|
| 0 | | **Recurrent Expenditure** | **243,600,000.00** | **228,650,548.61** | **93.86** |
| | | **Personal Emuluments** | **112,900,000.00** | **108,305,996.04** | **95.93** |
| | 1001 | Salaries & Wages | 72,500,000.00 | 71,902,376.05 | 99.18 |
| | 1002 | Overtime and Holiday payments | 4,400,000.00 | 4,317,747.98 | 98.13 |
| | 1003 | Other Allowances | 36,000,000.00 | 32,085,872.01 | 89.13 |
| | | **Travelling Expences** | **9,700,000.00** | **9,314,654.41** | **96.03** |
| | 1101 | Domestic | 1,400,000.00 | 1,073,483.29 | 76.68 |
| | 1102 | Foreign | 8,300,000.00 | 8,241,171.12 | 99.29 |
| | | **Suppliers** | **13,100,000.00** | **12,010,052.20** | **91.68** |
| | 1201 | Staionery & Office Requisites | 4,900,000.00 | 4,332,133.70 | 88.41 |
| | 1202 | Fuel | 8,000,000.00 | 7,479,295.50 | 93.49 |
| | 1203 | Diets & Uniform | 200,000.00 | 198,623.00 | 99.31 |
| | | Maintanance Expenditure | 15,300,000.00 | 14,752,318.87 | 96.42 |
| | 1301 | Vehicles | 12,000,000.00 | 11,889,295.07 | 99.08 |
| | 1302 | Plant Machinery & Equipment | 3,000,000.00 | 2,703,753.80 | 90.13 |
| | 1303 | Building & Structures | 300,000.00 | 159,270.00 | 53.09 |
| | | **Services** | **90,800,000.00** | **82,649,416.83** | **91.02** |
| | 1401 | Transport | 7,100,000.00 | 6,973,719.49 | 98.22 |
| | 1402 | Postal & Communication | 3,500,000.00 | 3,442,653.79 | 98.36 |
| | 1403 | Electricity & Water | 10,000,000.00 | 8,558,775.27 | 85.59 |
| | 1404 | Rents and Local Taxes | 63,000,000.00 | 57,863,849.22 | 91.85 |

| Sub Project | Object Code | Category/ Object Title | Total Net Provision | Total Actual Expenditure end of Desember | % Expenditure |
|---|---|---|---|---|---|
| | 1409 | Other | 7,200,000.00 | 5,810,419.06 | 80.70 |
| | | **Transfers** | **1,800,000.00** | **1,618,110.26** | **89.90** |
| | 1506 | Property Loan Interest to Public Servents | 1,800,000.00 | 1,618,110.26 | 89.90 |
| | | **Capital Expenditure** | **11,300,000.00** | **6,037,987.40** | **53.43** |
| | | **Rehabilitation and Improvement of Capital Assets** | **5,300,000.00** | **1,210,890.48** | **22.85** |
| | 2001 | Building & Structures | 1,000,000.00 | 311,400.00 | 31.14 |
| | 2002 | Plant Machinery & Equipment | 300,000.00 | 0.00 | 0.00 |
| | 2003 | Vehicles | 4,000,000.00 | 899,490.48 | 22.49 |
| | | **Acquisition of Capital Assets** | **4,800,000.00** | **3,710,596.92** | **77.30** |
| | 2102 | Furniture & office Equipment | 4,000,000.00 | 3,670,046.92 | 91.75 |
| | 2103 | Plant Machinery & Equipment | 800,000.00 | 40,550.00 | 5.07 |
| | | **Capacity Building** | **1,200,000.00** | **1,116,500.00** | **93.04** |
| | 2401 | Staff Training | 1,200,000.00 | 1,116,500.00 | 93.04 |
| | | **Other Capital Expenditure** | | **0.00** | |
| | | **Project Total** | **254,900,000.00** | **234,688,536.01** | **92.07** |

# EXPENDITURE REPORT As At 31.12.2018

Head - 114 - Ministry of Transport & Civil Aviation
Programme - 02 - Development Activities
Project - 3 - Development of Road Transport

| Sub Project | Object Code | Category/Object Title | Total Net Provision | Total Actual Expenditure end of Desember | % Expenditure |
|---|---|---|---|---|---|
| | | **Recurrent Expenditure** | **12,049,687,000.00** | **11,627,440,175.50** | **96.50** |
| **1** | | **Sri Lanka Transport Board** | **11,493,000,000.00** | **11,223,440,175.50** | **97.65** |
| | 1503 | **Public Institution** | **11,004,000,000.00** | **11,004,000,000.00** | **100.00** |
| | | School & Higher Edication Season Ticket Subsidy | 5,000,000,000.00 | 5,000,000,000.00 | 100.00 |
| | | Grants to SLTB - Operating on Unremunerative Routes | 5,004,000,000.00 | 5,004,000,000.00 | 100.00 |
| | | Financial Assistance to SLTB | 1,000,000,000.00 | 1,000,000,000.00 | 100.00 |
| | **1504** | **Development Subsidies** | **489,000,000.00** | **219,440,175.50** | **44.88** |
| | | Armed Forces - Bus Passes | 489,000,000.00 | 219,440,175.50 | 44.88 |
| **2** | | **National Transport Commission** | **535,787,000.00** | **400,000,000.00** | **74.66** |
| | 1503 | Public Institution | | | |
| | | Contribution of Socially obligatory obligatory Bus Services | 535,787,000.00 | 400,000,000.00 | 74.66 |
| **3** | | **Lakdiva Engineering Company (Pvt.) Ltd.** | **20,900,000.00** | **4,000,000.00** | **19.14** |
| | 1503 | Public Institution | 20,900,000.00 | 4,000,000.00 | 19.14 |
| | | **Capital Expenditure** | **2,396,213,000.00** | **2,395,762,999.78** | **99.98** |

| Sub Project | Object Code | Category/Object Title | Total Net Provision | Total Actual Expenditure end of Desember | % Expenditure |
|---|---|---|---|---|---|
| **1** | | **Sri Lanka Transport Board** | **2,396,213,000.00** | **2,395,762,999.78** | **99.98** |
| | 2201 | **Public Institution** | | | |
| | | Purchase of New Buses/Engine kits | 1,000,000,000.00 | 999,991,988.00 | 100.00 |
| | | Bus Fleet Augmentation, Institutional Development and Capacity Building | 1,350,000,000.00 | 1,349,558,142.98 | 99.97 |
| | | Purchase of New Buses/Engine kits | 46,213,000.00 | 46,212,868.80 | |
| | | **Project Total** | **14,445,900,000.00** | **14,023,203,175.28** | **97.07** |

## EXPENDITURE REPORT As At 31.12.2018

Head - 114 - Ministry of Transport & Civil Aviation
Programme - 02 - Development Activities
Project - 4 - Development of New Railroad

| Sub Project | Object Code | Category/Object Title | Total Net Provision | Total Actual Expenditure end of Desember | % Expenditure |
|---|---|---|---|---|---|
| | | **Capital Expenditure** | **7,260,000,000.00** | **4,940,894,455.99** | **68.06** |
| 1 | | **Matara - Beliatta-Kataragama New Railline** | **5,550,000,000.00** | **3,933,575,907.68** | **70.88** |
| | 2104 | Building & Structures | 5,500,000,000.00 | 3,920,141,141.69 | 71.28 |
| | | | 5,000,000,000.00 | 3,731,176,730.09 | 74.62 |
| | | | 500,000,000.00 | 188,964,411.60 | 37.79 |
| | 2105 | Lands and Land Improvements | 50,000,000.00 | 13,434,765.99 | 26.87 |
| | | Lands Acquisition & Payment of Compensation | 50,000,000.00 | 13,434,765.99 | 26.87 |

| Sub Project | Object Code | Category/Object Title | Total Net Provision | Total Actual Expenditure end of Desember | % Expenditure |
|---|---|---|---|---|---|
| | | Signaling & Telecommunication System | 0.00 | | |
| 5 | | **Kurunegala - Habarana Rail track project** | **80,000,000.00** | **56,074,796.47** | **70.09** |
| | 2105 | Lands and Land Improvements | 80,000,000.00 | 56,074,796.47 | 70.09 |
| 10 | | **Transport Project Preparatory Facility(GOSL/ ADB)** | **1,300,000,000.00** | **944,881,021.40** | **72.68** |
| | 2105 | Lands and Land Improvements | | 0.00 | |
| | | | 450,000,000.00 | 251,432,021.40 | 55.87 |
| | | | 850,000,000.00 | 693,449,000.00 | 81.58 |
| **11** | | **Colombo SuburbanRailway Project(GOSL/ ADB)** | **300,000,000.00** | **0.00** | **0.00** |
| | 2104 | Lands and Land Improvements | | 0.00 | |
| | | | 300,000,000.00 | 0.00 | 0.00 |
| **12** | | **Implimentation of Global Positioning Systerm based TOIS in Srilanka Railways** | **30,000,000.00** | **6,362,730.44** | **21.21** |
| | 2103 | Plant Machinery & Equipment | 30,000,000.00 | 6,362,730.44 | 21.21 |
| | | **Project Total** | **7,260,000,000.00** | **4,940,894,455.99** | **68.06** |

# EXPENDITURE REPORT As At 31.12.2018

Head - 114 - Ministry of Transport & Civil Aviation
Programme - 02 - Development Activities
Project - 5 - Development of Aviation

| Sub Project | Object Code | Category/Object Title | Total Net Provision | Total Actual Expenditure end of Desember | % Expenditure |
|---|---|---|---|---|---|
| **10** | | **Bandaranayaka International Airport Development Project -(Phase II)** | **200,000,000.00** | **0.00** | **0.00** |
| | 2104 | Building & Structures | 200,000,000.00 | 0.00 | 0.00 |
| | | **Project Total** | **200,000,000.00** | **0.00** | **0.00** |
| | | **HEAD RECCURENT TOTAL** | **12,342,887,000.00** | **11,899,221,864.83** | **96.41** |
| | | **HEAD CAPITAL TOTAL** | **9,872,513,000.00** | **7,345,671,652.47** | **74.41** |
| | | **HEAD TOTAL** | **22,215,400,000.00** | **19,244,893,517.30** | **86.63** |

## 5. 2018 වර්ෂය තුළදී ගුවන්සේවා අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

1. ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා එයට අදාළ සියලු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව (අන්තර්ජාතික පිළිගැනීම සඳහා) ඉටු කිරීමේ දී අවශ්‍ය නීති රෙගුලාසි සැකසීම, යාවත්කාලීන කිරීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දායකත්වය ලබා දීම

2. මෙම වසරේ දී අන්තර්ජාතිකව වාසි සහගත ගුවන් ගමනාන්ත මෙන්ම වාසි සහගත ගුවන් ගමන්වාර වැඩි කර ගැනීම සඳහා ඒ ඒ රටවල් සමඟ ද්විපාර්ශවික ගුවන්සේවා සාකච්ඡා පැවැත්වීම හා ගිවිසුම් සඳහා එළඹීම

### ගිවිසුම් යාවත්කාලීන කල රටවල්

- තායිලන්තය, හෙලනික් රාජධානිය (ග්‍රීසිය), ඉතාලිය, ලක්සම්බර්ග් - අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.
- ඇෆ්ගනිස්ථානය, කටාර් රාජධානිය, සිම්බාබ්වේ, ඊශ්‍රායලය - අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

3. 2018 දෙසැම්බර් මසදී කෙන්යාවේ නයිරෝබි නුවර පැවති ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සාකච්ඡා සමුළුවේදී (ICAN) ගයනා රාජ්‍ය සහ පෘතුගාලය සමඟ ද්විපාර්ශ්වික ගුවන්සේවා සාකච්ඡා පවත්වා නව ගිවිසුම් සඳහා එළඹීම.

4. කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ධාවන පථය නැවත ආස්තරණය හා ඒ ආශ්‍රිත කටයුතු 2018 මැයි මස දී නිම කිරීම.

   <u>බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ 02 වන මගී පර්යන්තය ඉදිකිරීම (A පැකේජය)</u> - මේ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව (CAPC) නිර්දේශයන් අනුව ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නොලැබීම නිසා ටෙන්ඩරය අවලංගු කරන ලදි.

   <u>බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ දුරස්ථ ගුවන්යානා නැවතුම් පථය සහ ටැක්සි ධාවන පථය ඉදිකිරීම (B පැකේජය)</u>
   2018 දෙසැම්බර් මස අවසානය වන විට 17% ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

5. සිවිල් ගුවන්සේවා අධිකාරිය, කටුනායක - නයිකන්ද පිහිටි නව පරිපාලන ගොඩනැගිල්ලක 2018 ජනවාරි මස 16 වන දින ස්ථාපිත කරන ලදි.

6. මඩකලපුව අභ්‍යන්තර ගුවන් තොටුපොළ සාමාන්‍ය ගුවන්සේවා සඳහා 2018 මාර්තු මස 25 වන දින නැවත වරක් විවෘත කරන ලදි.

7. රත්මලාන ගුවන්තොටුපොළෙහි පරිපාලන ගොඩනැගිල්ල සමඟ කුළුණ ඉදිකිරීමටත්, ධාවන පථය තව දුරටත් පුළුල් කර ධාවන පථයෙහි දකුණු දිශාවේ ඇති ශ්‍රී ලංකා ගුවන් හමුදා පහසුකම් උතුරු දිශාව වෙත ගෙනයාම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.650,000,000.00ක් වන අතර, ඒ අනුව එම කාර්යයන් සඳහා රත්මලාන ගුවන්තොටුපොළ "ප්‍රධාන සැලස්මට 2018 පෙබරවාරි 21 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි. මේ කාර්යය සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සිදුකරන අතර අප අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දීම සිදුකරනු ලබයි.

8. පලාලි ගුවන්තොටුපොළ සංවර්ධනය කිරීම (ප්‍රාදේශීය හා වාණිජ ගුවන් ගමන් මෙහෙය වීම) සඳහා 2018.08.17 දින නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදි. මෙහි මූලික සැලැස්ම අනුව ධාවන පථය ඉදිකිරීම සඳහා අනුමත ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 1,950 කි.

9. දිගන, මාබේරියතැන්න නව අභ්‍යන්තර ගුවන්තොටුපොළ ඉදිකිරීමට අදාළ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමට 2018.08.15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර මෙම තීරණය ඉදිරි කටයුතු සඳහා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත යොමු කර ඇත.

10. බණ්ඩාරවෙල අභ්‍යන්තර ගුවන්තොටුපොළක් ඉදිකිරීමට අදාළව පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත බාර දී ඇත.

11. හිඟුරක්ගොඩ අභ්‍යන්තර ගුවන්තොටුපොළ සිවිල් ගුවන් මෙහෙයුම් කටයුතු සඳහා සංවර්ධනය කිරීම ආරක්ෂක අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සිදුකෙරෙන අතර මේ සඳහා අවශ්‍ය ඇස්තමේන්තුව සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.

12. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි විද්‍යුත් ද්වාර (e - Gate System) පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2018.09.18 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එය, ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇත.

13. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීම, ඉන්දියානු ගුවන්තොටුපොළ අධිකාරිය සමග එක්ව සිදුකිරීම පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම සඳහා සාකච්ඡා සම්මුති කමිටුවක් (CANC) හා ව්‍යාපෘති කමිටුවක් (PC) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර ඇති අතර අදාළ ව්‍යාපෘති කමිටු වාර්තා ඉදිරිපත් කර ඇත.

14. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ආරක්ෂක කටයුතු සඳහා Sniffer වර්ගයේ සුනඛ පැටවුන් ලබා ගැනීම සඳහා, අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

15. ගුවන්තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සේවයේ නියුතු ගුවන් ගමන් පාලකවරුන් පුහුණු කිරීම සඳහා රත්මලානෙහි පිහිටි සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය ප්‍රතිස්ථාපනය කරන ලද අතර මේ සඳහා වැයවූ මුදල රු. මි. 309 කි.

16. පනත් සහ රෙගුලාසි

    1. ගුවන් ප්‍රවාහන පනත - 2018.09.18 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත වූ අතර එය ජාත්‍යන්තරව බලාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය වෙත යොමු කර ඇත.
    2. කේප් ටවුන් සම්මුතිය - නීති සම්පාදන කටයුතු සිදු කරමින් පවතී.
    3. බීජිං සම්මුතිය - නීති සම්පාදන කටයුතු කෙටුම්පත් සිදු කරමින් පවතී.
    4. ගගන යාත්‍රාංගන වර්ගීකරණ රෙගුලාසි - අතිවිශේෂ ගැසට් පත්‍රය 2018.09.06 දිනැතිව නිකුත් කර ඇත.
    5. ජලජ ගගන යාත්‍රාංගන රෙගුලාසි - නීති සම්පාදන කටයුතු කෙටුම්පත් සිදු කරමින් පවතී.

6. සිවිල් ගුවන්සේවා ආරක්ෂණ රෙගුලාසි - නීති කෙටුම්පත් සම්පාදක වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.
7. ගුවන්යානා ජාතිකත්වය සහ ලියාපදිංචි ලකුණු රෙගුලාසි - නීති කෙටුම්පත් සම්පාදක වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.
8. ගුවන්යානා අනතුරු විමර්ශන කාර්යාංශය පනත් කෙටුම්පත සඳහා වූ නීති සම්පාදන කටයුතු සිදු කරමින් පවතී.

17. සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තිය සකස්කර අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

18. ජාතික ගුවන් ප්‍රවාහන පහසුකම් සැලසීමේ කොමිසමක් සහ ජාතික ගුවන් ප්‍රවාහන පහසුකම් සැලසීමේ වැඩසටහනක් පිහිටුවීමට අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

19. ගුවන්සේවා නිරුපද්‍රිතතා සහ ආරක්ෂාව සම්බන්ධිත රාජ්‍ය වගකීම් සහ කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා වයස අවුරුදු 60 ඉක්මවූ පුද්ගලයන් තාක්ෂණික තනතුරුවල සේවයේ යෙදවීමට අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

20. ගෝලීය ආරක්ෂාව පිළිබඳ විගණන වැඩසටහන සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම - අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USAP-CMA) අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත.

## 6. 2018 වර්ෂයේ දී අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකරන ලද විමර්ශන රාජකාරි පිළිබඳ විස්තර සාරාංශය

| | ආයතනය | සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ප්‍රවාහන අමාත්‍යාංශය | 09 |
| 2. | දුම්රිය දෙපාර්තමේන්තුව | 06 |
| 3. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 01 |
| 4. | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 07 |
| 5. | ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 03 |
| 6. | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 03 |
| 7. | ලක්දිව ඉංජිනියරින් පුද්ගලික සමාගම | 03 |
| 8. | ලක්දිව ඉංජිනියරින් පුද්ගලික සමාගමේ පාරිතෝෂිත පරීක්ෂාව | ලිපිගොනු 110 |
| 9. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව | 04 |
| 10. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පූර්ව සූදානම් රැස්වීම් | 03 |
| 11. | රාජ්‍ය ගිණුම් කාරක සභාව සඳහා පූර්ව සූදානම් රැස්වීම් | |
| | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 03 |
| | දුම්රිය දෙපාර්තමේන්තුව | 01 |
| 12. | විගණන කළමනාකරණ කමිටු රැස්වීම් | |
| | ප්‍රවාහන අමාත්‍යාංශය | 03 |
| | දුම්රිය දෙපාර්තමේන්තුව | 02 |
| | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 02 |
| | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 01 |
| | ලක්දිව ඉංජිනියරින් පුද්ගලික සමාගම | 03 |
| | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව | 03 |
| | ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 02 |
| | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 01 |
| | ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය | 01 |
| | ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම | 01 |
| 13. | විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශය මඟින් යොමු කර තිබූ විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීම සඳහා පැවැත්වූ සාකච්ඡා (දුම්රිය දෙපාර්තමේන්තුව) | 1 |
| 14. | සේවා වනිතා සංගමයේ වාර්ෂික ගිණුම් පරීක්ෂාව | 1 |
| 15. | සුභ සාධක සංගමයේ වාර්ෂික ගිණුම් පරීක්ෂාව | 1 |

## 7. නව දුම්රිය මාර්ග සංවර්ධන අංශය

පොදු ජනතාවට කාර්යක්ෂම හා ලාභදායි ප්‍රවාහන සේවාවක් ලබා දීම පිණිස තිරසාර ප්‍රතිපත්තියක් වන ප්‍රවාහන ක්ෂේත්‍රය ගොඩනැගීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින් හා පොදු ප්‍රවාහන සේවාවන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් වැඩි වශයෙන් මහා මාර්ග පද්ධතිය හරහා සිදුකෙරෙන මගී හා භාණ්ඩ ප්‍රවාහනය, දුම්රිය සේවාව වෙත ආකර්ෂණය කරවීමේ අපේක්ෂාව ඇතිව, පවත්නා දුම්රිය මාර්ග පද්ධතිය වැඩි දියුණු කරන අතරම නව දුම්රිය මාර්ග සංවර්ධනය කිරීමට රජය සැලසුම් කර ඇත.

ඒ අනුව නව දුම්රිය ව්‍යාපෘති පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| # | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත වියදම (ඇ.ඩො.මි.) | ව්‍යාපාති කාලය |
|---|---|---|---|
| 01 | මාතර - බෙලිඅත්ත නව දුම්රිය මාර්ගය (කි.මී. 27) | 278.02 | 2013 - 2019 |
| 02 | කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය (කි.මී.84 ) | 943 | අවු. 4යි |
| 03 | කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක)<br>i. කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතා - වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 160 | 2018 සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි |
| | ii. දුම්රිය ප්‍රධාන සැලසුම (Master Plan) සැකසීම (දුම්රිය පද්ධතිය සහ ඉදිරි සංවර්ධනයන් සැලකිල්ලට ගනිමින්) | 1.0 | 2018 අප්‍රේල් සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි |
| | iii. මහනුවර තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය | 9.00 | 2019 මාර්තු සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට නියමිතයි |
| | iv. කැළණි වැලි මාර්ග දුම්රිය සංවර්ධන ව්‍යාපෘතිය කොළඹ - පාදුක්ක සහ පාදුක්ක අවිස්සාවේල්ල කි.මී.64, | 1,400.00 | |
| | v. ප්‍රධාන මාර්ගය, මුහුදුබඩ මාර්ගය, මීගමුව මාර්ගය (මාර්ග 3ක) සංවර්ධනය කොළඹ - රඹුක්කන, කොළඹ - කළුතර සහ රාගම - මීගමුව කි.මී.135ක කොට්ඨාශය | 1,100.00 | 2019 ජනවාරි සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි |

### 7.1 මාතර - කතරගම නව දුම්රිය මාර්ගය

පහත දැක්වෙන පරිදි අදියර තුනක් යටතේ ඉදිකිරීමේ කටයුතු නිම කිරීමට යෝජිත මෙම මාර්ගයේ සම්පූර්ණ දිග කි.මී.115 කි.

| අදියර | දුර ප්‍රමාණය කි.මී. |
|---|---|
| I. මාතර සිට බෙලිඅත්ත දක්වා | 27 (දැනට 95.1% ක වැඩ අවසන් කොට ඇත.) |
| II. බෙලිඅත්ත සිට හම්බන්තොට දක්වා | 48 (ඉදිකිරීම, ධාවනය, ආපසු භාරදීම පදනම මත ඉදිකිරීම් කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත.) |
| III. හම්බන්තොට සිට කතරගම දක්වා | 40 (මේ දක්වා තීරණයක් ගෙන නැත) |

### 7.1.1 දුම්රිය මාර්ගය ඉදිකිරීම මඟින් ලැබෙන සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ

- මාතර කතරගම නව දුම්රිය මාර්ගය ඉදිකිරීම මඟින් දිවයිනේ දුම්රිය ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වන වර්ධනය තුළින් කොළඹ, ගාල්ල, මාතර වැනි නාගරික ප්‍රදේශ සමඟ ඉක්මනින් සම්බන්ධ වීමේ හැකියාව, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාවට සහන ලැබීම හා එමඟින් එම ප්‍රදේශවල කඩිනම් ආර්ථික වර්ධනයක් ලඟා කරවීම.

- පැයට සැතපුම් 120 වේගයකින් යුත් අධිවේගී දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට අපේක්ෂිත හෙයින් මෙමඟින් නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර ඍජු හා ඉක්මන් සම්බන්ධතාවයක් ඇතිවීම.

- කෘෂිකාර්මික ප්‍රදේශයන් වන හම්බන්තොට, මොණරාගල වැනි දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි මෙම දුම්රිය මාර්ගය එම ප්‍රදේශයන්හි කෘෂි, ධීවර හා කිරි නිෂ්පාදන ඉතා පහසුවෙන් කොළඹ, ගාල්ල, මාතර වැනි නාගරික ප්‍රදේශවලට ප්‍රවාහනය කිරීමේ හා නාගරික ප්‍රදේශවල සිට මාතර, හම්බන්තොට, මොණරාගල ප්‍රදේශවලට පහසුවෙන් යන්ත්‍ර සූත්‍ර, පොහොර හා ඛණිජ තෙල් ප්‍රවාහනය කිරීමේ මාධ්‍යයක් වීම.

- අනෙකුත් ප්‍රවාහන මාධ්‍යයන් හා සැසඳීමේදී, දුම්රිය මඟින් ඉන්ධන පිරිමැස්ම සහිත පරිසර හිතකාමී මෙන්ම ඉතාමත් අඩු පිරිවැයක් යටතේ ප්‍රවාහන සේවයක් ජනතාවට ලබාදීමට හැකිවේ. එමඟින් පාරිභෝගික භාණ්ඩවල මිල වැඩිවීම නිසා ඇතිවන ගැටලුවලට පිළියමක් යෙදිය හැකිවීම.

- හම්බන්තොට වරාය, මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, හම්බන්තොට තෙල් පිරි පහදු මධ්‍යස්ථානය, ජාත්‍යන්තර කන්ටේනර් බහාලුම් මධ්‍යස්ථානය, මිරිජ්ජවිල කර්මාන්ත නගරය සහ හම්බන්තොට පරිපාලන සංකීර්ණයට දුම්රිය ප්‍රවාහන පහසුකම් සැපයීම තුළින් ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ කේන්ද්‍රීය ප්‍රවාහන ජාලය බවට දුම්රිය ප්‍රවාහනය පත්වීම.

- පූජනීය ස්ථාන, වනෝද්‍යාන, සංචාරක ස්ථාන විශාල ප්‍රමාණයක් ස්ථාපිත වී ඇති මෙම ප්‍රදේශ කරා දෙස් විදෙස් සංචාරකයින්ට දුම්රිය ප්‍රවාහන පහසුකම් මඟින් ඉක්මනින් ළගාවීමට හැකිවීම නිසා ප්‍රදේශවල කර්මාන්ත නංවාලීමට හැකිවීම.

### 7.1.2 ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය

පළමු අදියර ලෙස මාතර සිට බෙලිඅත්ත දක්වා කොටස ඉදිකිරිම සඳහා චීන සමාගමක් සමඟ ගිවිසුම අත්සන් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය මුදල් චීන එක්සීම් බැංකුවෙන් වරණීය ණය ක්‍රමයක් යටතේ ලබා ගෙන ඒ අනුව ඉදිකිරිම් කටයුතු සිදු කරයි. පළමු අදියරට (මාතර සිට බෙලිඅත්ත දක්වා) අදාළ ඉඩම් සියල්ල පවරාගෙන ඇති අතර වන්දි ගෙවීමේ කටයුතු ද අවසන් කර ඇත.

- දුම්රිය මාර්ගයේ දිග - කි.මී.26.75 (මාතර සිට බෙලිඅත්ත දක්වා)
- කොන්ත්‍රාත්කරු - සී.එම්.සී.සමාගම - චීනය
- උපදේශන සේවාව - මධ්‍යම ඉංජිනේරු සේවා උපදේශන කාර්යාංශය
- ව්‍යාපෘති කාලය - 2013.08.01 සිට 2018.12.31
- ව්‍යාපෘතියේ මුළු වියදම - ඩොලර් මිලියන 278.2
- දුම්රිය ස්ථාන - කැකණදුර, බඹරැන්ද, වැවුරුකන්නල, බෙලිඅත්ත
- උප දුම්රිය ස්ථාන - පිලදුව, වෙහෙරහේන
- පාලම් සම්පූර්ණ දිග - මීටර් 3,754
- පෙට්ටි බෝක්කු ගණන - 49
- බිම් ගෙවල් - 02 (මී.616 සහ මී. 268)

**ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත් සමාගම විසින් දැනට අවසන් කර ඇති වැඩ කටයුතු**

මේ වන විට සම්පූර්ණ වැඩවලින් 95.1% ක් අවසන් කර ඇති අතර, සංඥා හා විදුලි සංදේශ පද්ධතියද ඇතුළුව මුළු ව්‍යාපෘති කටයුතු 2019 වසරේ මාර්තු මස අවසන් වන විට අවසන් කිරීමට නියමිතය.

### 7.1.3 දේශීය අරමුදල්වලින් ව්‍යාපෘතිය තුළ සිදුකල වැඩ කටයුතු

2018 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මි. 550කි.

1. පවරාගත් ඉඩම් වලින් 100%ක් වන්දි ගෙවා අවසන් කර ඇත.
2. වන්දි සඳහා දැනට ගෙවා ඇති මුළු මුදල රු. මි. 991කි.
3. මාතර නිල්වලා ගඟ හරහා මීටර් 100ක දිගින් යුතු පාලම ඉදිකර අවසන් කර ඇත.
4. පළමු අදියරේ පවරා ගත් ඉඩම්වල භුක්තිය භාර ගැනීම අවසන් කර ඇත.
5. විකල්ප පදිංචි කිරීම් හා ඉඩම් සංවර්ධනය කිරීම් අවසන් කර ඇත.
6. මේ වන විට ඉදිකිරීම් කටයුතු 95.1%ක් අවසන් කර ඇත.

### 7.1.4 මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ වෙන් කර ඇති විදේශීය මුදල් ප්‍රමාණය රු.මි. 5,000.00කි. දේශීය වශයෙන් වෙන් කර ඇති ප්‍රමාණය රු මි. 550.00කි. 2018.12.31 වන විට විදේශීය වශයෙන් වෙන් කර ඇති මුදලින් රු.මි. 2,680.4 ක් වියදම් වි ඇති අතර එය විදේශීය වෙන් කිරීම් වලින් 53.61% ක් පමණ වේ. වෙන් කරන ලද දේශීය මුදල් වලින් 2018.12.31 වන විට වියදම් කර ඇති මුදල රු.මි. 201.00කි. එය ප්‍රතිශතයක් වශයෙන් 64.35% කි.

මාතර කතරගම නව දුම්රිය මාර්ගය ඉදිකිරිමට අමතරව මෙම අංශය මඟින් ඉදිරියේදි ක්‍රියාත්මක කිරිමට හදුනා ගෙන ඇති නව දුම්රිය මාර්ග සහ එහි වර්තමාන ප්‍රගතිය පහත පරිදි දක්වනු ලැබේ.

### 7.2 කුරුණෑගල - හබරණ නව දුම්රිය මාර්ගය

මෙම මාර්ගයේ සම්පුර්ණ දිග කි.මි. 84 කි. නව දුම්රිය මාර්ගය සඳහා ශක්‍යතා අධ්‍යයනය ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කර ඇත. මේ වන විට පාරිසරික අධ්‍යයන වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනිම, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ආරම්භ කිරිම සහ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත්කර ගැනිම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි කටයුතු කර ඇත. අනෙකුත් කාර්යය මණ්ඩලය බඳවා ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. මිනුම් කටයුතු හා භූමිය පරික්ෂා කිරීමේ කටයුතු අවසන් කර ඇත.

#### වර්තමාන ප්‍රගතිය

ව්‍යාපෘතියේ මූලික මිනුම් කටයුතුද, පස් පරීක්ෂා කිරීමේ කටයුතු සහ ජල විද්‍යාත්මක අධ්‍යයන කටයුතු දැනට අවසන් කර ඇති අතර, පරිසර අධ්‍යයන කටයුතුද අවසන් කර අනුමැතිය ලබා ගෙන ඇත. සියලූම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අදාළ 2වන වගන්ති නියමයන් නිකුත්කර ඉඩම් පවරා ගැනීම් ආරම්භ කර ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා China Exim Bank හි අරමුදල් ලබා ගැනීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගෙන මූලික නිර්මාණ (Preliminary Design) සැකසීමෙන් පසු ඒ අනුව ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව උපදේශාත්මක සේවා ආයතනය විසින් සහ ව්‍යාපෘති කමිටුව විසින් විශ්ලේෂණය කොට කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගන්නා ලදී. තවද කැබිනට් මණ්ඩල අනුමැතිය පරිදි අදාළ ව්‍යාපෘති යෝජිත ආයතනය සමඟ කොන්ත්‍රාත් ගිවිසුම්ද අත්සන් කොට China Exim Bank වෙතින් අරමුදල් ලබා ගැනීම සඳහා කටයුතු සිදු කිරිම මේ වන විට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඉල්ලීමක් කර ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා දේශිය අරමුදල් වලින් 2018 වර්ෂය සඳහා රු. මි. 80 ක් වෙන් කර තිබූ අතර. 2018.12.31 වන විට මෙම අරමුදල් වලින් රු.මි. 55 ක් වැය කර ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් 68.71% කි

## 7.3. කොළඹ තදාසන්න දුම්රිය විදුලිකරණය කිරීමේ ව්‍යාපෘතිය (CSRP)

### හැඳින්වීම

මෙම ව්‍යාපෘතිය, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් ශ්‍රී ලංකා දුම්රිය සේවය හා එක්ව ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වේ. මේ වනවිට ව්‍යාපෘතියේ මූලික අධ්‍යයනයන් අවසන් කොට එහි විස්තරාත්මක සැලසුම් සැකසීම ආරම්භ කර ඇත.

### ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම

- ඉදිරියේදී විදුලි දුම්රිය ධාවනය ද අරමුණු කරගෙන නව සමාන්තර දුම්රිය මාර්ග ඉදිකිරීමට හා පවත්නා දුම්රිය මාර්ග නවීකරණය කිරීමට අවශ්‍ය විස්තරාත්මක සැලසුම් සකස් කිරීම හා ඒ අනුව මාර්ග පථයන්ට අයත් බිම්තීරු නිශ්චය කිරීම.

- ව්‍යාපෘතියේ බලපෑමට ලක්වන ප්‍රදේශවල ජීවත් වෙන සියලුම පදිංචි කරුවන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් හා පවත්නා දේපල පිළිබඳ සමීක්ෂණයක් සිදුකිරීම.

- ව්‍යාපෘතියේ බලපෑමට ලක්වන්නන් නැවත පදිංචි කිරීමට හා වන්දි ලබාදීමට සැලසුම් සකස් කිරීම.

- ව්‍යාපෘතියට අයත් ප්‍රදේශ තුළ පාරිසරික ඇගයීම් සිදුකිරීම.

### ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය

සමාන්තර දුම්රිය මාර්ග ඉදිකිරීම හා පවතින දුම්රිය මාර්ග නවීකරණය කිරීම දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් මාර්ග රක්ෂිතය තුළම සිදුකිරීමට සැලසුම් සකස් කරන අතර අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් පෞද්ගලික ඉඩම් අත්පත් කරගැනීම සඳහා කටයුතු කරනු ඇත.

### වන්දි ලබාදීමේ හා නැවත පදිංචි කිරීමේ ක්‍රමවේදය

- දුම්රිය මාර්ග රක්ෂිතය හා ඒ ආශ්‍රිත දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල පදිංචිකරුවන් ස්ථිර හිමිකම් සහිත නිවාස ඒකක වල පදිංචි කිරීම හෝ වන්දි ලබාදීම තුළින් ඉහළ ජීවන තත්ත්වයක් ලබාදීමට කටයුතු කරනු ඇත.
- බලපෑම් වලට ලක්වන දේපළ සඳහා වෙළඳපොල වටිනාකම මත පදනම්ව අදාළ පාර්ශව වෙත වන්දි ලබාදීමට කටයුතු කරනු ඇත.
- නැවත පදිංචිකිරීමේ ක්‍රියාවලියේදී බලපෑමට ලක්වන පාර්ශවයන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙන අවශ්‍ය සැලසුම් සකස් කරනු ඇත.

### ව්‍යාපෘති ක්‍රියාකාරකම්

- විදුලි දුම්රිය ධාවනය ද අරමුණු කරගෙන පවත්නා දුම්රිය මාර්ග නවීකරණය, සමාන්තර නව දුම්රිය මාර්ග ඉදිකිරීම හා ඒ ආශ්‍රිත දුම්රිය ස්ථාන නවීකරණය, ඒ යටතේ,

1. කැළණිවැලි දුම්රිය මාර්ගය මරදාන සිට පාදුක්ක දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයක් ලෙස ඉදිකර පාදුක්ක සිට අවිස්සාවේල්ල දක්වා පවතින දුම්රිය මාර්ගය නවීකරණය කිරීම.

2. ප්‍රධාන මාර්ගයෙහි මරදාන සිට රාගම දක්වා පවතින ත්‍රිත්ව මාර්ගය, මාර්ග 4 කින් යුක්තව ද රාගම සිට වේයන්ගොඩ දක්වා පවතින ද්විත්ව මාර්ගය, මාර්ග 3 කින් යුක්තවද ඉදිකරන අතර වේයන්ගොඩ සිට රඹුක්කන දක්වා පවතින ද්විත්ව මාර්ගය නවීකරණය කිරීම.
3. මුහුදුබඩ මාර්ගයෙහි කොළඹ කොටුව සිට පානදුර දක්වා පවතින ද්විත්ව මාර්ගය මාර්ග 3 කින් යුක්ත මාර්ගයක් ලෙස ඉදිකරන අතර පානදුර සිට කළුතර දක්වා පවතින ද්විත්ව මාර්ගය නවීකරණය කිරීම.
4. පුත්තලම මාර්ගයේ රාගම සිට මීගමුව දක්වා පවතින ද්විත්ව මාර්ගය සංවර්ධනය කිරීම සහ කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සමඟ දුම්රිය මාර්ගය සම්බන්ධ කිරීම

ඉහත නව ඉදිකිරීම් හා නවීකරණයන්ට අදාළ නිර්මාණ හා සැලසුම් සැකසීම සිදුකරන අතරතුර පහත දැක්වෙන කෙටි කාලීන ව්‍යාපෘති ක්‍රියාකාරකම් ප්‍රමුඛ කාර්යයන් සේ සලකා කඩිනමින් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. ඒ යටතේ,

1. නව දුම්රිය විදුලි සංදේශ පද්ධතියක් ස්ථාපිත කිරීම
2. මරදාන හා මාලිගාවත්ත අතර අමතර මාර්ග ඉදිකිරීම
3. නවීන ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම
4. රත්මලානේ පිහිටි දුම්රිය තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය ව්‍යාපෘතිය හරහා හඳුන්වාදෙනු ලබන නව තාක්ෂණය පුහුණු කරන මධ්‍යස්ථානයක් බවට සංවර්ධනය කිරීම

**ව්‍යාපෘති ප්‍රතිලාභ**

- කාර්යක්ෂම හා අවම පිරිවැයකින් යුත් ප්‍රවාහන සේවාවක් සැකසීම තුළින් මගීන් සඳහා දුම්රිය ප්‍රවාහනයේ වැඩි අවස්ථා සැලසීම

- කොළඹට දිනපතා පැමිණෙන රථ වාහන ප්‍රමාණය අඩු කිරීම තුළින් වාහන තදබදයට පිළියම් සැලසීම.

- දුම්රිය හරස් මාර්ග හේතුවෙන් සිදුවන අනතුරු හා රථවාහන මාර්ග තදබදය අවම කිරීම.

- නවීකරණය කරන දුම්රිය ස්ථානවල මගීන්ට වැඩි පහසුකම් ලැබීම හා ඒ යටතේ කාන්තාවන්ට හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා නියමිත පහසුකම් සැපයීම.

- දුම්රිය මගීන්ගේ ආරක්ෂාව තහවුරු වීම.

- දුම්රියෙන් වියහැකි අනතුරු අවම කිරීම.

මේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව ලබාදෙන අරමුදල් පහත දැක්වේ.

1. ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශාත්මක සේවා සඳහා ඇ.ඩො.මි.1 ක ආධාර
2. සැලසුම් සහ ප්‍රසම්පාදන උපදේශාත්මක සේවා සඳහා ඇ.ඩො.මි. 10 ක්
3. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො.මි. 300 ක් (පළමු අදියර)
4. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො.මි. 300 ක් (දෙවන අදියර)

### ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

- මෙම ව්‍යාපෘතිය දැනට මූලික ශක්‍යතා අධ්‍යයන අදියර පසු කරමින් ශක්‍යතා අධ්‍යයනය සහ සවිස්තරාත්මක නිර්මාණ සැකසීමේ (Detailed Design) අදියර දක්වා ගමන් කර ඇත. සවිස්තරාත්මක නිර්මාණ සැකසීමේ කටයුතු 2018 ජනවාරි මාසයේදී ආරම්භ කර ඇත.

- මරදාන සිට හෝමාගම දක්වා එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස කාර්යාලය (UN -Habitat) මඟින් සිදුකරන සමාජ ආර්ථික සමීක්ෂණය මේ වන විට අවසන් වී ඇති අතර හෝමාගම සිට අවිස්සාවේල්ල දක්වා සමාජ ආර්ථික සමීක්ෂණය සිදු කිරීමද අවසන් වී ඇත. කොළඹ - රඹුක්කන අතර කොටසේද සමාජ ආර්ථික සමීක්ෂණ ආරම්භ වී ඇත. මෙම සමීක්ෂණ 50% ක් පමණ මේ වන විට අවසන්ව ඇත.

- ව්‍යාපෘති බල ප්‍රදේශය තුළ (කි.මී.210) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් සියලූ දුම්රිය ඉඩම්වල මැනීම් කටයුතු අවසන් කර ඇත.

- මෙම ව්‍යාපෘතිය සඳහා විදේශීය සහ දේශීය අරමුදල් වලින් 2018 වර්ෂය සඳහා රු.මි. 1,630 ක් වෙන් කරන ලද අතර 2018 දෙසැම්බර් වන විට ආසියානු සංවර්ධන බැංකු අරමුදල් වලින් රු. මි. 371 ක් (82.4%) ක් වියදම් වී ඇති අතර, දේශීය අරමුදල් වලින් රු.මි. 619.08 ක් (81.5%) වැය කර ඇත.

## 7.4 කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපාතිය 2018 පෙබරවාරි මසදී ආරම්භ වු අතර සංවර්ධන කාර්යයන් 32 ක් (මිලදී ගැනීම් හා ඉදිකිරීම්) හඳුනා ගෙන ඇත. මෙම කාර්යයන්ගෙන් 28ක් සඳහාම මේ වන විට මිලදී ගැනීම් ලේඛන (Tender Document) සැදීම අවසන් කර ඇත. ප්‍රධානම සංවර්ධන කාර්යයන් 2 ක (Sri Lanka Railway Island wide Radio Telecommunication System) සහ (Sri Lanka Railway Island wide Ticketing & Seat reservation system) සඳහා ටෙන්ඩර් කැඳවා ඇත. මේ ව්‍යාපෘතිය සඳහා 2019 වසරේදී ඇ.ඩො.මි. 160 ක මූල්‍ය පහසුකම් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබෙනු ඇත. මෙම සංවර්ධන කටයුතු පහත සඳහන් පරිදි වේ.

1. Island wide Railway Ticketing and Seat Reservation System (RTRS)

ටෙන්ඩර් කැඳවා ඇත. මෙම පද්ධතිය ස්ථාපිත කිරිමත් සමඟ දුම්රිය ප්‍රවේශපත්‍ර කාර්යක්ෂමව නිකුත් කිරිමට හැකිවන අතර දුම්රිය ආදායම වැඩි කර ගැනීමට හැකිවනු ඇත. මෙහිදී දුම්රිය ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමේ ක්‍රම (Ticketing Methods) 5 ක් මහජනයාට විවෘත වන අතර මුදල් ගෙවීමේ ක්‍රම 3 ක් ලැබෙනු ඇත.

2. Island wide Radio Telecommunication System (IRTS)

1985 සිට දුම්රිය සේවාව සතුව පැවති දුම්රිය විදුලි සංදේශ පද්ධතිය මේ වන විට මුළුමනින්ම අක්‍රිය වී ඇති අතර මෙම මිලදී ගැනීම හරහා ලංකාවේ විදුලි සංදේශ සේවා සපයන ආයතන හරහා නවීන LTE තාක්ෂණය භාවිතා වන විදුලි සංදේශ පද්ධතියක් ස්ථාපිත වනු ඇත. මෙමඟින් දුම්රිය මෙහෙයුම් කටයුතු වලට සහභාගීවන සියලූ කාර්ය මණ්ඩල වෙත දුරකතන හා දත්ත හුවමාරු කිරිමේ පහසුකම් සැපයෙනු ඇත.

3. කොළඹ දුම්රිය පාලන මධ්‍යස්ථානය (CTCC) සහ දුම්රිය මෙහෙයුම් මූලස්ථානය ඉදි කිරීම
කොළඹ එල්පින්ස්ටන් රඟහල ඉදිරිපිට භූමි භාගයක මහල් 10කින් යුත් ගොඩනැගිල්ලෙහි නවීන දුම්රිය පාලන මධ්‍යස්ථාන 3 ක්, උපකරණ සවි කිරීම සඳහා මහල් 2 ක් සහ නඩත්තු සහ දුම්රිය මෙහෙයුම් කටයුතු සඳහා ඉඩ වෙන්වනු ඇත. මෙම මධ්‍යස්ථානය ඉදිරියේදී ශ්‍රී ලංකාව තුළ ඉදි වන ඉහලම තාක්ෂණයෙන් යුත් ගොඩනැගිල්ලක් වනු ඇත.

4. මාළිගාවත්තේ පිහිටි School Lane Bridge නැවත ඉදි කිරීම
වසර 100 ක් පමණ පැරණි මෙම පාලම තවත් දුම්රිය මාර්ග 3 ක් ඒ මත ඉදි කිරීමට හැකි වන අයුරින් නැවත ඉදි වන අතර දිශා 2 කට වාහන ගමන් කිරීමට හැකි අයුරින් ඉදි වනු ඇත. මෙම පාලම හරහා පයින් ගමන් කිරීමට හැකි මාර්ග දෙකක්ද ඉදිවේ. මේ සඳහා ටෙන්ඩර් කැඳවීමට සූදානම්ව ඇත.

5. මාලපල්ල දුම්රිය ඉඩමක ඉදිවන මහල් 10 කින් යුත් නිවාස 108 ක් සහිත නිවාස සංකීර්ණය
මෙහි නිර්මාණ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරන ලද අතර මෙම නිවාස වල එම නිවාස සංකීර්ණය අවට දුම්රිය මාර්ගයට ලබා ගන්නා ඉඩම් වල ජීවත් වන ජනතාව පදිංචි වනු ඇත. මෙමගින් ද්විත්ව දුම්රිය මාර්ගයට අවශ්‍ය ඉඩම් ලබා ගැනේ. මේ සඳහා ටෙන්ඩර් කැඳවීමට සූදානම්ය.

6. රත්මලාන දුම්රිය පුහුණු මධ්‍යස්ථානයෙහි සංවර්ධන කටයුතු
මෙහිදී පුහුණු මධ්‍යස්ථානය සඳහා නව පර්යේෂණාගාර 4 කින් සහ පුහුණු කර්මාන්ත ශාලා වලින් යුත් ගොඩනැගිල්ලක් ඉදි වන අතර ශ්‍රවණාගාරයක් සහ Hostel ගොඩනැගිල්ලක් ඉදි වනු ඇත. මෙමගින් පුහුණු පාසලේ දුම්රිය මාර්ග, ධාවන බල, විදුලි සංදේශ, පරිගණක ,කළමනාකරණ සහ දුම්රිය මෙහෙයුම් ඉගැන්වීම් සහ පුහුණුවීම් වලට ඉඩ පහසුකම් ලැබෙනු ඇත. මෙයද ටෙන්ඩර් කැඳවීමට සූදානම්ව ඇත.

7. මීට අමතරව පුහුණු මධ්‍යස්ථානයෙහි දැනට භාවිතා වන වසර 30 ක් පමණ පැරණි පුහුණුවීම්වලට භාවිතා වන සියලූ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඉවත් කොට, නවීන තාක්ෂණය භාවිතා වන යන්ත්‍රසූත්‍ර සහ පුහුණු උපකරණ ලබා දෙනු ඇත.

8. රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුව සඳහා නව කර්මාන්ත ශාලාවක් , ගබඩා 2 ක් ඉදි කිරීම සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා නිර්මාණාත්මක සැලසුම් සැකසීමේ කටයුතු අවසන් වෙමින් පවතී.

9. දුම්රිය මාර්ග සංවර්ධනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම.
මේ සඳහා අවශ්‍ය Bid Documents ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. මෙමගින් Tamping Machine එකක් සහ Ballest Regulator එකක් මිලදී ගනු ඇත.

10. රඹුක්කන - මාතලේ - ගම්පොළ කොට්ඨාසයෙහි දුම්රිය මාර්ග සංවර්ධනය කොට සවිස්තරාත්මක නිර්මාණ (Detailed Design) සැකසීම සඳහා උපදේශනාත්මක සේවාවක් ලබා ගැනීම
මෙහිදී රඹුක්කන සිට කඩුගන්නාව දක්වා කොටසෙහි මූලික ශක්‍යතා අධ්‍යයනය, කඩුගන්නාව සිට මාතලේ දක්වා කොටසෙහි ශක්‍යතා අධ්‍යයනය සහ Detailed Design සැකසීමත් පේරාදෙණිය ගම්පොළ අතර කොටසෙහි මූලික ශක්‍යතා අධ්‍යයනයත් සිදු කෙරෙනු ඇත. මෙම උපදේශනාත්මක සේවාව 2019 පෙබරවාර් මාසයේදී ආරම්භ වනු ඇත.

### 7.5 කැලණිවැලි දුම්රිය මාර්ග සංවර්ධනය.-

මේ වන විට කැලණිවැලි මාර්ගයේ සවිස්තරාත්මක නිර්මාණ සැකසීමේ කටයුතු 95 % ක් අවසන් කර ඇත. 2019 වසරේ මුල් කාර්තුවේදී මෙම කැලණිවැලි මාර්ග ඉදි කිරීම් සඳහා ටෙන්ඩර් කැඳවනු ඇත. මෙහිදී මරදාන සිට මාකුඹුර ( කි.මී. 20 ක්) දක්වා කොටසෙහි ප්‍රධාන හා වාහන බහුල හරස් මාර්ග 54 ක් ඇති බැවින් සහ ඉඩම් අත්පත් කර ගැනීමේදී පදිංචි ජනතාවට සිදු වන හානිය අවම කර ගෙන වන්දි ගෙවීම සඳහා වන වියදම අවම කර ගැනීම සඳහා, මෙම කොටස කණු මතින් ඉදි වන ද්විත්ව මාර්ගයක් ලෙස ඉදි කෙරෙන අතර, මාලපල්ල සිට පාදුක්ක දක්වා කොටස පොළොව මතින් ඉදි කෙරෙන ද්විත්ව මාර්ගයක් ලෙස සංවර්ධනය කරනු ඇත. මරදාන පාදුක්ක කොටස මෙම ව්‍යාපෘතියේ මුල් අදියර ලෙස සංවර්ධනය වන අතර පාදුක්ක - අවිස්සාවේල්ල කොටස තනි දුම්රිය මාර්ගයක් ලෙස ඉදිරියේදී සංවර්ධනය වනු ඇත. මේ සඳහා ඉදිකිරීම් 2020 වසරේ මුල් භාගයේදී පටන් ගැනීමේ අරමුණින් ඊට අදාළ ටෙන්ඩර් කටයුතු මේ වසරේදී (2019) අවසන් වනු ඇත. දුම්රිය මාර්ග සංවර්ධනයත් සමඟ දුම්රිය මාර්ග දෙපස ඇති ඉඩම් දුම්රිය දෙපාර්තමේන්තුවට ආදායම් ලැබෙන සංවර්ධන වලට යෙදවීම සඳහා උපදේශනාත්මක සේවාවක් ලබා ගැනීමට අදාළ කටයුතු දැනට කෙරෙමින් පවතී.

### 7.6 GPS තාක්ෂණය භාවිතා වන දුම්රිය මෙහෙයුම් තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල තොරතුරු පද්ධතිය සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධතිය සමඟ සම්බන්ධ කිරීම

කැබිනට් මණ්ඩල අනුමැතින් සහ උපදෙස් වලට අනුව මෙම නවීන ගෝලීය පිහිටුම් තාක්ෂණය භාවිතා වන පද්ධතිය ආරක්ෂක අමාත්‍යංශය යටතේ ඇති පර්යේෂණ සංවර්ධන ආයතනය විසින් නිපදවා සවි කෙරෙන අතර මෙමඟින් ඉතාම නිවැරදිව දුම්රිය ධාවනයේ ආරක්ෂාවට සරිලන පරිදි දුම්රිය ධාවන තොරතුරු ලබා දේ. දුම්රිය ධාවනයේ ආරක්ෂාව, දුම්රිය පාලක කාර්යාලයේ කාර්යක්ෂමතාව, දුම්රිය කාලසටහන් නිර්මාණයේ නිවැරදිතාව සහ දුම්රිය කාර්ය මණ්ඩලවලට අවශ්‍ය දුම්රිය ධාවන තොරතුරු මෙමඟින් ලබා දීමට කටයුතු කෙරේ.

SLTB සහ NTC පද්ධතියක් සමඟ සම්බන්ධ කිරීම තුළින් මගී ජනතාවට තම ගමන සැලසුම් කිරීම සහ බස් හෝ දුම්රිය පැමිණෙන තෙක් මාර්ගය අසළ හෝ දුම්රිය ස්ථාන තුළ නැවතී සිටීමේ අවශ්‍යතාව නොමැති වන ලෙස අදාළ තොරතුරු මහජනයා වෙත ලබා දීම සිදු කෙරේ. මෙම පද්ධතිය 2019 පෙබරවාරි මස සිට ක්‍රමයෙන් දුම්රිය පද්ධතියට එකතු වනු ඇත.

# II කොටස

## අමාත්‍යංශය යටතේ ඇති ආයතනයන්හි කාර්යසාධනය

# 1.

# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## 1.1 හැඳින්වීම

2018 වර්ෂයේදී ද ජාතික ප්‍රවාහන පද්ධතිය තුළ මගී හා භාණ්ඩ ප්‍රවාහනයෙහිලා අඛණ්ඩව ප්‍රවාහන සේවා සපයමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය ජාතික ප්‍රවාහන පද්ධතියේ සුභදායි ප්‍රවනතාවයක් සඳහා දායකත්වය ලබා දෙමින් සතුටුදායක සේවාවක් සපයා ඇත.

### දැක්ම

"දකුණු ආසියාවේ වඩා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සැපයුම්කරු බවට පත්වීම.

### මෙහෙවර

"මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායි, නියමිත වේලාවට ධාවනය වන, සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම.

## 1.2 සමස්ත විග්‍රහය

ප්‍රධාන ප්‍රවාහන සේවා සැපයුම් කරුවෙකු ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය 2018 වර්ෂයේදී ද මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල නියලෙමින් ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රයේ දායකත්වය අඛණ්ඩව ලබා දෙන ලදී. මේ සඳහා දුම්රිය ඇණිය හා දුම්රිය මාර්ග නිසි පරිදි නඩත්තු කිරීම, දුම්රිය මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යෑම, සංඥා හා විදුලි සංදේශ පද්ධතියේ නඩත්තුව සහ වෙනත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ආදී අංශ වල අඛණ්ඩව සිදු කරන ලද සංවර්ධන කටයුතු මෙම දායකත්වය කෙරෙහි සෘජුව ඉවහල් විය. 2018 වර්ෂය අවසන් වන විට කරන ලද ප්‍රධාන කාර්යයන් අතර ඉන්දියානු මූල්‍ය ආධාර යටතේ නව දුම්රිය ඇණිය මිල දී ගැනීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. තවද මේ යටතේ නව බලවේග කට්ටලයක් සහ දුම්රිය එංජිමක් 2018 වර්ෂයේ අවසානයේ මිලදී ගැනුණි. දකුණු පයාගල සිට අලූත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීම ද මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම ද මේ වසර තුළ සිදු කළ සුවිශේෂී කාර්යයන් අතරට ගත හැකිය. මේ යටතේ මගී මැදිරි 52 ක පමණ වැඩ අවසන් කර සේවාව සඳහා යොදවා ඇත. ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග 200 ක් ස්ථාපිත කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම හා ඒ යටතේ 2018 වසර අවසන් වන විට ආරක්ෂිත හරස් මාර්ග 85 ක් ඉදි කර අවසන් කිරීම වැනි කාර්යයන් රාශියක් ක්‍රියාත්මක කිරීමට හැකි විය. තවද උඩරට දුම්රිය මාර්ගයේ ධාවන කටයුතු සඳහා එංජින් 12 ක් හා බලවේග කට්ටල 09 ක් මිල දී ගැනීමේ කටයුතු ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. මීට අමතරව පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීම, මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය හා සංඥා පද්ධතිය පුනරුත්ථාපන ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීම ආදී කටයුතු ද මේ යටතේ ප්‍රධාන තැනක් ගනී.

2018 වර්ෂයේ මුළු ආදායම රු. මි. 7,406.33 ක් වූ ක් වූ අතර එය 2017 වර්ෂයේ රු.මි. 6,477.11 ක් විය. මෙය 2017 වර්ෂය හා සසඳන විට 14 % ක වැඩි වීමක් පෙන්නුම් කරයි. 2018 වර්ෂයේ ඔක්තෝම්බර් 01 දින සිට දුම්රිය ගාස්තු වැඩි කිරීම මෙම වැඩි වීමට බලපෑ ප්‍රධාන සාධකය වේ. මගී සංඛ්‍යාව 2017 වර්ෂයට සාපේක්ෂව 0.7 % ක වැඩි වීමක් පෙන්නුම් කරන අතර එය 2017 වර්ෂයේ වන විට මි. 136.66 ක් වූ අතර 2018 වර්ෂයේ මි. 137.51කි. 2018 වසර අවසන්

වන විට භාණ්ඩ ප්‍රවාහන ආදායම හා භාණ්ඩ ටොන් ප්‍රමාණය සලකා බැලීමේදී අඩු වීමක් පෙන්නුම් කරන අතර අදාළ කාලය තුළදී පිළිවෙළින් භාණ්ඩ ප්‍රවාහන ආදායම රු.මි. 429.11- රු.මි. 418.22 දක්වා ද භාණ්ඩ ටොන් මි. 1.99 - 1.89 දක්වාද අඩු වීමක් පෙන්නුම් කරයි. තෙල් ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රමාණවත් එංජින් සංඛ්‍යාවක් නොතිබීමත් ගල් අඟුරු ප්‍රවාහන කටයුතු නොකිරීමත් භාණ්ඩ ප්‍රවාහන කටයුතු අඩු වීම කෙරෙහි බලපෑ මූලික සාධක විය. මෙම කාලය තුළ මගී කි.මී. ප්‍රමාණය 2017 වර්ෂය අවසන් වන විට මි. 7,495.06 ක්ද 2018 වර්ෂයේ අවසානය වන විට මි. 7,709.52 දක්වා 2.8% කින් වර්ධනය වී ඇත. භාණ්ඩ ටොන් කි.මී. ප්‍රමාණය 2018 වර්ෂයේ සුළු අඩු වීමක් පෙන්නුම් කරන අතර එය 2017 වර්ෂය වන විට ටොන් කි.මී.මි. 144.79 හා 2018 වර්ෂය අවසන් වන විට ටොන් කි.මී.මි. 127.35 ක අගයක් පෙන්නුම් කරයි. මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු අඩුවීම කෙරෙහි 2018 වසරේ අගෝස්තු මාසයේ ක්‍රියාත්මක කරන ලද දුම්රිය වැඩ වර්ජනය හේතු වූ සාධකයක් ලෙස හඳුනාගත හැකිය.

2018 වර්ෂය අවසන් වන විට මුළු වියදම රු.මි. 29,629.18 ක් වූ අතර මේ තුළ රු.මි. 14,380.54 ක් පුනරාවර්ථන වියදම හා රු.මි. 15,248.63 ක් වූ ප්‍රාග්ධන වියදම ඇතුළත් වේ. 2017 වසරේ ප්‍රාග්ධන වියදම රු.මි. 12,888.87 ක් වූ අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව ප්‍රාග්ධන වියදමෙහි 18 % ක පමණ වැඩි වීමක් පෙන්නුම් කරයි. දුම්රිය ඇණිය මිල දී ගැනීමේ ව්‍යාපෘතියේ මූලික ගෙවීම් සිදු කිරීම ප්‍රාග්ධන වියදමෙහි වැඩි වීමට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැක. 2018 වර්ෂයේ පුනරාවර්ථන වියදම රු.මි. 14,380.54 ක් වූ අතර 2017 වර්ෂයේ එය රු.මි. 14,080.65 ක් ලෙස පැවතුණි.

තදාසන්න දුම්රිය සේවය සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන මාර්ගයේ රඹුක්කන දක්වා ද පුත්තලම මාර්ගයේ මීගමුව දක්වා ද මුහුදුබඩ මාර්ගයේ පානදුර දක්වා ද කැළණිවැලි මාර්ගයේ අවිස්සාවේල්ල දක්වා ද දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. තවද ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර මත දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සැලැස්ම (Railway Master Plan ) සැකසීමේ කටයුතු ද ආරම්භ කර ඇත.

**2018 වර්ෂය අවසන් වන විට දුම්රිය සේවයේ ගුණාත්මකභාවය වර්ධනය සඳහා පහත සඳහන් පියවරයන් ගෙන ඇත.**

- ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ මූලික වැඩ ආරම්භ කිරීම
- දුම්රිය ඇණිය මිල දී ගැනීම

(අ) ඉන්දියානු ණය ආධාර යටතේ දුම්රිය ඇණිය මිල දී ගැනීම
මේ යටතේ මගී මැදිරි 160 ක් බලවේග කට්ටල 06 ක් දුම්රිය එංජින් 10 ක් තෙල් ටැංකි 30 ක් කන්ටේනර් ප්ලැට් වැගන් 20 ක් මිල දී ගැනේ.

(ආ) දේශීය මූල්‍ය යටතේ

- උඩරට දුම්රිය මාර්ගය සඳහා දුම්රිය ඇණිය මිල දී ගැනීමේ කටයුතු අරඹා ඇති අතර ඒ යටතේ එංජින් 12 ක් හා බලවේග කට්ටල 09 ක් මිල දී ගැනීමට බලාපොරොත්තු වේ.
- 2018 වර්ෂය අවසන් වන විට තනතුරු සඳහා බඳවා ගැනීම් පරිපාටි සැකසීමේ කටයුතු සිදු කළ අතර ක්ෂේත්‍ර කීපයක නව බඳවා ගැනීම් සිදු කර ඇත.
- හන්ගේරියානු ණය ආධාර යටතේ ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග 250 ක් ස්ථාපිත කිරීම
- මහව-ඕමන්තේ දුම්රිය මාර්ගය හා සංඥා පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම
- මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම හා ඒ මගින් මගී සේවා පුළුල් කිරීම

- මගී පහසුව සඳහා 2018 වර්ෂයේ දුම්රිය ස්ථාන පරිශ්‍රයන් තුළ ATM යන්ත්‍ර 14 ක් ස්ථාපිත කිරීම දුම්රිය ස්ථාන 04 ක ආපන ශාලා ආරම්භ කිරීම හා දුර ගමන් සේවා දුම්රියන් 08 ක භෝජනාගාර ස්ථාපිත කිරීම
- පොල්ගහවෙල - කුරුණෑගල ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම

## 1.3 යටිතල පහසුකම්

### 1.3.1 දුම්රිය මාර්ග, ගොඩනැගිලි, පාලම් වැඩිදියුණු කිරීම

2018 වර්ෂයේද ස්ථිර මාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු හා වැඩිදියුණු කිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රේල් පීලි, කොන්ක්‍රීට් සිල්පර සහ දැව සිල්පර, බැලස්ට් ඇතිරීම නිසි ලෙස සිදු කරමින් මාර්ග පද්ධතිය හොද තත්වයකින් පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදි. ගුණාත්මක හා සුරක්ෂිත දුම්රිය සේවාවක් පවත්වා ගෙන යෑම සඳහා මෙම කටයුතු වඩා ඉවහල් වන අතර මෙම කාර්යයන් සඳහා පහත පරිදි ද්‍රව්‍යයන් භාවිතා කරන ලදි.

| යොදා ගත් ද්‍රව්‍යය | ප්‍රමාණය |
|---|---|
| රේල් පීලි අඩි | 94,907 |
| දැව සිල්පර | 65,026 |
| වානේ සිල්පර | 3,654 |
| කොන්ක්‍රීට් සිල්පර | 74,593 |
| බැලස්ට් කියුබ් | 13,913 |

මගී පහසුව සහ ආරක්ෂාව සඳහා දුම්රිය වේදිකා ඉස්සීම හා දීර්ඝ කිරීමේ කටයුතු ද නිම කර ඇත. මේ යටතේ පන්නිපිටිය, මොරගොල්ලාගම, හිගුරක්ගොඩ, කන්තලේ, කැකිරාව, ගල්ඔය, විල්වත්ත, උතුරු කළුතර හා වැල්ලවත්ත යන දුම්රිය ස්ථාන වල වේදිකා ඉස්සීම හා දීර්ඝ කිරීම අවසන් කර ඇති අතර කහව සහ වැල්ලව දුම්රිය ස්ථාන වල මගී පාලම් ඉදි කිරීම අවසන් කර ඇත.

තවද මාර්ග පද්ධතිය තුළ පහත සඳහන් කටයුතුද 2018 වර්ෂයේ දී සිදු කරන ලදී.

- දුම්රිය ස්ථාන ගොඩනැගිලි ඉදි කිරීම සහ අලුත්වැඩියාව
- දුම්රිය මාර්ග ජාලය සඳහා අවශ්‍ය රේල් පීලි සහ සිල්පර මිලදී ගැනීම
- මහනුවර, පේරාදෙණිය, කඩුගන්නාව ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීම
- කටුනායක - මීගමුව ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම
- දුම්රිය පාලම් නඩත්තුව, දුම්රිය ස්ථාන වල සනීපාරක්ෂක පහසුකම් ලබා දීම
- පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීම හා ඒ යටතේ සමීක්ෂණ කටයුතු, සැලසුම් හා ටෙන්ඩර් වාර්තා පිළියෙළ කිරීම සඳහා ඉංජිනේරු කටයුතු පිළිබඳ උපදේශන කාර්යාංශය වෙත ලබා දීම.
- දකුණු පයාගල හා අළුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම

- ➢ මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීම. ( මෙහි ලංසු ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී.)

### 1.3.2 දුම්රිය ඇණිය

මේ යටතේ දුම්රිය ඇණියේ ගුණාත්මකභාවය වැඩි කර ගැනීම සඳහා නිරන්තරයෙන් නඩත්තු කටයුතු සිදු කරමින් 2018 වර්ෂයේ අවසන් වන විට සුළු අලුත්වැඩියාවන් 33,525ක්, ප්‍රධාන අලුත්වැඩියාවන් 1,842 ක්, මගී මැදිරි 10 ක් ලෙස දුම්රිය ඇණියේ නඩත්තු කටයුතු සිදු කර ඇත. දැනට පවතින දුම්රිය ඇණියෙන් දුම්රිය එංජින් 50 ක් සහ බලවේග කට්ටල 60 ක් සාමාන්‍ය සේවය සඳහා යොදා ගෙන පැවතුණි.

බාහිර පාර්ශවයන් හා එක්ව ඇති කර ගත් ගිවිසුමකට අනුව ක්‍රියාත්මක වන මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වන අතර වසර අවසන් වන විට මගී මැදිරි 68 ක් පුනරුත්ථාපනය කිරීම අවසන් කිරීමට හැකි විය. මින් මැදිරි 52 ක් මේ වන විට සේවාව සඳහා යොදවා ඇත .

තව දුරටත් ඉන්දීය ණය ආධාර යටතේ දුම්රිය ඇණිය පුළුල් කිරීම සඳහා පහත සඳහන් පරිදි මිල දී ගැනීම් සිදු කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත.

| # | වර්ගය | ඇස්තමේන්තුගත මුදල (ඇ.ඩො.මි.) | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | දුම්රිය එන්ජින් 10 (ඉන්දියානු ණය ආධාර) | 42.5 | එක් එංජිමක් ආනයනය කර ඇත. |
| 02 | බලවේග කට්ටල 06 (ඉන්දියානු ණය ආධාර) | 58.04 | එක් බලවේග කට්ටලයක් ආනයනය කර ඇත. |
| 03 | මගී මැදිරි 160 (ඉන්දියානු ණය ආධාර) | - | රයිට්ස් සමාගමෙන් ලංසු ලැබී ඇත. ණයවර ලිපි විවෘත කිරීම ආරම්භ කර ඇත. |
| 04 | තෙල් ටැංකි 30 ක් කන්ටේනර් ප්ලැට් වැගන් 20 (ඉන්දියානු ණය ආධාර) | 4.26 | වැගන් නිරීක්ෂණය සඳහා ගොස් ඇත. |
| 05 | උඩරට දුම්රිය මාර්ගය සඳහා බලවේග කට්ටල 09 ක් මිල දී ගැනීම | 93.86 | සැලසුම් අනුමත කර ඇත. අත්තිකාරම් මුදලින් 15% ක් ගෙවා ඇත. |
| 06 | උඩරට දුම්රිය මාර්ගය සඳහා එංජින් 12 ක් මිල දී ගැනීම | | කැබිනට් අනුමැතිය ලැබී ඇත. |

### 1.3.3 සංඥා හා විදුලි සංදේශ පද්ධතිය

2018 වසරේ ද සංඥා පද්ධතියේ වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- ➢ ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග 200 ක් සවි කිරීම -
  මේ යටතේ 2018 දෙසැම්බර් මාසය අවසන් වන විට දුම්රිය හරස් මාර්ග 85 ක් අලුතෙන් ඉදි කර ඇති අතර දුම්රිය හරස් මාර්ග 48 ක් පමණ අලුත්වැඩියා කොට ඇත.

- මුහුදුබඩ දුම්රිය මාර්ගයේ සංඥා හා විදුලි සංදේශ පද්ධතිය වැඩිදියුණු කිරීම
- සීදූව-කටුනායක දක්වා දුම්රිය මාර්ගයේ සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම
- සීදූව හා කටුනායක ද්විත්ව මාර්ගය ඉදිකිරීමට සමගාමීව සීදුව කටුනායක දුම්රිය අංගන වල සංඥා පද්ධති වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කරන ලද අතර එයට සමගාමීව ද්විත්ව මාර්ගයට ගැලපෙන පරිදි සීදූව හා කටුනායක අතර වූ දුම්රිය හරස් මාර්ග වල සියලූ ආරක්ෂක පද්ධති වැඩිදියුණු කරන ලදී.

## 1.4 මූල්‍ය ප්‍රගතිය

| ආදායම /වියදම | 2017 (රු.මි.) | 2018 (රු.මි.) |
|---|---:|---:|
| (i) ආදායම | | |
| සාමාන්‍ය ප්‍රවේශපත් | 4,261.22 | 4,988.20 |
| වාර ප්‍රවේශපත් | 1,075.47 | 932.15 |
| පාර්සල් හා ලිපි | 170.93 | 209.82 |
| භාණ්ඩ හා පශු සම්පත් | 429.11 | 418.22 |
| වෙනත් | 518.80 | 857.92 |
| එකතුව | 6,455.53 | 7,406.31 |
| (ii) වියදම | | |
| පුනරාවර්තන වියදම (රු.මි.) | 14,080.65 | 14,380.54 |
| ප්‍රාග්ධන වියදම (රු.මි.) | 12,888.87 | 15,248.63 |
| **එකතුව** | **26,969.52** | **29,629.17** |

## 1.5 අභියෝග හා ගැටලූ

1. සමස්ථ දුම්රිය මාර්ග ජාලයේ පවතින අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම
2. පැරණි දුම්රිය එංජින් සංඛ්‍යාව හා ඒවා සේවාවේ යෙදවීමේදී නිරන්තර අලූත්වැඩියා කටයුතු අවශ්‍ය වීම
3. සංඥා හා විදුලි සංදේශ පද්ධතිය ඉතා පැරණි වීම
4. පුහුණු ශ්‍රම හිඟය
5. ප්‍රමාණවත් නොවන දුම්රිය ඇණිය හා යටිතල පහසුකම් හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුව ධාරිතාවය ඉහළ නැංවීමේ දී ගැටලූකාරි තත්ත්වයට මුහුණ දීම
6. දුම්රිය රක්ෂිතයන්හි අනවසර පදිංචිකරුවන් රැඳී සිටීම
7. ඉඩම් කළමනාකරණය, මෙහෙයුම් කළමනාකරණය, තොග පාලනය, මානව සම්පත් කළමනාකරණය, නඩත්තු කටයුතු ආදි අංශ වල තොරතුරු තාක්ෂණය භාවිතයේ සීමාකම්
8. පුනරාවර්ථන වියදම ඉහළ යෑම

### 1.6 දුම්රිය සේවාවේ ගුණාත්මකභාවය හා විශ්වසනීයත්වය ඉහළ නැංවීම සඳහා 2018 වසරේ ක්‍රියාත්මක කළ හා ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන්

- මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම
- දකුණු පයාගල - අළුත්ගම දක්වා දුම්රිය මාර්ගය ද්විත්වකරණය කිරීම
- ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය
- දුම්රිය ඇණිය මිලදී ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම
- මහව ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීම
- පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම
- පුත්තලම දුම්රිය මාර්ගයේ සිදුව සිට කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු සිදු කිරීම
- හංගේරියානු ආධාර යටතේ ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග ස්ථාපිත කිරීම
- නව කැළණි පාළම ස්ථාපිත කිරීම
- දුම්රිය සේවය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීම

# 2.

# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## 2.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි නොකළ මෝටර් වාහන ලියාපදිංචි කිරීම සඳහා 1928 ජනවාරි මස 01 වන දින මෝටර් වාහන රෙජිස්ට්‍රාර් කාර්යාලය ලෙස ආරම්භ කරන ලද මෙම කාර්යාලය 1951 අංක 14 දරණ මෝටර් වාහන පනත මඟින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ලෙස පරිවර්තනය කරන ලදී. මෙම ආයතනය ශ්‍රී ලංකාව තුළ මෝටර් වාහන ලියාපදිංචිය, නියාමනය, රියදුරු බලපත් නිකුත් කිරීම, මාර්ග ආරක්ෂාව හා පරිසර හිතකාමී වාහන භාවිතය යන අරමුණු පෙරදැරිව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සපයනු ලබයි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ වාහන භාවිතයේ සීඝ්‍ර වැඩිවීමත් සමගම පුළුල් වී ඇති දෙපාර්තමේන්තු කාර්යයන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉටු කිරීම සඳහා නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වේ.

**දැක්ම**

"විශිෂ්ට මෝටර් වාහන නියාමනයෙන් ඉහළ මහජන ප්‍රසාදය"

**මෙහෙවර**

"අභිප්‍රේරණය වූ සේවක සමූහයේ සාමූහික ප්‍රයත්නය හා නවීන තාක්ෂණය යොදා ගනිමින් මෝටර් වාහන පනත හා අනෙකුත් නීති රෙගුලාසි ප්‍රශස්ථ ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ඉහළ මහජන ප්‍රසාදයක් උදෙසා කැපවීම."

## 2.2 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

**1. ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය හා රියදුරු බලපත් ලබාදීම**

මෙම වර්ෂය තුළ (2018.12.31 දිනට) වාහන ලියාපදිංචිය 479,340 වන අතර එම කාල සීමාව තුළ වාහන පැවරීම් සංඛ්‍යාව 666,752 කි. උක්ත කාල සීමාව තුළදී රියදුරු බලපත්‍ර 806,600 ක් නිකුත් කර ඇත.

**2. රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව**

රියදුරු බලපත්‍රය නිකුත් කිරීමේ ක්‍රියාපිළිවෙළ හා එහි ස්වභාවය දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට අවස්ථා ගණනකදී විකාශනය වෙමින් වර්තමානයේ නිකුත් කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුතු නව ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය දක්වා විකාශනය වී ඇත. මෙම ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීම වැළැක්වීම සඳහා උසස් තත්ත්වයේ ආරක්ෂණ උපක්‍රම භාවිතා කර ඇති අතර, මෙහි බලපත්‍ර දරන්නාගේ රුධිර ගණයද ඇතුළත් කර ඇත. වේරහැර උපකාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල හරහා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආකාර දෙකක් මඟින් සිදු කරනු ලබයි.

එනම්,

1. On line (මාර්ග ගත සම්බන්ධතාවය)
   වේරහැර කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් හම්බන්තොට, අනුරාධපුර, ගම්පහ, කළුතර, කුරුණෑගල, මොණරාගල, යාපනය හා මහනුවර යන දිස්ත්‍රික් කාර්යාල වල ක්‍රියාත්මක වේ.
2. Off Line (මාර්ගගත නොවන සම්බන්ධතාවය)

අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ දී මෙම ක්‍රමය අනුගමනය කරනු ලබයි.

වේරහැර කාර්යාලයේ රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමට අමතරව හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල වල රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ යන්ත්‍ර ස්ථාපනය කර ඇත.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණයෙන් තවත් ඉදිරි පියවරක් තබමින් රියදුරු බලපත්‍ර ලිඛිත විභාගය පරිගණක ආශ්‍රයෙන් (Touch Screen) ක්‍රියාත්මක කිරීමට අභිනවයෙන් සකස් කළ පරිගණක ආශ්‍රිත ශාලාව සේවාලාභීන් සඳහා 2018 ජුලි 12 දින සිට විවෘත කරන ලදි.

දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා කඩිනමින් ඉටු කිරීමට මෙන්ම වඩා විනිවිද භාවයකින් යුතුව විභාගය පැවැත්වීමට ගත් තවත් එක් ඉදිරි පියවරක් ලෙස මෙය සැලකේ. මෙහිදී අදාළ අපේක්ෂකයා පරිගණක තීරයේ (Touch Screen) හී දිස්වන ප්‍රශ්න වලට පිළිතුරු සැපයු පසු අදාළ කාලය අවසන් වූ වහාම තම ප්‍රතිඵලය පරිගණකය මඟින් ක්ෂණිකව තමාටම දැන ගැනීමට ලැබීම තවත් ඇති සුවිශේෂත්වයකි. ඉදිරියේදී මෙම ක්‍රමය සියලු දිස්ත්‍රික් කාර්යාල වෙතද ලබාදීමට බලාපොරොත්තු වේ.

එමෙන්ම, අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ බාහිර පාර්ශව වෙතින් ඉටු කරවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය හා ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් ඇසෝසියේෂන් ආයතනය විසින් ඉටු කරවා ගැනීමට සුදුසු ක්‍රමවේදය සඳහා වු කෙටුම්පත ඉදිරිපත් කර ඇත.

### 3. වායු විමෝචන තත්ත්වය නියාමන කාර්යය (පරිසරය සුරැකීමේ අරමුණින්)

වායු දූෂණය වළක්වමින් ඒ සඳහා දායකවන වාහන වලින් පිටවන දුම පාලනය කිරීමේ පරමාර්ථයෙන් 2008 ජනවාරි මස 25වන දින නිකුත් කරන ලද අංක 1533/17 දරණ අති විශේෂ ගැසට් නියෝගයත්, 2009 අංක 08 මෝටර් වාහන (සංශෝධන) පනත හා අංක 1557/14 ජාතික පරිසර (වායු විමෝචන ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති ) අති විශේෂ ගැසට්පත්‍රය අනුව 2008 නොවැම්බර් මස 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි වායු විමෝචන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදි. එසේම නව ප්‍රමිතීන් 2014.11.05 දින ප්‍රකාශයට පත් කර ඇති අතර එම ප්‍රමිතීන් 2016 සැප්තැම්බර් 15 වන දින සිට ක්‍රියාත්මක කර ඇති අතර පුවත්පත් දැන්වීම් හා ප්‍රජා දැනුවත් කිරීම් සිදු කරන ලදී.

එසේම ජංගම වායු තත්ත්ව පරික්ෂා කිරීමට උපකරණ ප්‍රසම්පාදන කිරීමට ද කටයුතු යොදා ඇති අතර පේරාදෙණිය හා මොරටුව විශ්ව විද්‍යාල හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සමඟ වායු තත්ත්වය මැනීමේ හා අදාළ වන පර්යේෂණ කටයුතු සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාහන පරික්ෂාව සඳහා දුම් පරීක්ෂණ උපකරණ 10ක් ප්‍රසම්පාදනය කර ඇති අතර, එම උපකරණ බෙදා දීමත් එම පරීක්ෂණ දත්ත ජාල ගත කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට හා සුදුසු ඩිපෝ ස්ථාන හා එම ක්‍රියාවලිය කිරීමට සුදුසු නිලධාරින් පුහුණු කිරීමටද කටයුතු යොදා ඇත.

මාර්ගයේ ධාවනය වන වාහන පරීක්ෂා කිරීම සඳහා කණ්ඩායම් වශයෙන් මාර්ගස්ථ පරීක්ෂාවන් හා ස්ථානීය පරීක්ෂාවන් සිදු කරයි. එහිදි මාර්ගස්ථ පරීක්ෂාවන් 4,518 ක් මේ වසරේ ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා සිදු කර ඇත. එම කාලපරිච්ඡේදය තුළ දුම් සහිත වාහන 1,834ක් හඳුනාගත් අතර එම වාහන අයිතිකරුවන්ව දැනුවත් කර එම වාහන පරීක්ෂා කිරීමට කටයුතු යොදන ලදී. එමෙන්ම, ස්ථානීය දුම් පරීක්ෂාවන් 3,015ක් මෙම කාලපරිච්ඡේදය තුළ සිදු කර ඇත.

ඊට අමතරව වායු විමෝචන පරීක්ෂණ දත්ත කළමනාකරණය සඳහා online දත්ත එකතු කිරීමේ පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු යොදා ඇති අතර එම දත්ත වලින් e - revenue license ලබා ගැනිමේ හැකියාව ලැබී ඇත. තවද, 2018.01.01 දින සිට 2018.12.31 දින වන විට ක්ලින්කෝ ලංකා හා ලාෆ්කෝ ශ්‍රී ආයතන දෙක මඟින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන අංශයේ නියාමනය යටතේ මධ්‍යස්ථාන 431 ක දුම් පරීක්ෂණ කටයුතු සිදු කරයි.

එමෙන්ම, සංසරණ වායු තත්ත්ව පරීක්ෂා කිරීම සඳහා උපකරණ ප්‍රසම්පාදනය අවසන් කර ඇති අතර, එම වායු තත්ත්ව මැනීමේ ස්ථිර මධ්‍යස්ථාන දෙක මධ්‍යම පරිසර අධිකාරියේ පරිශ්‍රය තුළ හා මහනුවර නගරයේ ස්ථාපිත කර ඇති අතර, ජංගම ඒකකයද වායු තත්ත්ව මැනීම සඳහා සකස් කර ඇත. එම උපකරණ වලින් වායු තත්ත්වය මැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත එම උපකරණ විධිමත් පරිදි භාරදීම සඳහා කටයුතු කරගෙන යමින් පවතී. මෙම උපකරණ වලින් ලබාගන්නා ලද දත්ත වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩ සටහනෙහි ප්‍රතිඵල අධ්‍යයනය කිරීම සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

### 4. මාර්ග ආරක්ෂාව පිළිබඳ කාර්යයන්

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට අමතරව මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා බාහිර ආයතන සමඟ ඒකාබද්ධව මේ වන විට වැඩසටහන් රාශියක් සාර්ථකව පවත්වා ඇත.

## 2.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

### 2.3.1 රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම

2017 අංක 18 දරණ මෝටර් වාහන (සංශෝධන) පනත මඟින් රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමයේ නම "රියදුරු අවාසි සහගත ලකුණු ක්‍රමය" ලෙස සංශෝධනය කිරීම, අනෙකුත් දණ්ඩන වලට අමතරව අවාසිසහගත ලකුණු ඇතුලත් කිරීමට නියෝග කිරීමේ නිශ්චිත ප්‍රතිපාදන ගරු මහේස්ත්‍රාත්වරුන් වෙත ලබාදීම හා අවාසිසහගත ලකුණු ඇතුළත් කිරීමේ බලය පොලිස්පති හරහා පොලිස් නිලධාරීන් වෙත ලබාදීමට හැකිවන පරිදි මෝටර් වාහන පනතේ 133 "අ" සහ "ආ" වගන්ති සංශෝධනය කර ඇත.

රියදුරු අවාසි සහගත ලකුණු ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා පොලිසියට එම ලකුණු ඇතුළත් කළ හැකි වන පරිදි අදාළ පරිගණක වැඩසටහන් සකස් කර ගැනීමට සිදුවේ. මේ සම්බන්ධව මත්ද්‍රව්‍ය පාලනය හා අනතුරු අවම කිරීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සාකච්ඡා වලදීද විමසීමට ලක්වන අතර, ඒ සම්බන්ධව වගකිව යුතු පාර්ශව වල සහභාගිත්වයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2018.12.07 දින පැවැති සාකච්ඡාවේදී එළඹි තීරණ ප්‍රකාරව "රථ වාහන වැරදි සම්බන්ධ දත්ත හා තොරතුරු කළමනාකරණය, ක්ෂණික දඩ මුදල් එකතු කිරීම හා රියදුරු අවාසි සහගත ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරිම සඳහා පුළුල් ඒකාබද්ධ ඉලෙක්ට්‍රෝනික විසඳුමක් ක්‍රියාත්මක කිරීම" මැයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ගොනු කිරිමට නියමිත බව වාර්තා විය. එමෙන්ම එම ක්‍රමවේදයට අනුකූලව අවාසි සහගත ලකුණු ඇතුළත් කිරීම හා සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා 1726/12 හා 2011.01.05

දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රියදුරු අභිවෘද්ධි ලකුණු නියෝග සංශෝධනය කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යංශය, මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් මූලික සාකච්ඡාවක් සිදුකර මූලික කෙටුම්පතක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

### 2.3.2. ඉ - මෝටරින් ව්‍යාපෘතිය

වාහන ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගනිමින් වඩාත් කඩිනම් සේවාවක් සැපයීම මෙම ඉ-මෝටරින් ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. මීට අදාළ ක්‍රියාවලිය ප්‍රති නිර්මාණය කිරීමේ වැඩසටහනක් (Business process Re-engineering - BPR) සම්පූර්ණ කරන ලද අතර, එහිදී හඳුනාගත් නව ක්‍රියාවලීන්ට අනුව ඉ-මෝටරින් ව්‍යාපෘතිය නිර්මාණය කිරිමට නියමිතයි.

ප්‍රති නිර්මාණය කළ නව ක්‍රියාවලින් පහත පරිදි වේ.
1. වාහන ආනයන කරුවන්, වාහන නිෂ්පාදකයන් හා වාහන ලියාපදිංචිය
2. වාහනයේ පළමු අයිතිකරු ලියාපදිංචිය
3. වාහනයේ අයිතිය වෙනස් කිරිම හා වාහනයේ අනිකුත් වෙනස් කිරීම් ලියාපදිංචිය
4. වාහන බදු එකතු කරන ආයතන හා සේවාවන් සපයන්නන් මෙහෙයවීම
5. පැමිණිලි විමර්ශන හා විරෝධතා මෙහෙයවීමේ ක්‍රියාවලිය
6. ලේඛන කළමනාකරණ ක්‍රියාවලිය

මීට අදාළ කටයුතු දැනටමත් ආරම්භ කර ක්‍රියාත්මක කර ඇති අතර, 2018.05.20 දින ව්‍යාපෘතිය තෝරා ගන්නා ලද මෙට්‍රොපොලිටන් ඇඩ්වාන්ස් ටෙක්නොලොජි පුද්ගලික සමාගමට ලබාදීම සඳහා කැබිනට් අනුමැතිය ලද අතර, තෝරා ගත් සමාගම වෙත ව්‍යාපෘති ප්‍රදාන පත්‍රය (Award Letter) 2018.05.31 දින නිකුත් කරන ලදි. එමෙන්ම මේ වනවිට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇත.

2018 අගෝස්තු 15 දින සිට දෙපාර්තමේන්තු නිලධාරින් හා මෙට්‍රොපොලිටන් ආයතනයෙහි පද්ධතිය සංවර්ධනය කරන නිලධාරින් අතර, BPR (Business Process Reengineering) අනුව නව මෘදුකාංග පද්ධතිය සකස් විය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා පැවැත්වුණි. BPR අනුව නව මෘදුකාංග පද්ධතියේ සියලු ක්‍රියාවලීන් කොටස් 6කට බෙදා ඇති බැවින්, ඒ එක් එක් කොටස සංවර්ධනය කිරීමට අවශ්‍ය කරුණු හා පැහැදිලි කිරීම් දෙපාර්තමේන්තු නිලධාරින් මඟින් මෙට්‍රොපොලිටන් නිලධාරින් වෙත ලබා දී ඇත.

## 2.4 අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය

- **වේරහැර උප කාර්යාලයේ ඉදි කිරීම් කටයුතු**

රියදුරු පුහුණු ධාවන පථයේ ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇති අතර එහි පිටත ආරක්ෂක කැමරා පද්ධති (CCTV Camera) සහ ප්‍රධාන පාලක මැදිරිය සකස් කර ඇත.

- **වේරහැර ලේඛනාගාරය තුළ නවීන පහසුකම් සහිත රාක්ක සවි කිරීම**

ඉදිකරන ලද ලේඛනාගාරය තුළ නවීන පහසුකම් සහිත රාක්ක සවි කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර බහාලුම් වල තැන්පත් කර ඇති ලිපිගොනු පහසුවෙන් සොයා ගැනීමට හැකිවන අයුරින් අංක යොදා සකස් කර ඇති රාක්ක මතට ලිපිගොනු ඇසිරීම මේ වන විටත් සිදු කෙරෙමින් පවතී.

- **දිස්ත්‍රික් කාර්යාලවල ඉදි කිරීම් කටයුතු**

දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මගින් මූලික වශයෙන් රියදුරු බලපත්‍රය සඳහා අයදුම්පත් භාර ගැනීම, බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සිදු කරනු ලබයි. කුරුණෑගල, ගම්පහ, කළුතර, හම්බන්තොට, අනුරාධපුරය, මොණරාගල, යාපනය හා මහනුවර යන දිස්ත්‍රික් කාර්යාල මගින් Online පහසුකම් යටතේ රියදුරු බලපත් නිකුත් කිරීම සම්බන්ධ කටයුතු ද සිදු කරනු ලබයි. අනිකුත් දිස්ත්‍රික් කාර්යාල රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ දී Offline ක්‍රමය අනුගමනය කරනු ලබයි.

- **නිල මෙහෙවර ජනපති ජනතා සේවය යටතේ දෙපාර්තමේන්තුවේ දායකත්වය**

නිල මෙහෙවර ජනපති ජනතා සේවය යටතේ උතුරු පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් ජංගම සේවා රාශියක් පවත්වා ඇත.
එසේම මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් මොණරාගල දි පවත්වන්නට යෙදුනු V 2025 Enterprises Sri Lanka ප්‍රදර්ශනය සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටියක්ද පවත්වන ලදි.

- **මානව සම්පත් කළමනාකරණය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

දෙපාර්තමේන්තුව තුළ සේවය කරනු ලබන සේවකයින්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව සඳහා සේවක අභිප්‍රේරණය මනා දායකත්වයක් සපයනු ලබයි. දෙපාර්තමේන්තුව ඵලදායිතාව කරා යනු ලැබූ ගමනේ දී සේවක අභිප්‍රේරණය මනා අඩිතාලමක් විය. මේ සඳහා රු.මි. 2 ක ප්‍රතිපාදන මෙම වර්ෂය සඳහා ලැබී ඇති අතර, 2018.12.31 දින වන විට රු. මි. 1.85 ක් වැය වී ඇත. මේ සඳහා නිළධාරීන් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් හා බාහිර ක්‍රියාකාරකම් සහිත පුහුණු වැඩමුළු සඳහා යොමු කර ඇත. ඒ අනුව දෙසැම්බර් මස අවසන් වන විට විදේශීය පුහුණු සඳහා නිලධාරීන් 04 දෙනෙකු සඳහාද, ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන කාර්යාල කාර්ය සහයක සහ රියදුරු මහතුන් 90 ක් වෙනුවෙන් බත්තරමුල්ල ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේදී පවත්වන ලදි.

තවද, සංවර්ධන නිලධාරීන් හා දෙපාර්තමේන්තු ලිපිකරුවන් 100 දෙනෙකු වෙනුවෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා උපකාරක වැඩමුළු පවත්වා ඇත.

රියදුරු උපදේශකයින් 350 දෙනෙකු ලියාපදිංචි කිරීම සඳහා මසක් පුරා වේරහැර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු කාර්යාල පරිශ්‍රයේ පුහුණු වැඩමුළුවක් පවත්වා ඇත.

නිපුණතා සංවර්ධන අධිකාරිය මගින් පවත්වන්නට යෙදුණු ආයතන සංග්‍රහයේ විධිවිධාන පටිපාටික රීති පිළිබඳ දැනුම පිළිබඳ පාඨමාලාවට මෙන්ම ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් පවත්වන්නට යෙදුණ දෙමළ භාෂා පුහුණු පාඨමාලාව වෙනුවෙන්ද නිලධාරීන් සහභාගි කරවා ඇත. තවද, "How to keep your start happy යන තේමාව යටතේ Colombo School of Business Management ආයතනයේ වැඩමුළුවක් පවත්වන්නටද යෙදුණි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන (SLIDA) ආයතනයේදී දෙපාර්තමේන්තු නිලධාරීන් 200 දෙනෙකු වෙනුවෙන් රාජකාරි කටයුතු ඉටු කිරිමේදී, එකී නීතිමය පරිසරය තාක්ෂණික දැනුම හා ආකල්ප වර්ධනය ඇති කිරීමේ අරමුණු ඇතිව විගණන පනත පිළිබඳව හා අල්ලස් දූෂණ පනතේ විධිවිධානයන්ට අදාළ වන පරිදි වැඩමුළුවක් පැවැත්වුණි.

## 2.5 2018 වර්ෂයේ කාර්යසාධනය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දැනට ක්‍රියාත්මක කාර්යයන්හි වර්තමාන ප්‍රගතිය

- **මෝටර් වාහන පනත සංශෝධනය කිරීම.**

මෝටර් වාහන පනතේ කඩිනමින් සංශෝධනය කළ යුතු බවට හඳුනාගන්නා ලද සංශෝධන ඇතුළත් පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර 2017.10.03 දින අනුමත කර ඇත. එය 2017 අංක 18 දරණ මෝටර් වාහන ( සංශෝධන) පනත වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.
මෝටර් වාහන පනත යටතේ රථ වාහන වැරදි සඳහා දඩ මුදල් සංශෝධනය යටතේ මෝටර් වාහන පනතට සිදු කළ යුතු සංශෝධන පිළිබඳව පනතේ 4 වන ඡේදය යටතේ ප්‍රගතිය වාර්තා කර ඇත.

- **නව මාර්ග සංඥා හඳුන්වා දීම.**

2015.11.12 දින හා අංක 1940/21 දරන 2015 අංක 02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති මෝටර් වාහන ( සළකුණු සංඥා, සංකේත හා මාර්ග ලකුණු කිරීම්) නියෝග මඟින් නව මාර්ග සංඥා ප්‍රකාශයට පත් කර ඇත. ඉන් අනතුරුව ඒ සම්බන්ධ සංශෝධන ඉදිරිපත් වී නොමැත.

- **මෝටර් වාහන පනත යටතේ රථ වාහන වැරදි සඳහා අදාළ දඩ මුදල් සංශෝධනය**

මෝටර් වාහන පනත යටතේ දඩ මුදල් සංශෝධනය සම්බන්ධව පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීමට අතිගරු ජනාධිපතිතුමා පත් කළ කමිටුවේ නිර්දේශ වලට අනුකූලව හා ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඒ සම්බන්ධව ලබා ගෙන ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතියන්ට අනුකූලව කටයුතු කරමින්,

I. 2017 අංක 18 දරණ මෝටර් වාහන (සංශෝධන) පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව II වන උපලේඛනගත වැරදි සඳහා ස්ථානීය දඩ මුදල් 2018.01.15 දිනැති හා අංක 2054/9 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති 2018 අංක 01 දරණ ස්ථානීය දඩ නියෝග මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර, එම නියෝග උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සහා සම්මත කර ඇත.

II. ඉහත කී කමිටු නිර්දේශ හා අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව මෝටර් වාහන පනත යටතේ වන බරපතල වැරදි සඳහා වන දඩ මුදල් සංශෝධනය සඳහා වන පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව හරහා සකස් කර ගරු නීතිපතිතුමාගේ අනුකූලතා සහතිකය ලබාදීමේදී වාර්තා කර ඇති සංශෝධන පිළිබඳව පැහැදිලි කිරීමක් ගරු නීතිපතිතුමාට යොමු කර ඇත. ඒ අනුව අදාළ අනුකූලතා සහතිකය ගරු නීතිපතිතුමාගෙන් ලබාගැනීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කළයුතු අතර, එම අනුමැතිය ලබාගෙන උත්තරීතර පාර්ලිමේන්තුවට යොමු කළ යුතුව ඇත.

## 2.6 2018 වසර සඳහා ඇස්තමේන්තු කළ ආදායම හා තත්‍ය ආදායම

| ආදායම් විස්තරය/ ආදායම් ශීර්ෂය | 2018 ඇස්තමේන්තුගත ආදායම රු.මි. | 2017.12.31දිනට තත්‍ය ආදායම රු.මි. | 2018.12.31දිනට තත්‍ය ආදායම රු.මි. |
|---|---|---|---|
| සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද | 1,600.00 | 1,286.9 | 1,036 |
| මෝටර් වාහන විකිණීම මත බදු | 80.00 | 69.5 | 93.2 |
| මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු | 9,800.00 | 9,171.9 | 10,432.6 |
| තීරුබදු සහන බලපත්‍ර යටතේ අය කරනු ලබන බද්ද | 100.00 | 132.6 | 40 |
| මුළු ආදායම | 11,580.00 | 10,660.9 | 11,601.8 |

මුලාශ්‍රය. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

වියදම

| වියදම් විස්තරය / වියදම් ශීර්ෂය | 2018 ඇස්තමේන්තුගත වියදම රු.මි. | 2017.12.31 දිනට තත්‍ය වියදම රු.මි. | 2018.12.31 දිනට තත්‍ය වියදම රු.මි. |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම | 2,142.7 | 1,968 | 2,100.2 |
| ප්‍රාග්ධන වියදම | 1,189 | 1,218.7 | 1,182.6 |
| මුළු වියදම | 3.331.7 | 3,186.7 | 3,282.8 |

## 2.7 2019 වර්ෂයේ අපේක්ෂාවන්

- දැනට මාර්ගගත සබඳතාව නැති දිස්ත්‍රික් කාර්යාල සඳහා මාර්ගගත සබඳතාව ලබා දීම සහ නවීකරණ සිදු කිරීම
- මහනුවර, මොණරාගල, අම්පාර හා බදුල්ල දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මීගහකිවුල ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයේ ආදර්ශ රියදුරු පුහුණු ධාවන පථයක් හා නවීන පහසුකම් වලින් යුත් පුහුණු මධ්‍යස්ථානයක් ඉදි කිරීම
- ඉ- මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- ව්‍යාපෘතියට අදාළ මෘදුකාංග වෙබ් අඩවි සංවර්ධනය කිරීම, දෘඩාංග අනෙකුත් ජීවමිතික උපකරණ (Biometric Accessories) හා පරිගණක යන්ත්‍ර ස්ථාපනය කිරීමද ඒ සමඟ ඉ-මෝටරින් වන දෙපාර්තමේන්තුවේ නව අංශ ආරම්භ කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- ගම්පහ, කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාල සඳහා ආදර්ශ රියදුරු පුහුණු ධාවන පථ සකස් කිරීම

සියලුම දිස්ත්‍රික් කාර්යාල මාර්ගගත (online) සම්බන්ධතාව මඟින් නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ වීමෙන් ග්‍රාමීය/ප්‍රාදේශීය මට්ටමේ සේවාලාභීන්ගේ අපේක්ෂාවන්/අවශ්‍යතා කඩිනමින් ඉටු කිරීමත් නවීන පහසුකම් සහ නව තාක්ෂණය තුළින් සේවාලාභී අපේක්ෂාවන් වඩා පහසුකරලීමත් දෙපාර්තමේන්තුවේ ඉදිරි අභිලාෂයන් වේ.

# 3.

# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

## 3.1 හැඳින්වීම

1957 වර්ෂයේ අංක 48 දරණ මෝටර් ගමනාගමන පනත යටතේ එවකට පැවති බස් සමාගම් ජන සතු කරමින් 1958 වර්ෂයේ ජනවාරි පළමු දින ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවිය. අනතුරුව විවිධ පරිවර්තනයන්ට ලක්වීමෙන් පසු 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත මඟින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවන ලදී.

**දැක්ම**

"කලාපයේ විශිෂ්ටතම මඟි ප්‍රවාහකයා."

**මෙහෙවර**

"මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායි, සුවපහසු මාර්ගස්ථ මඟි ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්ය මණ්ඩලයක් මඟින් ආයතනයේ සියලුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම"

## 3.2 2018 වර්ෂයේ බස්රථ ධාවනය තුළින් ලබා ගෙන ඇති ප්‍රගතිය

පසුගිය මාස කිහිපය තුළ ධාවනයට සැපයූ සාමාන්‍ය බස්රථ ප්‍රමාණය බස්රථ 5,963 ට වඩා වැඩියෙන් පවත්වාගෙන යාම සිදුකර ඇති අතර පවතින රථ ඇණිය උපයෝගි කරගනිමින් මෙම තත්ත්වය පවත්වාගෙන යාමට සමත්ව ඇත. මෙම බස්රථ ඇණිය සඳහා නව බස් රථ එක්වීමේ ප්‍රවනතාවය අඩු වී ඇති බැවින් පැරණි බස්රථ ගර්භිත කිරීමද සිදුකර ඇති අතර පවතින බස්රථ මේ අයුරින් ධාවනයට ලබාදීමට  සිදුව ඇත.

2018 වර්ෂයේ සාමාන්‍යයෙන් දිනකට බස් රථ 5,242 කට වඩා ධාවනය කළ අතර, එය ධාවනයට ලබා දෙන බස් ප්‍රමාණයෙන් 88% ක ප්‍රමාණයක රඳවා ගැනිමට අප සමත් වී ඇත.

2018 වර්ෂයේ බස්රථ 5,242 ක් පමණ යොදා ගනිමින් කිලෝමීටර් මිලියන 446 ක්  ධාවනය කළ අතර, එය දිනකට කිලෝමීටර් මිලියන 1.2 ක ප්‍රමාණයකි. ඒ අනුව අපගේ බස් රථයක් දිනක් තුළ  කිලෝමීටර් 228 ක් පමණ ධාවනය වී ඇත.

2018 වර්ෂය තුළ ශ්‍රී ලංගම තම ප්‍රධාන ආදායම් මාර්ගය වන මාර්ග ලේඛණ ආදායම වශයෙන් රු. මි. 29,169 ක මුදලක් උපයා ඇත. ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය හා සැසඳීමේදී එම ප්‍රමාණය කිලෝමීටරයකට රු. 65.36 කට ආසන්න වේ.

2018 වර්ෂයේ ශ්‍රී ලංගම බස්රථ වල මගීන් මිලියන 993 ක ප්‍රමාණයක් ගමන් කර ඇති අතර, ඒ තුළ සාමාන්‍ය  ප්‍රවේශපත්‍ර  යටතේ මගීන් මිලියන 720 ක් ද වාර ප්‍රවේශපත්‍ර. යටතේ මගීන් මිලියන 230 ක් ද නිදහස් ගමන් බලපත්‍ර  යටතේ මගීන් මිලියන 41 ක් ද ගමන් කර ඇත.

## 3.3 සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය

- **අලුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන් වාර ධාවනය**

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි අලුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන් වාර සැපයීම තුළින් රටේ ආර්ථිකයේ ශ්‍රම බලකාය සංචලනයට දායක වන නමුත් මෙම සේවාව මඟින් ශ්‍රී ලංගමයට අතීතයේ සිට හිමිව ඇති ලාභයක් නොමැති තරම් වේ. නමුත් ශ්‍රී ලංගම සිදුකරනු ලබන තවත් සමාජයීය වගකීමක් ලෙස සලකා මෙම සේවා වර්තමානයේද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

- **ග්‍රාමීය ප්‍රදේශවල බස්රථ ධාවනය**

ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීම සඳහා ගම හා නගරය යාකිරීමේ ප්‍රබලතම ගමනාගමන මාධ්‍ය ලෙස ක්‍රියාත්මක වන සේවාද අලාභදායි තත්ත්වයන් යටතේ සිදු කරයි. ඒ අනුව කුඩා බස් උපයෝගි කරගනිමින් ග්‍රාමීය මාර්ග සේවා තරකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. තවදුරටත් මෙම කුඩා බස්රථ මිලට ගනිමින් මෙම සේවාව තර කිරීමට පියවර ගනිමින් සිටිනුයේ එය මේ රටේ ග්‍රාමීය ආර්ථිකයේ ස්වාධීනත්වයට අත්‍යාවශ්‍ය සේවාවක් බැවිනි.

- **පාසැල් සේවා බස්රථ ධාවනය**

ශ්‍රී ලංගම සතුව ඇති සීමිත බස් රථ ඇණිය තුළ වැඩි ඉඩකඩක් දැයේ අනාගත පරපුර වන පාසල් සිසු දරු දැරියන් නියමිත වේලාවට පාසලට ගෙන යාම සහ නිවසට ගෙන ඒම සඳහා වෙන් කර ඇති අතර මේ සඳහා ආසන්න වශයෙන් බස් රථ 3,000 ක් පමණ දිවයින පුරාවට මෙම රාජකාරියේ දෛනිකව නිරතවේ. මෙයට අමතරව සිසුසැරිය ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංගම බස්රථ 744 ක් ධාවනයට යොමුකර ඇත.

- **වාර ප්‍රවේශ පත්‍ර හා නිදහස් ගමන් පත්‍ර සේවා**

පාසැල්, විශ්ව විද්‍යාල හා වැඩිහිටි වශයෙන් වෙන් කරමින් විවිධ මට්ටම් තුළින් ප්‍රවාහන අවශ්‍යතා ලබා දීමට ශ්‍රී ලංගම ගෙන ඇති ක්‍රියා මාර්ග මඟින් රටේ සිටින මගී ජනතාවට ආර්ථික වශයෙන් සහන සැලසීම සිදුකරයි. ඒ අනුව 2018 වර්ෂය තුළ පමණක් මෙම පහසුකම් භාවිතා කර මගීන් මිලියන 230 ක් පමණ ශ්‍රී ලංගම බස් රථ වල ගමන් කර ඇත.

- **ජාතික උත්සව අවස්ථා හා විශේෂ තත්වයන් යටතේ සිදුකරනු ලබන බස්රථ ධාවනය**

2018 වර්ෂය තුළත් සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය, වෙසක් හා පොසොන් උත්සවය, මහනුවර හා කතරගම ඇසළ පෙරහැර උත්සවය, වාර්ෂික මඩු හා තලවිල මංගල්‍යයය, ශ්‍රී පාද වන්දනා සමය වැනි ආගමික වශයෙන් වැදගත් දිනයන් සඳහා විශේෂ බස් රථ සේවා ද ශ්‍රී ලංගමය මඟින් සිදු කරයි. මෙයට අමතරව පාර්ලිමේන්තු සේවකයින්ගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර දීම, විශ්ව විද්‍යාල සිසුන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම, මහරගම පිළිකා රෝහල ආශ්‍රිත ප්‍රවාහන පහසුකම් සැපයිම, ත්‍රිවිධ හමුදාව සඳහා ප්‍රවාහන පහසුකම් සැපයිම, ජාතික ශිෂ්‍ය බට බලකාය සඳහා ප්‍රවාහන පහසුකම් සැපයිම, කාර්යාල සේවා ආශ්‍රිත ප්‍රවාහන පහසුකම් සැපයිම ආදීය ද ජාතික උත්සව සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයිම ද ශ්‍රී ලංගම මඟින් සිදුකරනු ලබයි.

- **අධිවේගී මාර්ග මෙහෙයුම් විස්තරය**

ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතියට අලුතින් හඳුන්වා දුන් අධිවේගී මාර්ග පද්ධතිය තුළ ධාවනය කිරීමට නිර්දේශිත බස්රථ යොදා ගනිමින් මගී ප්‍රවාහන කටයුතුවල නියැලීමට ශ්‍රී ලංගමය සමත් වී ඇත. ඒ අනුව වර්තමානයේ ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග පද්ධතිය හරහා ගමන් කරනු ලබන ශ්‍රී ලංගම සුඛෝපභෝගී බස්රථ පද්ධතිය නවීන ලෝකයට ගැළපෙන පරිදි සකස් වී ඇත. ඒ අනුව වර්තමානයේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ බස්රථ 63 ක් හා අතිරේක බස්රථ 15 ක්ද, ඒසේම කටුනායක අධිවේගී මාර්ගයේ බස්රථ 31 ක් හා අතිරේක බස්රථ 07 ක්ද ධාවනය වේ.

- **ශ්‍රී ලංගම හා දුම්රිය ඒකාබද්ධ සේවය**

දුර බැහැර සිට දුම්රිය මඟින් පැමිණෙන මගීන් හා රාජකාරී කටයුතු අවසන් කර දුම්රියෙන් ගමන් ගන්නා මගීන් දුම්රිය ස්ථානයේ සිට ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංගම හා දුම්රිය අතර ඒකාබද්ධ සේවා ක්‍රියාත්මක වන අතර, ඒ අනුව කොළඹ නගරය මූලික කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇති අතර බස්රථ 55 ක් මේ සඳහා යොදා ගෙන ඇත.

- **ශ්‍රී ලංගම හා පෞද්ගලික ප්‍රවාහන ඒකාබද්ධ සේවා**

ගමන් වාර ධාවනය කිරීමේදී ශ්‍රී ලංගමත් පෞද්ගලික අංශයත් ඒකාබද්ධ වෙමින් මගී ප්‍රවාහන කටයුතු සිදු කරන අතර වර්තමානය වනවිට ප්‍රාදේශිකයන් 11 ක් තුළ ඒකාබද්ධ සේවා 770 ක් දියත් කර ඇත.

- **සමාන්තර මගී සේවා හදිසි බිඳ වැටීම් වලදී ශ්‍රී ලංගම සේවා**

සමාන්තර ප්‍රවාහන සේවාවන්හි විටින් විට සිදුවන විවිධ අඩපණ වීම් තුළ අපහසුතාවයට පත් වන මගී ජනතාවට විශේෂ සහන සේවා සපයන්නේ ද ශ්‍රී ලංගමයයි. මේ යටතේ ශ්‍රී ලංගම සතුව ඇති රථ ඇණිය ගමේත් නගරයේත් ධාවනය කරමින් විවිධ අවස්ථා වලදී මගී ජනතාවට සහන සලසා ඇත.

## 3.4 මෙහෙයුම් තත්ත්වය

2018 වර්ෂය ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංගම මඟින් මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමේදී විවිධ දුෂ්කරතා හා බාධක රාශියක් පැවතියද පවතින රථ ඇණිය උපයෝගී කරගනිමින් හැකි උපරිම සේවාවක් ගමත් නගරයත් තුළ සිදුකිරීමට කටයුතු කර ඇත. ඒ අනුව පසුගිය මාස කිහිපය තුළ සාමාන්‍ය වශයෙන් පවත්වාගෙන ගිය ධාවන තත්වයන් පහත පරිදි වේ.

| 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා | | | |
|---|---|---|---|
| දිනකට ධාවනයට ලබාදී ඇති බස් රථ ගණන | 5,963 | | |
| දිනකට ධාවනය කල බස් රථ ගණන | 5,242 | | |
| ධාවනය කල කිලෝ මීටර් ගණන | 446,287,644 | | |
| | මුළු එකතුව (රු.මි.) | මසකට (රු.මි.) | කිලෝමීටරයකට (රු.මි.) |
| මාර්ග ලේඛණ ආදායම | 29,169 | 2,431 | 65.36 |
| මුළු ආදායම රු. | 44,103 | 3,675 | 98.82 |

## 3.5 2018 වර්ෂය තුළදී සේවා සැපයුම වර්ධනය කර ගැනිම සඳහා උපයෝගී කරගත් නව ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග

- **බස්රථ 2,200 යේ ව්‍යාපෘතිය**

පැවති බස්රථ ඇණිය නගා සිටුවීම සඳහා 2014 වර්ෂයේ බස්රථ 2,200 ක් වාරික ගෙවීමේ පදනම මත මිලදී ගත් අතර, ඒ සඳහා 2014 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් මස දක්වා රු.මි. 9,414.00 ක් මුළු මුදල වශයෙන් ගෙවා ඇත. එයින් රු.මි. 3,994.05 භාණ්ඩාගාර මුදල් වන අතර, රු.මි. 5,419.95 ක මුදලක් ශ්‍රී ලංගම මඟින් උපයාගත් මුදල් වලින් ගෙවා ඇත.

## 3.6 මූල්‍ය ප්‍රගතිය

2018 වර්ෂය ආරම්භයේ සිට දෙසැම්බර් මස අවසන් වන විට ශ්‍රී ලංගම මඟින් මුළු ආදායම වශයෙන් රු. මි. 44,103 ක මුදලක් උපයාගෙන ඇති අතර, ඒ තුළ ප්‍රධානම ආදායම් මාර්ගය වන මාර්ග ලේඛණ ආදායම මඟින් රු. මි. 29,169 ක මුදලක් උපයාගෙන ඇත. එය සමස්ත ආදායමෙන් 66% ක ප්‍රමාණයකි. කිලෝමීටරයට මුළු ආදායම රු. 98.82 ක් වන විට ඒ තුළ මාර්ග ලේඛණ ආදායම රු. 65.36 ක මට්ටමක රඳවා ගැනිමට සමත් වි ඇත. මාර්ග ලේඛණ ආදායමෙන් පසු ප්‍රධානතම ආදායම් මාර්ගය වන වාර ප්‍රවේශපත්‍ර අලෙවිය තුළින් රු. මි. 1,048 ක මුදලක් උපයාගෙන ඇති අතර, ඒ වෙනුවෙන් වාර ප්‍රවේශපත්‍ර ප්‍රතිපූර්ණය කිරිම් වශයෙන් රු.මි. 5,000 ක් ලබා ගැනිමට කටයුතු කර ඇත. විශේෂ චාරිකා ආදායම වශයෙන් රු.මි. 290 මුදලක් මුළු ආදායම තුළ අන්තර්ගත වේ. පසුගිය මාස 12 තුළ මෙහෙයුම් වියදම සඳහා රු.මි. 22,899 ක මුදල් වැය වු අතර ඒ තුළ වැඩිම වියදම වශයෙන් රු.මි. 14,238 ක මුදල ඉන්ධන සඳහා වැය කර ඇත. පසුගිය මාස 12 තුළ ඉන්ධන මිල විවිධ අවස්ථා වලදි ඉහළයාම හේතුවෙන් ගිය වර්ෂයට සාපේක්ෂව මෙම වසරේ ඉන්ධන සඳහා රු.මි. 1,608 ක මුදලක් අමතරව දැරිමට සිදු වි ඇත.

කෙසේ වෙතත් මෙහෙයුම් වියදම අඩු කල පසු දායකය වශයෙන් රු.මි. 6,269 ක මුදලක් ඉතිරි කර ගත් අතර ඩිපෝ වශයෙන් සැලකිමේදි පවතින සියලුම ඩිපෝ දායකය ධන මට්ටමක පවත්වාගෙන යාම සතුටුදායක කරුණක් වශයෙන් හැඳින්විය හැකිය. ස්ථාවර පිරිවැය සැලකිමේදි මුළු ස්ථාවර පිරිවැය වශයෙන් රු.මි. 17,057 ක මුදලක් දරා ඇති අතර, ඒ තුළ වැඩිම වියදම් වශයෙන් සේවක පඩිනඩි සඳහා දැරු වියදම අන්තර්ගත වේ. එම ප්‍රමාණය රු.මි. 13,242 කි. පසුගිය මාස 12 තුළ ක්ෂය අඩු කිරිමට පෙර රු.මි. 4,146 ක ලාභයක් උපයාගෙන ඇති අතර ක්ෂය අඩු කිරිමට පසු එම ලාභය රු.මි. 2,167 කි.

ඉහත තත්ත්වය යටතේ වර්තමානය වන විට ශ්‍රී ලංගම සතු ප්‍රාදේශිකයන් 12 හි සියලුම ඩිපෝ සඳහා නව වැටුප් ව්‍යුහය හඳුන්වා දීමත් සමඟ දැනට ප්‍රාථමික ශ්‍රේණීන්ට අදාළ වන සේවකයින් 24,300 ක ගේ වැටුප් සකස් කිරිම හේතුවෙන් ඔක්තොම්බර් මස සිට අතිකාල දිමනා සහ ගමන් වියදම් දිමනා වැඩි වී ඇති හෙයින් මෙහෙයුම් වියදම් පසු ගිය මාස කිහිපයට සාපේක්ෂව ඔක්තොම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මස වැඩි වී ඇත.

- **ශ්‍රී ලංගම සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම සම්බන්ධ වර්තමාන තත්ත්වය**

2010 - 2015 කාල පරිච්ඡේදය තුළ සේවක අර්ථසාධක ගෙවීම නිසි පරිදි සිදු නොවී තිබු බැවින් 2015 සැප්තැම්බර් වන විට ගෙවීමට තිබු සේවක අර්ථසාධක වටිනාකම රු.මි. 10,752 ක් වු අතර 2015 සැප්තැම්බර් වලින් පසු අදාළ මුදල් ගෙවීම සඳහා විවිධ වු ක්‍රියාමාර්ග ගන්නා ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2018 දෙසැම්බර් වන විට ගෙවිමට තිබූ හිඟ මුදල රු.මි. 1,894 ක් දක්වා අඩුකර ගැනීමට හැකිවී තිබු අතර මින් රු.මි. 1,000 ක මුදලක් 2019 ජනවාරි මස ගෙවා අවසන් කිරිමට අපේක්ෂාවෙන් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇත. ඉතිරි රු.මි. 894 ක මුදල 2019 මාර්තු අවසන් විමට පෙර ගෙවිමට අපේක්ෂා කෙරේ.

- **ශ්‍රී ලංගම සේවක පාරිතෝෂික ගෙවිම සම්බන්ධ වර්තමාන තත්ත්වය**

2015 වර්ෂයේ සැප්තැම්බර් වන විට ගෙවිමට හිඟව තිබු පාරිතෝෂිත අරමුදලේ වටිනාකම රු.මි. 2,409 ක් හා 2018 වර්ෂයේ දෙසැම්බර් වනවිට ගෙවීමට ඉතිරිව තිබූ හිඟ පාරිතෝෂිත අරමුදලේ වටිනාකම රු.මි. 150 ක් මේ වන විට ගෙවා අවසන් කර ඇත.

## 3.7 2018 වර්ෂය තුළදී බස්රථ ඇණියේ වර්ධනය හා බස්රථ පුනරුත්ථාපනය

දිනකට බස්රථයක් කිලෝමීටර් 228 ක් පමණ ධාවනය වේ. මෙම බස් රථ වල ඇති එන්ජින් හා ගියර් පෙට්ටි සාමාන්‍යයෙන් කිලෝමීටර් 200,000 කින් පමණ අලුත්වැඩියා කළ යුතු තත්ත්වයට පත්වේ. ඒ අනුව දිනකට එන්ජින් 6 ක් හා ගියර් පෙට්ටි 6 ක් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයට පත්වේ.

මෙවැනි තත්ත්වයක් යටතේ වාර්ෂිකව ශ්‍රී ලංගමට එන්ජින් 960 ක් හා ගියර් පෙට්ටි 960 ක් බස් බොඩි 360 ක් ආසන්න අවශ්‍යතාවයක් ඇතිවේ. මෙම අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා ඩිපෝ හා ප්‍රාදේශීය වැඩපොළ මට්ටමෙන් එන්ජින්, ගියර් පෙට්ටි හා බස් බොඩි අලුත්වැඩියා සිදුකරන අතර, මෙයට අමතරව පවතින බස්රථ ඇණිය නඩත්තුව හා පුනරුත්ථාපනය සඳහා 2018 අයවැය ප්‍රතිපාදන මඟින් රු.මි. 1,350 ක මුදලක් භාණ්ඩාගාරය විසින් ලබාදී ඇත. එය උපයෝගී කර ගනිමින්ද එන්ජින්, ගියර් පෙට්ටි, බස් බොඩි හා බස්රථ වල සිදුවන දෛනික අලුත්වැඩියා කටයුතු සිදුකරයි. ඒ සඳහා 2018 වර්ෂයේ දෙසැම්බර් මස වන විට රු.මි. 1,397.46 ක් වැයකර ඇති අතර, සිදුකර ඇති අලුත්වැඩියා ප්‍රමාණය පහත පරිදි වේ.

| වාර්ෂික බස්රථ පුනරුත්තාපන ව්‍යාපෘතිය ( පූර්ණ හා සාමාන්‍ය) ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා | | |
|---|---|---|
| | අපේක්ෂිත | සත්‍ය |
| එන්ජින් | 960 | 815 |
| ගියර් පෙට්ටි | 960 | 1,080 |
| බස් බොඩි | 960 | 422 |

## 3.8 යටිතල පහසුකම්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. මි. 60 ක් වෙන් කර ඇත. සිවිල් ඉංජිනේරු අංශය මඟින් දැනට එම කටයුතු සිදුකරමින් පවතින අතර, මේ යටතේ ශ්‍රී ලංගම සනීපාරක්ෂක සහ අනෙකුත් නඩත්තු කටයුතු සිදු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

- **ශ්‍රී ලංගම සනීපාරක්ෂක සහ අනෙකුත් නඩත්තු කටයුතු සිදු කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංගම සේවා ස්ථානවල සේවක විවේකාගාර, වැසිකිලි, කැසිකිලි, ගොඩනැගිලි, වහලවල්, ඩිපෝ අංගන, කාර්යාල, දැවිතෙල්, කාණු පද්ධතිය, දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන වැනි ස්ථාන කාලාන්තරයක් තුළ සංවර්ධනය නොකර ඇති බැවින් ඒවා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 2018 වර්ෂයේදී ආරම්භ කරන ලදි. ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාගෙන තිබුනද කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංගම සිවිල් ඉංජිනේරු අංශයෙහි පවතින සේවක හිඟය මූලික ගැටලුවක්ව පවතී. කෙසේ වුවද දැනට ඩිපෝ 32 ක කටයුතු නිමකර ඇත.

- **ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම් හල නවීකරණ කටයුතු**

අමතර ආදායම් මාර්ගයක් වශයෙන් ඉන්ධන පිරවුම් හල් පවත්වා ගැනීම සඳහා අවධානය යොමු වී ඇති අතර, ඒ අනුව ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම් හල නැවත ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. ඒ සඳහා රු. මි. 61.10 ක මුදලක් අනුමත වී ඇත.

- **බැහැරගත පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම**

ශ්‍රී ලංගම සඳහා බැහැර ගත පුහුණු මධ්‍යස්ථානයක් කළුතර රියදුරු අභ්‍යාස විද්‍යාලයේ ඉදිකරන ලදි. එය 2018 - 05 - 04 වන දින විවෘත කර දැනට නායකත්ව පුහුණු කටයුතු සිදුකරමින් පවතී.

මෙම ව්‍යාපෘතිය යටතේ දැනට පවතින පහසුකම් වලට අමතරව පුහුණු උපදේශක හා අනෙකුත් අමුත්තන් සඳහා නවීන පන්නයේ කාමර පහසුකම් සහිතව නවාතැන් ගැනිම සඳහා කාමර පහසුකම් 2018 - 10 - 16 වන දින ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් තුමා විසින් විවෘත කරන ලදි.

දැනට රියදුරු අභ්‍යාස විද්‍යාලය පවත්වා ගෙන යනු ලබන ප්‍රධාන ගොඩනැගිල්ලේ කොටසක ප්‍රධාන නේවාසිකාගාරය ද පවත්වා ගෙන යනු ලබයි. රියදුරු අභ්‍යාස විද්‍යාලයේ කටයුතු ද නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය බැවින් නේවාසිකාගාරය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නියමිත අතර ඒ තුළ එකවර සිය දෙනෙකුට නවාතැන් ගෙන පුහුණු වීම සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ඇත.

බැහැරගත පුහුණුව සඳහා එක් අයෙකුට රු. 4,300.00 බැගින් ආයතනය මඟින් වියදම් කරනු ලබන අතර එම වියදම තුළ දින 02 සියලූ ආහාර පාන, ටී ෂර්ට්, බොටම් සඳහා වූ වියදම අන්තර් ගත වී ඇත. ආයතනය තුළ සිටින සමස්ත සේවක සංඛ්‍යාවටම මෙම පුහුණුව ලබාදීම තුළින් ඔවුන්ගේ ආකල්පමය වෙනසක් ඇති කර ආයතනයට ඵලදායි සේවයක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. 2018 වසර තුළ පුද්ගලයින් 4,628 දෙනෙකු පුහුණුව ලබා ඇත.

### 3.9 වෙනත් සංවර්ධන වැඩසටහන්

- **සේවක සංයුතිය හා ව්‍යුහය සැකසීම**

ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වැඩසටහනක් (VRS) මඟින් අතිරික්ත සේවකයින්ට (රියදුරු, කොන්දොස්තර හා කාර්මික හැර) තම කැමැත්ත මත විශ්‍රාම යාමට ඉඩකඩ සලසා ඇත.

2015. 12. 01 දිනට ශ්‍රී ලංගම තුළ 35,952 ක සේවක සංඛ්‍යාවක් සිටි අතර, මෙම ප්‍රමාණය ශ්‍රී ලංගමට දරාගැනීමට නොහැකි සේවක සංඛ්‍යාවක් බැවින් අමාත්‍යාංශයෙහි හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත කැමති සේවකයන්ට ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමට ඉඩ සැලසීණි. මේ අනුව ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනාවලියක් (VRS) හඳුන්වාදුන් අතර, ඒ යටතේ සේවකයින් 4,005 ක් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. 2018. 03. 15 දින වන විට සේවකයින් 3,747 දෙනෙකුට ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමට ඉඩ සලසා දුන් අතර, ඒ අනුව, 2018. 09. 30 දින වන විට ස්ථිර සේවක සංඛ්‍යාව 30,405 ක් දක්වා අඩුකර ගැනීමට හැකියාව ලැබී ඇත.

මෙම ව්‍යාපෘතියට සමගාමීව ශ්‍රී ලංගම නැවත ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර ඒ යටතේ නව සේවක සංයුක්ත සැලැස්මක් සකස් කිරීම, බඳවා ගැනීමේ පටිපාටිය නිවැරදිව සකස් කිරීමේ කටයුතු හා රාජ්‍ය සංස්ථා හා මණ්ඩල වල වැටුප් තල ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය තුළ ද ක්‍රියාත්මක කරමින් පවති.

- **නව වැටුප් ව්‍යුහය හඳුන්වා දීම**

රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලට අදාළ නව වැටුප් චක්‍රලේඛ (30/2006, 30(i)/2006 හා 02/2016) ශ්‍රී ලංගම සේවකයන්ටද අදාළ කර වැටුප් සකස් කිරීමේ වැඩපිළිවෙළ අනුව ප්‍රාථමික ශ්‍රේණීන්ට අදාළ වන සේවකයින් (සේවකයින් 24,300) සඳහා 2018/10/01 දින සිට වැටුප් සකස් කර ඇත.

අනෙකුත් කාර්යාලීය සේවකයින් (සේවකයින් 6,183) සඳහා වැටුප් සකස් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින අතර 2019 වර්ෂයේදී මෙම සංශෝධනය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

- **පරිගණක විද්‍යාව හා ව්‍යාපාර කළමණාකරනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

මෙයට අමතරව ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ හා ඩිපෝ සියල්ලම නව තාක්ෂණය යටතේ කටයුතු මෙහෙයවීමේ අරමුණින් පරිගණක ලබා ගැනීම හා ඒ ආශ්‍රිත සියලූ තාක්ෂණික පහසුකම් ලබා ගැනීම හා ස්ථාපිත කිරිම මේවන විට සිදු කරමින් පවති.

ශ්‍රී ලංගම සේවකයින්ගේ පරිගණක සාක්ෂරතාවය හා කළමණාකරන දැනුම ඉහළ දැම්මේ අරමුණින් මෙම පාඨමාලාව ආරම්භ කළ අතර, දැනට ශ්‍රී ලංගම ඉහළ හා මධ්‍යම කාර්ය මණ්ඩලය වන I ශ්‍රේණියේ සිට VIII ශ්‍රේණීය දක්වා වූ සේවකයින් හට පරිගණක විද්‍යාව හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව පාඨමාලාව සඳහා ශ්‍රී ලංගම සේවකයින් 5,000 පුහුණු කිරීමට අපේක්ෂිත වන අතර වෘත්තීය පුහුණු අධිකාරියට අයත් දිවයින පුරා පිහිටි මධ්‍යස්ථාන වල මාස 06 ක පුහුණුවක් වශයෙන් මෙම පුහුණුව ලබා දීමට නියමිතය. මේ සඳහා එක් සේවකයෙකු වෙනුවෙන් රු. 15,000 ක මුදලක් වියදම් වේ.

දැනට ශ්‍රී ලංගම සේවකයින් හට පරිගණක විද්‍යාව හා ව්‍යාපාර කළමණාකරනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සිදුකරමින් පවතින අතර මේ යටතේ පළමු අදියර යටතේ සේවකයින් 1,554 ක් ශ්‍රී ලංගම මඟින් මුදල් වැය කර වෘත්තීය පුහුණු අධිකාරියේ සම්පත් දායකත්වයෙන් මධ්‍යස්ථාන 63 ක් යටතේ පුහුණු කර පුහුණුව අවසන් කර ඇත. තවද දෙවන අදියර යටතේ මධ්‍යස්ථාන 58 ක් යටතේ සේවකයින් 1,233 ක් පුහුණු පාඨමාලාව සඳහා යොමු කර ඇත.

- **ශ්‍රී ලංගම ඉංජිනේරු අංශයේ සේවය කරන කාර්මික අංශයේ සේවකයින් හට ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය මඟින් පුහුණුවක් ලබා දීමේ ව්‍යාපෘතිය**

දැනට ශ්‍රී ලංගම ඉංජිනේරු අංශයේ නුපුහුණු කාර්මික හැකියාව ඇති සේවකයින්ට ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය තුළ පැය 150 ක පුහුණුවක් ලබා දී ඒ සඳහා සුදුසු සහතික පත්‍රයක් ලබා දෙන අතර මේ වන විට සේවකයින් 40 දෙනෙකු පුහුණුකර අවසන් කර ඇත. නිපුනතා සංවර්ධන අමාත්‍යංශය සහ ශ්‍රී ලංගම එකතු වී මෙම පාඨමාලාව ආරම්භ කර ඇති අතර ඒ සඳහා එක් අයෙකුට රු. 18,750 ක මුදලක් වැය කරනු ලබන අතර මෙයින් 50% ක් නිපුනතා සංවර්ධන අමාත්‍යංශයෙන් ගෙවනු ලබන අතර අනෙක් 50% ශ්‍රී ලංගම මඟින් ගෙවනු ලැබේ.

- **මුදල් කොට්ඨාශයට නව මෘදුකාංග පැකේජයක් හඳුන්වා දිම**

ශ්‍රී ලංගම මුදල් කොට්ඨාශයේ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව කිරිම සඳහා නව මෘදුකාංග පැකේජයක් (Accpac) හඳුන්වා දි ඇත. දැනට සියලූම ඩිපෝ මෙම පැකේජය හරහා ගිණුම් කටයුතු සිදු කරමින් පවති. එසේම ශ්‍රී ලංගම නව වෙබ් අඩවියද 2018.11.01 දින ආරම්භ කරන ලදී.

## 3.10 2018 දෙවන අර්ධ වාර්ෂිකය හා 2019 වර්ෂය තුළ යෝජිත සැලසුම් හා වැඩසටහන්

- **GPS පහසුකම් සවිකිරිමේ ව්‍යාපෘතිය**

සුඛෝපභෝගි බස්රථ 125 ක් සඳහා GPS Tracking Video System සවිකිරිම සඳහා මිල ගණන් කැඳවා අදාළ ව්‍යාපෘතිය බාර දි ඇති අතර, ඒ සඳහා රු. මි. 33.63 ක මුදලක් වැය කිරිමට නියමිතය. එසේම 2014/2015 වර්ෂවල මිලදි ගත් බස්රථ 2,200 න් GPS පහසුකම් නිසි අයුරින් පවත්වා ගැනිම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා අවශ්‍ය උපකරණ වල පිරිවැය පිළිබඳ සමික්ෂණයක් සිදුකරමින් පවති.

- **තාක්ෂණික උපකරණ මිලදි ගැනිමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංගම කටයුතු වඩාත් කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වා ගෙන යාමේ අරමුණින් නවින තාක්ෂණය යොදා ගැනිම සඳහා පහත යන්ත්‍රසූත්‍ර මිලදි ගන්නා ලදී.

**තාක්ෂණික උපකරණ මිලදී ගැනිමේ ව්‍යාපෘතිය - 01**

| වර්ගය | ප්‍රගමාණය | | රු.මි. |
|---|---|---|---|
| පරිගණක | | 200 | 27.49 |
| යූ.පී.එස්. | | 200 | 0.70 |
| ප්‍රින්ටර් | | 100 | 2.94 |
| ෆැක්ස් යන්ත්‍ර | | 50 | 0.74 |
| ලැප්ටොප් පරිගණක | | 50 | 7.75 |
| ඡායා පිටපත් යන්ත්‍ර | N | 50 | 4.10 |
| | H/D | 10 | 2.85 |
| **එකතුව** | | | **46.57** |

**තාක්ෂණික උපකරණ මිලදී ගැනිමේ ව්‍යාපෘතිය - 02**

| වර්ගය | ප්‍රමාණය | රු. මි. |
|---|---|---|
| ප්‍රවේශ පත්‍ර යන්ත්‍ර | 2000 | 75.9 |
| මුදල් ගණන යන්ත්‍ර | 100 | 19.32 |
| පරිගණක | 500 | 81.73 |
| යූ.පි.එස් | 500 | 0.81 |
| ප්‍රින්ටර් | 100 | 3.02 |
| **එකතුව** | | **180.79** |

අංක 02 ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර මිලදි ගැනීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවති.

- **දුම් පරික්ෂණ මධ්‍යස්ථාන පිහිටුවිමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංගම ඩිපෝ මුලික කරගනිමින් පළාත් 09 ක් සඳහා දුම් පරික්ෂණ මධ්‍යස්ථාන 09 ක් ස්ථාපිත කිරිමට යෝජනා කර ඇති අතර, මුලික සිවිල් වැඩ කටයුතු ආරම්භ කර අවශ්‍ය අංගන සැකසිම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට කොන්ත්‍රාත් බාර දි ඇත.

- **පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනිමේ ව්‍යාපෘතිය**

මෙම බලපත්‍රය ලබා ගැනීම සඳහා මුලිකව සිදුකල යුතු සිවිල් කටයුතු මේ වන විට සියලුම ඩිපෝ විසින් ආරම්භ කර ඇති අතර ඩිපෝ 30 ක් මේ සඳහා ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. පරිසර ආරක්ෂණ බලපත්‍ර ඩිපෝ 23 ක් මේ වන විට ලබා ගෙන ඇත.

- **විද්‍යුත් බස්රථ මිලදි ගැනිමේ ව්‍යාපෘතිය**

මෙම විද්‍යුත් බස්රථ මිලදි ගැනීමේ ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කටයුතු අවසන් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු රැස්වීම 2018-09-25 වන දින පැවැත්විණි. ඇක්සස් ඉන්ටර්නැෂනල් හා සතොස මෝටර්ස් ආයතන එක්ව ඉදිරිපත් කළ ලන්සුව අනුව BYD K9 විදුලි බස්රථ 09 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

➢ **ඉන්දියානු ණය ආධාර යටතේ බස්රථ 500ක් මිලදී ගැනීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය මගින් ආසන 50-54 බස්රථ 400 ක් ද, ආසන 32-35 බස්රථ 100 ක් සඳහා කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇති අතර, මෙම ව්‍යාපෘතිය සඳහා බස් රථ මිලදී ගැනීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් හා ඉන්දියානු EXIM බැංකුව මගින් අනුමැතිය ලබා ගෙන ඇති අතර මේ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත.

➢ **ශ්‍රී ලංගම ප්‍රතිපාදනය මගින් බස්රථ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ ආසන 32 - 35 බස් රථ 05 ක්ද ආසන 42 - 54 බස් රථ 14 ක්ද මිලදී ගෙන ඇති අතර ආසන 51 සුඛෝපභෝගී බස් රථ 09 ක් හා වමෙන් පදවන බස් රථ 02 ක් මිලදී ගැනීමට නියමිතය.

ගෙවීමේ ක්‍රමයට බස් රථ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය යටතේ ආසන 42 - 54 බස් රථ 272 ක්ද ආසන 32 - 35 බස් රථ 53 ක්ද සුඛෝපභෝගී බස් රථ 37 ක්ද මිලදී ගැනීමට නියමිතය.

| ගෙවීමේ ක්‍රමයට බස්රථ මිලදී ගැනීම | |
|---|---|
| ආසන 42 - 54 බස්රථ 272 | ලංසු විවෘත කර තාක්ෂණික ඇගයීම් කටයුතු නිම කිරීමෙන් පසු අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගත් ලන්සු කරු වන ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම සමග සාකච්ඡා කොට කල්බදු මිල අඩුකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| ආසන 32-35 බස්රථ 53 | |
| සුඛෝපභෝගි බස්රථ 37 | අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් සොෆ්ට් ලොජික් ආයතනයෙන් කින්ග්ලොන්ග් XMQ 6127 CY ආසන 51 බස්රථ 37 කල්බදු ක්‍රමයට මිලදී ගැනීම අනුමත කර ඇති අතර ප්‍රතික්ෂේපිත ලන්සු කරුවන්ට ඒ බව දන්වා අභියාචනා ඉදිරිපත් කිරීමට කාලය ලබාදී ඇත. |

➢ **ඉංජිනේරු හා තොරතුරු තාක්ෂණ අංශයට උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය**

ඉංජිනේරු හා තොරතුරු තාක්ෂණ අංශයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණික උපකරණ ලබා ගැනීම සඳහා වූ කැබිනට් මණ්ඩල පත්‍රිකාව නැවත සකස් කර අනුමැතිය සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. මේ සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ජා කර අවශ්‍ය විස්තර ලබා දි ඇත.

➢ **කුරුණෑගල ප්‍රාදේශීය වැඩපොළ සඳහා යන්ත්‍රෝපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය**

කුරුණෑගල ප්‍රාදේශීය වැඩපොළ සඳහා රු.මි. 50 ක යන්ත්‍රෝපකරණ ලබා දි සවිකර ඇති අතර කටයුතු ආරම්භ කිරිම සඳහා අවශ්‍ය සිවිල් වැඩ කටයුතු නිම කරමින් පවති.

# 4.

# ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## 4.1 හැඳින්වීම

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත මඟින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව ස්ථාපනය කර ඇත.

### දැක්ම

"දිවයින තුළ සමාජ-ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා ගුණාත්මක, පිරිවැය ඵලදායී සහ ආරක්ෂාකාරී ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් හා සේවාවක් මඟින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගේම විවිධ ගමනාගමන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සහතික වීම"

### මෙහෙවර

"මගී ප්‍රවාහනයට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී  ලංකා රජයට උපදෙස් දීම සහ පොදු ජන ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම බස් ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා අවශ්‍ය නියාමන රාමුවක් සකස්කිරීම"

## 4.2 ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කාර්යයන් සහ එහි ප්‍රගතිය

- **පාසැල් ළමුන් සඳහා අනුග්‍රාහක ගාස්තු මත ප්‍රවාහන සේවා සැපයීමේ පාසල් බස් රථ සේවා ව්‍යාපෘතිය - සිසු සැරිය**

පාසල් දරුවන් ප්‍රවාහනය කරන මෝටර් රථ හා ලොකු කුඩා වෑන්රථ නිසා නගරාශ්‍රිතව ඇතිවන මාර්ග තදබදය, දෙමව්පියන්ට දැරීමට සිදුවන අධික බරපැන, දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටලු, සැප පහසුව පිළිබඳ කිසිදු ප්‍රමිතියක් නොමැති වීම ආදී ගැටලු හේතුවෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගනු ලැබූ වැදගත් හා කාලෝචිත පියවරක් ලෙස පාසල් සිසුන් සඳහාම වෙන්වූ බස් රථ සේවාවක් වන "සිසු සැරිය" පාසල් බස්රථ ව්‍යාපෘතිය හැඳින්විය හැක.

මෙම සේවාවේදී පාසල් සිසුන්ගෙන් සාමාන්‍ය ගාස්තුවෙන් 50%ක් පමණක් අය කරනු ලබන අතර ධාවකයාගේ ආදායම අඩුවීම වෙනුවෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව කලින් එකඟ වූ ගාස්තු ප්‍රමාණයන් අනුව පසුව ප්‍රතිපූරණය කරමින් සේවාවන් පවත්වා ගෙන යනු ලැබේ. 2018 වර්ෂය වන විට එතෙක් සාමාන්‍ය මගී ප්‍රවාහන බස් ගාස්තු වැඩිවීම් සලකා බලා "සිසුසැරිය" සේවාවේ ධාවනය කරන එක් කිලෝමීටරයකට ගෙවනු ලබන ගාස්තුව ද රු. 45.00 සිට රු.57.00 දක්වා රු.12.00 කින් වැඩි කරන ලදී.

ව්‍යාපෘතිය යටතේ 2018 දෙසැම්බර් මස 31 දිනට ක්‍රියාත්මක සිසු සැරිය සේවා පිළිබඳ විස්තර පහත වගුවෙහි දැක්වේ.

| අනු අංකය | පළාත | සිසුසැරිය බස්රථ සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | 2017 දක්වා | 2018 නව සේවා | මුළු සේවා ගණන |
| 1 | බස්නාහිර | 419 | 12 | 431 |
| 2 | දකුණ | 116 | 02 | 118 |
| 3 | වයඹ | 274 | 12 | 286 |
| 4 | උතුරු මැද | 148 | 07 | 155 |
| 5 | සබරගමුව | 126 | 01 | 127 |
| 6 | ඌව | 82 | 10 | 92 |
| 7 | නැගෙනහිර | 111 | 04 | 115 |
| 8 | මධ්‍යම | 47 | 04 | 51 |
| 9 | උතුර | 32 | 04 | 36 |
| 10 | අන්තර් පළාත් | 07 | 00 | 07 |
| | **එකතුව** | **1,362** | **56** | **1,418** |

දැනට ක්‍රියාත්මක "සිසු සැරිය" බස්රථ සේවා මඟින් දිනකට දිවයින පුරා පාසල් දරුවන් 87,000 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදෙනු ලැබේ.

මෙම සේවා සඳහා 2018 වර්ෂය තුළ දී රු.මි.483.48 ක වියදමක් දරා ඇත.

- **ග්‍රාමීය බස් සේවා ව්‍යාපෘතිය "ගැමි සැරිය"**

ගමනාගමන දුෂ්කරතා සහිත ප්‍රදේශ වල ජීවත්වන ජනතාව වෙනුවෙන්, ගම නගරයෙන් දුරස්ථ වීම වළකාලමින් "ගැමිසැරිය" නමින් ග්‍රාමීය බස් සේවා ව්‍යාපෘතියක් 2005 වර්ෂයේදී ආරම්භ කර මේ දක්වා අඛණ්ඩව පවත්වාගෙන යමින් විශ්වසනීය හා සහනදායි, ලාභදායී සේවාවක් ගම්බද ජනතාව වෙත ලබාදෙයි.

ගැමිසැරිය බස් රථ සේවය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සේවාව ආරම්භ කර වසර 3 ක් දක්වා පමණක් ප්‍රතිපාදන සපයනු ලබයි. වසර 3 කින් පසුව ජනතාව අතර සේවාව ප්‍රචලිත වීමෙන් උපයන ආදායමෙන් සේවාව පවත්වාගෙන යාමට හැකි මට්ටමට පැමිණෙන බවට වන උපකල්පනය මත එම කොන්දේසිය පනවා ඇති අතර අදාළ සේවාව වෙනුවෙන් යෙදවූ ප්‍රතිපාදන වෙනත් ගැමිසැරිය සේවාවක් ආරම්භ කිරීම සඳහා යොමු කිරීමට කොමිෂන් සභාව කටයුතු කරනු ලැබේ. ඒ අනුව 2018 දෙසැම්බර් 31 වන විට සහනාධාර ලබන සේවා සංඛ්‍යාව 8 ක් වුවද ආරම්භයේ සිට මේ දක්වා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති ගැමිසැරිය සේවා වලින් විශාල සංඛ්‍යාවක් මේ වන විට ජනප්‍රිය බස්රථ සේවාවන් බවට පත්ව ඇත.

| අනු අංකය | පළාත | ගැමිසැරිය බස්රථ සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | 2017 දක්වා | 2018 නව සේවා | මුළු සේවා ගණන |
| 1 | නැගෙනහිර | 03 | 00 | 03 |
| 2 | වයඹ | 01 | 03 | 04 |
| 3 | මධ්‍යම | 01 | 00 | 01 |
| | **එකතුව** | **05** | **03** | **08** |

2018 වර්ෂය තුළදී මෙම සේවාව සඳහා රු.මි. 2.9 ක වියදමක් දරා ඇත.

- **රාත්‍රී බස් සේවා ව්‍යාපෘතිය "නිසි සැරිය"**

දිවයිනේ බොහෝ ප්‍රදේශවල, රාත්‍රි කාලයේ සහ අළුයම් කාලයේ ප්‍රධාන මාර්ග හැරුණු විට සෙසු මාර්ග වල පොදු බස් සේවා සැපයීම ඉතා දුර්වල මට්ටමක පවතී. එවන් පසුබිමක ග්‍රාමීය ප්‍රදේශවල සිට රටේ සංවර්ධනය වෙනුවෙන් තම ශ්‍රමදායකත්වය ලබා දෙන බොහෝ පිරිසක් අළුයම් කාලයේ නිවසින් බැහැරව ආපසු පැමිණෙන්නේ රාත්‍රි කාලයේය. එහෙයින් එම මගී ජනතාවට අත්විදීමට සිදුවන දැඩි අපහසුතාවය මඟ හැරවීම අරමුණු කර ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් "නිසි සැරිය" රාත්‍රී බස් සේවා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

| අනු අංකය | පළාත | නිසිසැරිය බස්රථ සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | 2017දක්වා | 2018 නව සේවා | මුළු සේවා ගණන |
| 1 | බස්නාහිර | 54 | 08 | 62 |
| 2 | දකුණ | 16 | 17 | 33 |
| 3 | උතුර | 00 | 05 | 05 |
| 4 | වයඹ | 14 | 06 | 20 |
| 5 | උතුරු මැද | 11 | 00 | 11 |
| 6 | සබරගමුව | 03 | 00 | 03 |
| 7 | ඌව | 09 | 00 | 09 |
| 8 | නැගෙනහිර | 03 | 00 | 03 |
| 9 | මධ්‍යම | 20 | 07 | 27 |
| | **එකතුව** | **130** | **43** | **173** |

මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂය තුළදී රු.මි. 12.79 ක වියදමක් දරා ඇත.

- **පොදු මගී ප්‍රවාහනය සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

➢ **බස් නැවතුම්පොළ ඉදිකිරීම හා නවීකරණය**

බහුතර ජනතාව පොදු මගී ප්‍රවාහන සේවාව වෙත ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් හා පොදුවේ මගීන් හා බස්රථ ධාවකයින්ගේ පහසුව පිණිස ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් බස් නැවතුම්පොළ ඉදිකිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව 2015 වර්ෂයේ නැගෙනහිර පළාතේ කින්නියා නගර සභාවට අයත් භූමියක ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ කින්නියා බස් නැවතුම්පොළ හි සියලු වැඩ නිමවා 2018 ජූලි මස 22 දින ජනතා අයිතියට පත් කරන ලදී. මගී ජනතාව හා ධාවකයින් සඳහා අවශ්‍ය සියලු පහසුකම් හා අංගෝපාංග සහිතව ඉදි කරන ලද හිඟුරක්ගොඩ හා මැදිරිගිරිය බස් නැවතුම්පොළ දෙකෙහි සියලු වැඩ අවසන් කර 2018.08.01 දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහභාගිත්වයෙන් ජනතා අයිතියට පත් කරන ලදී.

ඒ අනුව 2018 වර්ෂය තුළ මේ වන විට නව බස් නැවතුම්පොළවල් 3 ක් ජනතා අයිතියට පත් කර ඇත. මීට අමතරව කිළිනොච්චිය නගරයේ ඉදිකරමින් පවතින නව බස්නැවතුම්පොළ මේ වන විට 50% ක් පමණ වැඩ අවසන් කර ඇත.

බස් නැවතුම්පොළ ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂය තුළ දී රු. මි. 25 ක් පමණ පිරිවැයක් දරා ඇත.

මේ ආකාරයට පොදු ප්‍රවාහන සේවාවේ යටිතල පහසුකම් නවීන අංගෝපාංග සහිතව සංවර්ධනය කිරීම තුළින් සෑම තරාතිරකම ජනතාවගේ ප්‍රසාදය හා විශ්වාසය ඇතිකිරීමත් ඒ තුළින් පුද්ගලික ප්‍රවාහන මාධ්‍ය වෙනුවට පොදු ප්‍රවාහන සේවාව කෙරෙහි මගී ආකර්ෂණය ඇති කරවීම අපේක්ෂා කෙරේ.

- **අන්තර් පළාත් බස්රථ සේවා සැලසීම**

අන්තර් පළාත් දුර ගමන් බස්රථ සේවා සැපයීම සඳහා පෞද්ගලික අංශයට මගී ප්‍රවාහන අවසරපත්‍ර නිකුත් කිරීම සහ ඊට අදාළ කර්තව්‍යයන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව මඟින් ඉටු කරනු ලබයි. 2018 වර්ෂයේ ප්‍රධාන මහාමාර්ග වලට අමතරව අධිවේගී මාර්ග ඔස්සේ අන්තර් පළාත් අධි සුඛෝපභෝගී බස්රථ සේවා ද ක්‍රියාත්මක වන අතර මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස මගී ඉල්ලුමට සරිලන පරිදි මේ වනවිට නිකුත් කර ඇති වලංගු මගී සේවා අවසරපත්‍ර සංඛ්‍යාව පහත වගුවෙහි දැක්වේ.

| අනු අංකය | සේවා වර්ගය | බස්රථ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සාමාන්‍ය | 2,004 |
| 2 | අර්ධ සුඛෝපභෝගී | 452 |
| 3 | සුඛෝපභෝගී | 587 |
| 4 | අධි සුඛෝපභෝගී | 113 |
| | **එකතුව** | **3,156** |

- **මගී අවශ්‍යතාවය පිණිස බස්රථ සේවා පවත්වාගෙන යාම සඳහා හඳුන්වා දී ඇති ව්‍යාපෘති**

- **කාලසටහන් පිළියෙළ කිරීම හා සංශෝධනය කිරීම**

දිවයින පුරා අන්තර් පළාත් පොදු මගී ප්‍රවාහන බස් සේවා සපයන සියලුම බස් ධාවකයින්ට සම අවස්ථා සැලසෙන පරිදි ධාවන කාලසටහන් සකස් කිරීමත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බස් ධාවකයින් අතර පවතින අහිතකර තරඟකාරීත්වය අවම කිරීමත් එමඟින් ධාවකයින්ගේ ව්‍යාපාරික ස්ථාවරත්වය ආරක්ෂා කිරීමත් මගී ජනතාව වෙත විශ්වසනීය, ආරක්ෂාකාරී මෙන්ම ඉහළ ගුණාත්මක භාවයකින් යුත් පොදු ප්‍රවාහන සේවාවක් ලබාදීමත් මෙම ව්‍යාපෘතියේ මූලික

අරමුණු වේ. මෙයට අමතරව බස්රථයක් සාමාන්‍යයෙන් දිනකට ධාවනය වන කිලෝමීටර් ප්‍රමාණය උපරිම කිරීමද මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු අතර ප්‍රධාන වේ.

- **බස් ගාස්තු නිර්ණය / සංශෝධනය කිරීම**

පොදු මගී ප්‍රවාහන බස් රථ වල ගාස්තු නිර්ණය කිරීම සිදු කරනු ලබන්නේ 2002 වර්ෂයේ අනුමත කර ඇති ගාස්තු ප්‍රතිපත්තිය අනුව වේ. මෙම ගාස්තු ප්‍රතිපත්තිය අනුව සෑම වසරකම ජූලි මස 01 වන දිනට බස් ගාස්තු සංශෝධනය සිදු කළ යුතු අතර ඉන්ධන මිල මුළු බස් ගාස්තු පිරිවැයෙන් 4% කට වඩා වැඩි වන ලෙස වැඩි වූ අවස්ථාවක අදාළ බස් ගාස්තු සංශෝධනය සිදු කරනු ලැබේ.

නමුත් වර්තමානයේ ක්‍රියාත්මක වන මෙම ගාස්තු ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා අංක 17/1789/709/066 දරණ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගේ 2017.08.11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව විද්වත් කමිටුවක් පත්කර ඇත. එම විද්වත් කමිටුව මඟින් මේ වන විට 2002 බස් ගාස්තු ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

2018 වර්ෂයේ වාර්ෂික බස් ගාස්තු සංශෝධනය පහත පරිදි අවස්ථා කිහිපයකදී සිදු කරන ලදී.

2018 මැයි - 12.5% කින් වැඩි කරන ලදී<br>
2018.09.21 - 4% කින් වැඩි කරන ලදී<br>
2018.11.09 - 2% කින් අඩු කරන ලදී.<br>
2018.12.26 - 4% අඩු කරන ලදී.

- **බස් රථ සේවක පිරිස් ලියාපදිංචි කිරීම හා පුහුණු කිරීම**

අන්තර් පළාත් පෞද්ගලික බස්රථ වල සේවයේ නියුතු රියැදුරු හා කොන්දොස්තර මහතුන්ගේ සේවය වෘත්තීමය තත්ත්වයකට නැංවීම හා යහපත් විනය ගරුක වෘත්තිකයන් ලෙස සමාජයට එක් කිරීමත් මගී ජනතාව තුළ ඔවුන් කෙරෙහි යහපත් ආකල්ප ඇති කිරීම පිණිසත් විශේෂ පුහුණු වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කරයි. බස්රථය තුළ ගමන් ගන්නා මගීන්ගේ විශ්වාසය හා ගෞරවය දිනා ගනිමින් ප්‍රසංශනීය සේවාවක් ලබාදීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. තවද, මෙම පුහුණු වැඩසටහන් දිවයිනේ සිටින වියත් දේශකයන් ලවා සිදුකරවන අතර පාඨමාලාව සාර්ථකව නිමකරනු ලබන සේවක මහතුන් වෙත විශේෂ රියැදුරු/ කොන්දොස්තර හැඳුනුම්පතක් නිකුත් කිරීමද මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ.

මීට අමතරව මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් වසර දෙකකට වැඩි පලපුරුද්දක් සහිත බස්රථ රියැදුරන් සඳහා මගී සේවා රියැදුරු බලපත්‍ර නිකුත් කිරීම (Passenger Transport Training)' නමින් විශේෂ පුහුණු වැඩසටහනක් 2017 ජූලි මස සිට මේ දක්වා ක්‍රියාත්මක කරමින් පවතී.

2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 දක්වා පවත්වන ලද රියැදුරු කොන්දොස්තර පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 46 ක් වන අතර එමඟින් රියදුරු කොන්දොස්තර මහතුන් 3,417 දෙනෙකු පුහුණු කර ඇත.

- **ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් කිරීම**

2009 වර්ෂයේදී සකස් කරන ලද දැනට පවතින ප්‍රවාහන ප්‍රතිපත්තිය වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රවාහනයට අදාළ පාර්ශවකාර ආයතනවල විශේෂඥ දැනුම ඇති පුද්ගලයන්ගෙන් සමන්විත

විද්වත් කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුව මගින් කෙටුම්පත් කරන ලද ප්‍රවාහන ප්‍රතිපත්තිය මහජන අදහස් ලබා ගැනීමට යොමු කරන ලදී. ලද මහජන අදහස් හා යෝජනා ද සැලකිල්ලට ගෙන සකස් කරන ලද ප්‍රවාහන ප්‍රතිපත්තියේ අවසන් වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, විශේෂ උපදේශකවරයකුගේ උපදෙස් ලබා ගෙන අවසන් වාර්තාව නැවත සකස් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව අදාළ උපදේශක වරයකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.

- **සමීක්ෂණ**

මේ යටතේ ප්‍රධාන වශයෙන් අන්තර් පළාත් බස් රථ ධාවනයට අදාළ මගී ඉල්ලුම් සමීක්ෂණ සිදුකරනු ලබන අතර එමගින් සපයනු ලබන නිවැරදි දත්ත ක්‍රමවත් කාලසටහන් සකස් කිරීම සඳහාත් මතුවන ගැටලු අවම කරගැනීම සඳහාත් ඉවහල් වේ. මීට අමතරව අන්තර් පළාත් මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේදී හා ප්‍රතිපත්ති සකස් කිරීමේදීත්, සැලසුම් සම්පාදනය කිරීමේදීත් පවත්නා වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම මූලිකවම සිදුකරයි. ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් එවැනි කාර්යයන් සිදු කරන අවස්ථාවලදී අවශ්‍ය දත්ත සැපයීම සමීක්ෂණ ඒකකය විසින් සිදුකරනු ලබයි. ඒ අනුව පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන්නන් සහ බස්රථ ධාවකයන් යන දෙපාර්ශවයටම සාධාරණත්වය ඉටු වන පරිදි ඉල්ලුම සහ සැපයුම ප්‍රශස්ථ ලෙස හැසිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දත්ත සම්පාදනය කිරීම සමීක්ෂණ ඒකකයේ ප්‍රමුඛ කාර්යය වී තිබේ.

2018 දෙසැම්බර් මාසය අවසන් වන විට සමීක්ෂණ 32 ක් සිදුකර ඇති අතර මගී ඉල්ලුම සම්බන්ධව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

මීට අමතරව මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ කටුනායක 18 කණුව අසල ඉදිකිරීමට නියමිත බහු මාධ්‍ය ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථානය ආශ්‍රිතව පොදු ප්‍රවාහන ඉල්ලුම තක්සේරු කිරීම සඳහා කරන ලද සමීක්ෂණයේ අවසන් වාර්තාව එම අමාත්‍යාංශය වෙත භාර දීම සිදු කර ඇත.

- **ජී.පී.එස්. (GPS) තාක්ෂණය තුළින් දුරස්ථ ගෝචරව අන්තර් පළාත් පුද්ගලික බස්රථ නියාමනය කිරීම**

පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව වර්ධනය කිරීමටත් ආරක්ෂිත හා කාර්යක්ෂම ප්‍ර වාහන සේවාවක් සැපයීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයට යොදා ගැනීමක් ලෙස ජී.පී.එස් තාක්ෂණය (GPS Technology) යොදා ගනිමින් දුරස්ථ ගෝචරව අන්තර් පළාත් බස් රථ නියාමනය කිරීම හඳුන්වා දිය හැක. මේ යටතේ අදාළ බස්රථය තුළ ජී.පී.එස් උපකරණයක් සහිත ද්විත්ව සන්නිවේදන පද්ධතියක් සහ වේග සීමා ඉක්මවූ විට නාදවීම සඳහා Speed Alarm Buzzer සවි කරනු ලැබේ. මෙම කටයුතු නියාමනය කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් නව තාක්ෂණයෙන් පිරිපුන් පාලන මැදිරියක් ස්ථාපිත කර ඇති අතර එහි මෙහෙයුම් කටයුතු ක්ෂණික දුරකථන ඇමතුම් ඒකකයත් සමඟ සම්බන්ධවී පැය 24 පුරා සක්‍රිය සේවාවක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

- **බස් ගාස්තු පෙර ගෙවුම් කාඩ් පත් ක්‍රමය හඳුන්වා දීම**

පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන මගීන් වෙත ඉතාම විශ්වාසදායී හා කාර්යක්ෂම සේවාවක් තහවුරු කිරීමත්, මගී පැමිණිළි අවම කිරීමත් බස්රථ සේවක මහතුන් විසින් සිදුකරනු ලබන කොන්දේසි කඩකිරීම් අවම කර, ආදායම උපරිම කිරීමත් අරමුණු කරමින් ප්‍රවාහන ගාස්තු ගෙවීම සඳහා පෙර ගෙවුම් කාඩ්පතක් හඳුන්වා දීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මූලිකත්වය ගෙන කටයුතු ආරම්භ කරන ලදී.

ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ හා මුදල් අමාත්‍යංශයේ නිලධාරීන් සමග පවත්වන ලද සාකච්ඡාවලින් අනතුරුව ගරු අමාත්‍යතුමාගේ උපදෙස් අනුව මේ සඳහා මූලික අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පළාත් ප්‍රවාහන අධිකාරී වලින් ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍ර පිළිබඳ අවශ්‍ය තොරතුරු රැස්කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

- **ප්‍රවාහනය ආශ්‍රිත පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්**

අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවා සැපයීම සඳහා දායකත්වය ලබා දෙන පෞද්ගලික අංශයේ බස්රථ හිමිකරුවන්, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිවල සේවය කරන අදාළ නිලධාරීන් හා සේවාලාභීන් වන ගුරු භවතුන් හා පාසල් දරුවන් ආදී පාර්ශවකරුවන් අරභයා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. බස්රථ හිමිකරුවන් හා ප්‍රවාහන අධිකාරිවල නිලධාරීන් සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා ගුරු භවතුන් හා පාසල් දරුවන් සඳහා ආරක්ෂාකාරීව මහා මාර්ගය භාවිතා කිරීමට අවශ්‍ය උපදෙස් හා තොරතුරු ලබා දීම, විවිධ දේශන හා ක්‍රියාකාරකම්, චිත්‍ර තරඟ පැවැත්වීම ආදිය මෙම ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරනු ලබයි.

ඒ අනුව 2018 වසර තුළ දිවයින පුරා මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු ඉහළ කළමනාකාරිත්වය සඳහා විශේෂ වැඩමුළුවක්ද පෞද්ගලික අංශයේ අන්තර් පළාත් බස්රථ හිමිකරුවන් සඳහා වැඩමුළු 22ක් ද වශයෙන් වැඩමුළු 29 ක් පවත්වා ඇත.

- **බස්රථ සේවා පසුවිපරම**

➢ **මහජන පැමිණිලි විමර්ශන**

ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික බස් සේවාව සම්බන්ධයෙන් එම සේවාව භාවිතා කරන මගී ජනතාවගෙන් නිරතුරුවම නැගෙන අනේකවිධ චෝදනා හේතුවෙන් එම සේවාව දියුණු මට්ටමකට රැගෙන ඒම ඉතා අසීරු වී තිබේ. අන්තර් පළාත් දුර ගමන් සේවා බස්රථ තුළදී අත්විඳීමට සිදුවන අයිතිවාසිකම් කඩවීම් වැනි කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි විමර්ශනය කිරීම මහජන පැමිණිලි විමර්ශන ඒකකයෙහි කාර්යභාරය වේ. දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක 1955 දුරකථන අංකය (Hot line) හා 0112595555 දුරකථන අංකය මඟින් ද ෆැක්ස්, විද්‍යුත් තැපැල, ලිපි යනාදී මාධ්‍ය තුළින් මෙන්ම කාර්යාලයට පැමිණ ද පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව උදා කර ඇත.

2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට මහජන පැමිණිලි 3,235 ක් ලැබී ඇති අතර ඉන් 2,714 ක් විභාගකර විසඳුම් ලබා දී අවසන් කර ඇත.

➢ **ජංගම පරීක්ෂණ හා විමර්ශන**

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාරව ජාතික ගමනාග මන කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව අන්තර් පළාත් මගී ප්‍රවාහනය සඳහා නිකුත්කර ඇති මගී සේවා අවසර පත්‍ර වෙත පනවා ඇති කොන්දේසි, නිසිලෙස පිළිපදින්නේද යන්න පිළිබඳ පරීක්ෂා කිරිම, ජංගම පරීක්ෂණ ඒකකය විසින් ඉටු කරනු ලබයි. ධාවනය කරමින් පවතින බස්රථ අතරමග නතර කර පරීක්ෂා කරන අතර කොන්දේසි උල්ලංඝනය කරමින් අන්තර් පළාත් මාර්ගයන්හි ධාවනය වන බස්රථ පිළිබඳව වාර්තා ලබාගෙන විමර්ශන ඒකකය වෙත ඉදිරිපත් කිරීමත්, මගී සේවා අවසරපත්‍ර නොමැතිව අන්තර් පළාත් මාර්ගයන්හි ධාවනය වන බස්රථ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා සහය වීමත් මඟින් ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් තහවුරු කිරීම පිණිස දායක වීම ජංගම පරීක්ෂණ ඒකකය විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව 2018 දෙසැම්බර් මස 31 වන විට ජංගම පරීක්ෂණ ඒකකය විසින් අන්තර් පළාත් බස් රථ පරීක්ෂා කිරීම් 19,587 ක් සිදුකර ඇත.

- **ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛන වාර්තාව**

ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගන්නා ඉතාමත් කාලෝචිත පියවරක් ලෙස ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව එළි දැක්වීම හඳුන්වා දිය හැක. ගොඩබිම, ජලය හා ගුවන් යන මාධ්‍ය තුන හරහා සිදු කරන සියලු ප්‍රවාහන කාර්යයන් පිළිබඳ තොරතුරු එකම ස්ථානයකින් ලබා ගත හැකි ක්‍රමයක් ලෙස ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව මේ වන විට ප්‍රවාහන ක්ෂේත්‍රයේ සියලූ විද්වතුන්ගේ පැසසුම් ලබන මාහැඟි ග්‍රන්ථයක් වී තිබේ. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය ඇතුළු සම්බන්ධිත ආයතන වලින් තොරතුරු හා දත්ත ඒකරාශී කර එම දත්ත අනුසාරයෙන් විවිධ පැති ඔස්සේ විශ්ලේෂණය කර ඉතා ආකර්ෂණීය ලෙස සකස් කරනු ලබන මෙම ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව අඛණ්ඩව වර්ෂයක් පාසා මුද්‍රිත ග්‍රන්ථයක් වශයෙන් භාෂා ත්‍රිත්වයෙන්ම එළිදක්වනු ලැබේ.

2018.12.31 වන විට 2017 වර්ෂයේ ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව මුද්‍රණ කටයුතු අවසන් කර දිවයින පුරා රාජ්‍ය ආයතන, ප්‍රධාන පාසල්, මහජන පුස්තකාල, ප්‍රවාහනයට සම්බන්ධ සියලූ ආයතන බෙදාහැරීම සිදු කරමින් පවතී.

- **අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතිය**

ආයතනයේ කාර්යයන්හි ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා ආයතනය තුළ පවතින සියලූම ක්‍රියාවලීන් හඳුනාගෙන එම ක්‍රියාවලීන් එකිනෙකට සම්බන්ධවන ලෙස මධ්‍යගත දත්ත පාදක පද්ධතියක් ඇති කිරීමේ අරමුණැතිව ආයතනයේ සියලූම ක්‍රියාවලීන් ස්වයං කරන පද්ධතියක් ස්ථාපනය කිරීම (Process Automation System) මේ වනවිට ICTA ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්ව විද්‍යාලවල උපදේශකත්වය යටතේ ආරම්භ කර ඇත.

මේ යටතේ අදියර 03 කින් සමන්විත ව්‍යාපෘතියේ මේ වනවිට පළමු අදියර අවසන් කර දෙවන අදියරේ ද අවසන් භාගය සිදුවෙමින් පවතී.

මෙයට අමතරව මාර්ගගත ආසන වෙන් කිරීමේ ව්‍යාපෘතියක් (Online Bus Ticket Reservation System) මොරටුව විශ්වවිද්‍යාලය මගින් අදාළ මෘදුකාංග සංවර්ධනය සිදු කරනු ලබන අතර එය මේ වනවිට ක්‍රියාත්මක තත්වයේ පවතී. තවද බහුවිධ ප්‍රවාහන සේවා පිළිබඳ තොරතුරු සැපයීමේ පද්ධතියක් ගූගල් සිතියම් ආශ්‍රයෙන් හඳුන්වාදීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය සමඟ එක්වී අදාළ දත්ත රැස්කිරීම සහ මෘදුකාංග සංවර්ධන කටයුතු සිදුකරමින් පවතී.

### 4.3 2018 වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දුන් අභියෝග

2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කිරීමේදී ප්‍රධාන වශයෙන් අභියෝග කිහිපයකට මුහුණ දීමට සිදුවිය.

ගැමිසැරිය සේවාවට අදාළව නව සේවා ආරම්භ කිරීම සඳහා යෝජනා පළාත් ප්‍රවාහන අධිකාරි වලින් ප්‍රමාණවත් තරම් නොලැබීම සහ ටෙන්ඩර් කරන ලද මාර්ග වලට අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම නිසා නියමිත ඉලක්කයට ළඟා වීමට නොහැකි වී තිබීමද ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් නිසි සහයෝගයක් ලබා නොදීම හා ඒකාබද්ධ කාලසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වෘත්තීය සමිතිවල එකඟතාවය පල නොකිරීමද ප්‍රධාන අභියෝගයන්ය. පෙරගෙවුම් කාඩ්පත හඳුන්වාදීමේ ව්‍යාපෘතිය 2017 වර්ෂයේ ICTA ආයතනයේ තාක්ෂණික සහයෝගය මත ආරම්භ

කර ක්‍රියාත්මක වෙමින් පැවති අතරවාරයේ උද්ගතවූ ගැටලුවක් මත ව්‍යාපෘතිය ප්‍රමාද වූ අතර එය සම්පූර්ණ කිරීම සඳහා මේ වන විට ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

මීට අමතරව මගී ප්‍රවාහනය සඳහා අන්තර් පළාත් දුර සේවා බස්රථ සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම ටෙන්ඩර් පරිපාටිය අනුව සිදුකිරීමේදී එසේ ටෙන්ඩර් කිරීමට එරෙහිව සමහර ධාවකයින් විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නිසා එම කාර්යයන් ඇණහිටින ලදී.

බස් නැවතුම්පොළ ගොඩනැගීමේ ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ ආරම්භ කරන ලද කිළිනොච්චිය බස් නැවතුම්පොළ අදාළ කොන්ත්‍රාත් කරුවන් විසින් ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළ අවසන් නොකිරීම හා වැඩ ප්‍රමාද වීම නිසා එය නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කර ඇත. තවද බකමූණ ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත බස් නැවතුම්පොළ ගොඩනැගීමේ ව්‍යාපෘතියද ඉඩම නිරවුල් වීම සිදු වූයේ වසර අවසානයේ බැවින් වැඩ ආරම්භ කිරීමට නොහැකි වී ඇත.

### 4.4 2019 වර්ෂයේ අපේක්ෂාවන්

1. 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කර මගීන්ට හා බස් ධාවකයින්ට වඩාත් ගුණාත්මක සහ ස්ථාවර බස්රථ සේවාවක් සැපයීම සඳහා නියාමනය ශක්තිමත් කර ගැනීම.

2. මේ වන විට සකස් කර අවසන් වෙමින් පවතින ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කාර්යයන් අනුගත කිරීම සහ ඒ අනුව උපාය මාර්ග සැලසුම් සකස් කිරීමට දැනට සංශෝධනය කරමින් පවතින නව බස්ගාස්තු ප්‍රතිපත්තිය 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සහ ඒ අනුව 2019 වර්ෂයේ බස් ගාස්තු සංශෝධනය සිදු කිරීම.

3. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති සියලුම අන්තර් පළාත් මගී සේවා අවසර පත්‍ර යටතේ ධාවනය වන බස්රථ සඳහා GPS පද්ධති සවි කිරීමත් GPS මඟින් පසු විපරම් කිරීම තුළින් මහජනයාට වඩාත් ආරක්ෂාකාරී සහ විශ්වසනීය බස් සේවාවක් ලබා දීම.

4. අන්තර් පළාත් මාර්ග කාණ්ඩ වශයෙන් හඳුනාගෙන මගී ඉල්ලුම් සමීක්ෂණ සිදුකර (ශ්‍රී ලංගම සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාව එක්ව) එමඟින් හඳුනා ගන්නා මගී ඉල්ලුම අනුව ඒකාබද්ධ කාලසටහන් විද්‍යාත්මකව සකස්කර ක්‍රියාත්මක කිරීම

5. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කාර්යාල කටයුතු ඉතාමත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ERP පද්ධතිය 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම හා ඕනෑම පුද්ගලයෙකුට අන්තර් ජාලය හරහා තමා සිටින ස්ථානයේ සිට ආසන්නතම බස් නැවතුම්පොළ/දුම්රියපොළ හා මාර්ග අංකය ද සහිතව ප්‍රවාහන පහසුකම් පිළිබඳ සවිස්තර තොරතුරු ගූගල් සිතියම් ආශ්‍රයෙන් ලබා ගැනීමේ පහසුකම් සහිත 'GEO Reference data feed' පහසුකම ක්‍රියාවට නැංවීම

6. මාකුඹුර බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථානයෙන් අධිවේගී මාර්ගයේ දැනට ක්‍රියාත්මක වන (මහරගමින් ගමන් ආරම්භ කරන) සියලුම බස්රථ සේවාවන් ගමන් ආරම්භ කරවීමට සැලැස්වීම

7. අන්තර් පළාත් පෞද්ගලික බස් රථවල සේවයේ නියුතු රියදුරු, කොන්දොස්තර මහතුන් පුහුණු කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංගම හා එක්ව නවතාවයකින් යුතුව ආකල්ප හා කුසලතා වර්ධනය සඳහා වූ ක්‍රියාකාරකම් සහිතව පැවැත්වීම.

# 5.

# ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

## 5.1 හැඳින්වීම

රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් 1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත අනුව ක්‍රියාත්මක වන මෙම ආයතනයේ මූලික අරමුණු වන්නේ ශ්‍රී ලංකාව තුළ සිටින බර වාහන මෙන්ම සැහැල්ලු වාහන රියදුරන්ගේ සෞඛ්‍යයමය තත්ත්වය පිළිබඳව උසස් හා ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණයක් සිදුකර වෛද්‍ය සහතික නිකුත් කිරීමයි. මේ සඳහා ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල 25 ක් දිවයින පුරා පිහිටුවා ඇත.

### දැක්ම

"සෑම සුක්කානමක් පිටුපසම නිරෝගිමත් රියදුරකු හිඳුවීම"

### මෙහෙවර

"ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වෙමින් සියලුම රියදුරු බලපත්‍ර අපේක්ෂකයන්ට අධ්‍යාත්මික හා ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණ සිදුකර ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතික කිරීම.

## 5.2 පරමාර්ථ

- සියලුම රියදුරු බලපත්‍ර අයදුම්කරුවන්ගේ ශාරීරික සහ මානසික යෝග්‍යතාවය පරීක්ෂා කර බැලීම.
- නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයේ ගුණාත්මක බව හා ආරක්ෂක උපක්‍රම වර්ධනය කිරීම.
- මනා මානව සම්පත් කළමනාකරණය තුළින් සේවාවේ ගුණාත්මක බව ළඟා කර ගැනීම.

## 5.3 ආයතනයේ කාර්යයන්

(අ) බරවාහන ඇතුළු සියලූ වර්ගවල මෝටර් වාහන පදවන හෝ ධාවනය කරන රියදුරන්ට සහ ධාවකයන්ට වෛද්‍ය සේවා සැලසීම.

(ආ) බරවාහන ඇතුළු සියලූ වර්ගවල මෝටර් වාහනවල රියදුරන් හා ධාවකයන් පරීක්ෂා කර ඒ රියදුරන්ට හා ධාවකයන්ට ශාරීරික හා මානසික යෝග්‍යතාව පිළිබඳ සහතික ලබාදීම.

(ඇ) බරවාහන ඇතුළු සියලූ වර්ගවල වාහනවල රියදුරන් හා ධාවකයන් වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කර ඔවුන්ගේ සුදුසුකම සහ යෝග්‍යතාව පිළිබඳ නිර්දේශ ලබාදීම.

(ඈ) කවර හෝ වර්ගයක මෝටර් වාහනවලට අදාළ අනතුරු හා සම්බන්ධ අවස්ථාවලදී වෛද්‍ය සේවා සැලසීම.

(ඉ) සියලූ වර්ගවලට අයත් මෝටර් වාහන, ශාරීරිකව හා මානසික යෝග්‍ය හා ප්‍රවීන තැනැත්තන් විසින් පමණක් ධාවනය කරනු ලබන හෝ පදවනු ලබන බවට ආයතනය විසින්ම හෝ වෙනත් නියෝජිත ආයතන වලින් විමසා කටයුතු කිරීමට වගබලා ගැනීම

(ඊ) කාර්මික ස්වස්ථතාව සහ කාර්මික අනතුරු පිළිබඳව වෛද්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදීම

(උ) අදාළ ක්‍රියාත්මක කිරීමේ බලධරයන් විසින් පිළිගත යුතු හා ක්‍රියාත්මක කළ යුතු ප්‍රවාහන වෛද්‍ය කටයුතුවලට ප්‍රමිති සකස් කිරීම හා සීමා නියම කිරීම

## 5.4 වර්තමාන කාර්යසාධනය


මෙම වර්ෂයේ දෙසැම්බර් මස අවසානය දක්වා රියදුරු බලපත්‍ර අපේක්ෂකයින්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකොට වෛද්‍ය සහතික නිකුත් කිරීම පිළිබඳ විග්‍රහයක් පහත දක්වා ඇත.

**2018 දෙසැම්බර් 31 දින දක්වා**

| සිදුකරන ලද මුළු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව | | සෞඛ්‍යමය හේතූන් මත වෛද්‍ය පරීක්ෂණය තාවකාලිකව අසමත් වූ රියදුරන් හා රියදුරු බලපත්‍ර අපේක්ෂකයින් සංඛ්‍යාව | | තාවකාලිකව අසමත් වූ රියදුරන් හා රියදුරු බලපත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය % | |
|---|---|---|---|---|---|
| 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 |
| 878,668 | 751,786 | 100,638 | 74,104 | 11.45 | 9.86 |

2018 දෙසැම්බර් මස 31 දක්වා සිදු කරන ලද මුළු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව 878,668 ක් වේ. එමගින් 2018 දෙසැම්බර් මස 31 දක්වා සෞඛ්‍යයමය හේතූන් මත රියදුරු වෘත්තියේ යෙදවීමට නුසුදුසු බවට වෛද්‍යවරුන් විසින් නිගමනය කර ඇති ප්‍රමාණය 11.45% ක් වේ. එනම් පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ සෑම අපේක්ෂකයන් 100 දෙනෙකුගෙන් 11-12 ත් අතර සංඛ්‍යාවක් සෞඛ්‍යමය හේතූන් මත රිය පැදවීමට නුසුදුසු බවට තහවුරු වී ඇත.

**තාවකාලිකව වෛද්‍ය පරීක්ෂණ අසමත් වීමට හේතු වූ රෝගාබාධ පහත සඳහන් පරිදි වේ.**




- හඳුනාගත් රෝගාබාධ වලින් වැඩි ප්‍රතිශතයකට හේතුව ඇස් පෙනීමේ දුර්වලතාවය වේ.
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය වෙත පොලිස් දෙපාර්තමේන්තුවෙන් හා අධිකරණය මඟින් යොමුකරන ලද රියදුරන්ගෙන් 11% - 12% අතර ප්‍රතිශතයක් රිය පැදවීම සඳහා සුදුසු ශාරීරික හෝ මානසික යෝග්‍යතාවයකින් යුක්ත නොවන බවට හඳුනා ගෙන ඇත. ඒ අනුව, සෞඛ්‍යමය වශයෙන් රියදුරන් රිය ධාවනය කිරීමට නුසුදුසු බවට සහතික කිරීම මඟින් මාර්ග අනතුරු අවම කිරීමට දායක වී ඇත.

| 2017 දෙසැම්බර් 31 දින දක්වා | | | 2018 දෙසැම්බර් 31 දින දක්වා | | |
|---|---|---|---|---|---|
| සේවාලාභීන් සංඛ්‍යාව | වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේදී අසමත් සංඛ්‍යාව | අසමත් සේවාලාභීන්ගේ ප්‍රතිශතය% | සේවාලාභීන් සංඛ්‍යාව | වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේදී අසමත් සංඛ්‍යාව | අසමත් සේවාලාභීන්ගේ ප්‍රතිශතය% |
| 4,191 | 479 | 11.43 | 4,720 | 501 | 10.61 |

## 5.5 වෙනත් සංවර්ධන වැඩසටහන්

- **ජංගම සේවාවන් ක්‍රියාත්මක කිරීම**

  - **කුරුණෑගල දිස්ත්‍රික්කය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජංගම සේවය වැඩසටහන යටතේ 2018.03.09 දින සිට 2018.06.16 දින දක්වා දින 06 ක් පුරා රියදුරු බලපත්‍ර අපේක්ෂකයන් හට වෛද්‍ය සහතික නිකුත් කිරීමේ වැඩ පිළිවෙළක් බිංගිරිය, මල්ලවපිටිය, කුරුණෑගල, ගිරිබාව, පොල්ගහවෙල හා දඹුල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පැවැත්වූ අතර එහිදී සේවා ලාභීන් 1,501 ක් සේවා ලබා ගෙන ඇත.

  - **අනුරාධපුර දිස්ත්‍රික්කය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජංගම සේවය වැඩසටහන යටතේ 2018.05.20 දින සිට 2018.05.27 දින දක්වා දින 03ක් පුරා රියදුරු බලපත්‍ර අපේක්ෂකයන් හට වෛද්‍ය සහතික නිකුත් කිරීමේ වැඩ පිළිවෙළක් හොරව්පතාන, කැබිතිගොල්ලෑව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල දී පවත්වන ලදී.

  - **යාපනය දිස්ත්‍රික්කය**

යාපනය දිස්ත්‍රික්කයේ ජංගම සේවය වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් 2018.07.29 දින සිට 2018.10.14 දින දක්වා දින 19 ක් පුරා රියදුරු බලපත්‍ර අපේක්ෂකයන් හට වෛද්‍ය සහතික නිකුත් කිරීමේ වැඩසටහන් පැවැත්වූ අතර එහිදී 5,134 දෙනෙකුට සේවා සපයා ඇත.

- **ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීම**

ප්‍රධාන කාර්යාලයේ දෙවන මහලේ නවීකරණ කටයුතු අවසන් කර 2018.07.12 දින විවෘත කරනු ලැබූ අතර ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ සහ පළමු මහලේ නවීකරණ කටයුතු 2018 ඔක්තෝබර් මස 12 වන දින ආරම්භ විය. එහි නවීකරණ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී. 2019 මුල් කාර්තුවේදී මෙම කටයුතු අවසන් කිරීමට නියමිතය.

- වැඩිම සේවාලාභීන් සංඛ්‍යාවක් පැමිණෙන ශාඛා කාර්යාල වන ගම්පහ, මාතර, රත්නපුර, කුරුණෑගල, අම්පාර, පොළොන්නරුව, මොණරාගල, සහ බදුල්ල සඳහා විදුලි උත්පාදක යන්ත්‍ර (ජෙනරේටර්) මිලදී ගැනීම.

## 5.6 ආයතනයේ මූල්‍ය ප්‍රගතිය (2018)

| ආදායම (රු.) | පුනරාවර්තන වියදම (රු.) | ප්‍රාග්ධන වියදම (රු.) |
|---|---|---|
| 762,452,582.62 | 416,532,273.08 | 59,686,972.92 |

## 5.7 2018 වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දුන් අභියෝග

- වේරහැර ශාඛා කාර්යාලය පිහිටි මෝටර් රථ ප්‍රවාහන පරිශ්‍රයේ ඉඩමේ කොටසක් වෙන් කර දීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් එකඟතාවය ලබා ගෙන ඇත. නමුත් ලැබෙන ඉඩ ප්‍රමාණය හා සීමාවන් මෙතෙක් තීරණය කිරීම ප්‍රමාදවීම ගැටලුකාරී තත්වයකි.

## 5.8 2019 වසරේ අපේක්ෂාවන්

- **වෛද්‍ය නිර්ණායක යාවත්කාලීන කිරීම හා නීතිගත කිරීම.**

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වෛද්‍ය නිර්නායක මේ දක්වා ක්‍රියාත්මක විය. එසේම යාවත්කාලින කිරීම් ද සිදු කර ඇත. එම යාවත්කාලින කිරීම් සෞඛ්‍යය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විශේෂඥ වෛද්‍ය පාසල් එනම්, අක්ෂි, විකලාංග ආදි පාසල් වල

එකඟත්වය ලබා ගැනීමට යොමු කර ඇත. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවද එම විශේෂඥ පාසල් සමඟ සාකච්ඡා වාර කිහිපයකටද ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සමඟ සහභාගි වී ඇත. මේ වන විට අක්ෂි සම්බන්ධ නීති මාලාව අක්ෂි විශේෂඥ වෛද්‍ය පාසල් එකඟතාවය ලැබීමෙන් පසු අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ පිළිබඳව අක්ෂි විශේෂඥ වෛද්‍ය පාසලේ විශේෂඥ වෛද්‍ය නිලධාරිනියකගේ ප්‍ර ධානත්වයෙන් ආයතනයේ සියලු වෛද්‍යවරු දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් 2018.10.12 දින ක්‍රියාත්මක විය. අනෙකුත් විශේෂඥ පාසල්වල නීති සංශෝධන එකඟත්වයන් ලැබුණු පසු නීතිගත කිරීමේ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

- **MT31A වෛද්‍ය පෝරමය වෙනුවට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් නිකුත් කරනු ලබන ආරක්ෂක උපක්‍රම සඳහා වෛද්‍ය පෝරමය භාවිතා කිරීම නීතිගත කිරීම.**

2012.09.01 දිනෙන් පසු MT31A වෛද්‍ය පෝරමය වෙනුවට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් මුද්‍රණය කරනු ලබන ආරක්ෂිත උපක්‍රම සහිත වෛද්‍ය පෝරම භාවිතා කිරීම ආරම්භ කරන ලදී. 2013.03.21 පසු ආයතනයේ ශාඛා කාර්යාල නොමැති දිස්ත්‍රික්ක වල හැර රියදුරු බලපත්‍රයට අදාළ වෛද්‍ය සහතිකය නිකුත් කිරීම අපගේ ආයතනය මඟින් පමණක් සිදු කරන ලදි. මේ වන විට සියලුම දිස්ත්‍රික්ක සඳහා ශාඛා කාර්යාල පිහිටුවා ඇත. ඒ අනුව ඉදිරි වර්ෂය තුළ MT31A වෛද්‍ය පෝරමය වෙනුවට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් මුද්‍රණය කරනු ලබන ආරක්ෂිත උපක්‍රම සහිත වෛද්‍ය පෝරම භාවිතා කිරීම නීතිගත කිරීමට බලාපොරොත්තු වේ.

- **පරිගණක ජාල ගත කිරීම**

2019 වර්ෂයේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමට බලාපොරොත්තු වන අතර එමඟින් පුද්ගලයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම, ව්‍යාජ වෛද්‍ය සහතික නිකුත් කිරීම වැළැක්වීම මඟින් මහජනතාවට අපහසුවක් නොවන පරිදි වඩාත් කාර්යක්ෂම සේවාවක් සැලසීම අපේක්ෂා කෙරේ.

- **ශාඛා කාර්යාල සඳහා ගොඩනැගිලි ඉදිකිරීම**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයිතිව ඇති මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යාලයක් පවත්වාගෙන යන ඉඩමෙන් වේරහැර ශාඛාව පිහිටුවීම සඳහා ඉඩ පහසුකම් වෙන් කරවාගෙන ඇත.

# 6.

# ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

## 6.1 හැඳින්වීම

ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරි පනතේ සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන යටතේ දේශීය සිවිල් ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූලික කාර්යභාරය වේ.

### දැක්ම

"සැම දෙනාටම නිරුපද්‍රිත අහසක් සහතික කරමින් ප්‍රවීණ හා විශ්වසනීය ගුවන්සේවා නිරුපද්‍රිතතා නියාමකයෙකු බවට පත් වීම"

### මෙහෙවර

"උපායමාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර නියාමනය මඟින්, ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමඟත් ජාතික ව්‍යවස්ථාමය අවශ්‍යතා සමඟත් අනුගත නිරුපද්‍රිත, සුරක්ෂිත, කාර්යක්ෂම, ක්‍රමවත් සහ පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන්සේවා පද්ධතියක් මෙහෙයවීම සුසාධනය කිරීම"

### ආදර්ශ පාඨය

"සැමට සුරැකි සහ කාර්යක්ෂම අහසක්"

### දර්ශනය

අපට ඉහළින් ඇති ගුවන් අවකාශය රටේ සහ ජාතියේ මතු පරම්පරාවේ ප්‍රගමනය සහ සෞභාග්‍යය උදෙසා කළමනාකරණය කළ යුතු සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ඇති මහත් විභවයක් සහිත පොදු වස්තුවකි.

## 6.2 කාර්යසාධනය (2018)

තාක්ෂණික අංශ 06 ක්, තාක්ෂණික නොවන අංශ 05 ක් සහ ඒකක 03 ක් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය සතුව පවතී.

### 6.2.1 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කාර්මික අංශ

1. **ගුවන් තොටුපළ අංශය**

   - **නියාමන සංවර්ධනය**

     - ගුවන්යානා වර්ගීකරණ විධිවිධාන සම්පූර්ණ කරන ලද අතර ගැසට් නිවේදනය 2018 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. ජල ගගන යාත්‍රාංගණ නියාමනය සම්බන්ධ පළමු කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදකයා විසින් අනුමත කරන ලද අතර අවශ්‍ය සංශෝධන ඇතුළත් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත යළි ඉදිරිපත් කරන ලදී.

- ගුවන් තොටුපොළවලට අදාළ වන ICAO ඇමුණුම 14 හි පළමුවන වෙළුමට සම්බන්ධ 31 වන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය සහ හෙලිකොප්ටර තොටුපොළවලට අදාළ වන ICAO ඇමුණුම 14 හි දෙවන වෙළුමට සම්බන්ධ 41 වන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය ඇමුණුම් සඳහා සිදු කරන ලද ප්‍රතිශෝධනවලට අනුකූල වන පරිදි සංශෝධනය කර ඇත.

- ඇමුණුම 9 ට අදාළ වන 60 වන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය සහ පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් ගුවන් තොටුපොළ මෙහෙයුම්කරුවන්ගේ බැඳීම් ප්‍රසිද්ධ කරන ලදී.

- ගුවන් නාවික අධ්‍යයන / ආරක්ෂක අවදානම ඇගයීම්, SLCAP 2150 - ගුවන්යානා ධාවන පථ නිරුපද්‍රිතතා වැඩසටහන් පැවැත්වීම පිළිබඳ ගුවන්තොටුපොළ මෙහෙයුම්කරුවන් SLCAP 2900 - මාර්ගෝපදේශ ලේඛන ප්‍රකාශයට පත් කරන ලදී.

- SLCAP 2100 - ගුවන්තොටුපොළ මෙහෙයුම් නිරුපද්‍රිතතා සංග්‍රහය යාවත්කාලීන කරන ලද අතර SLCAP 2950 - ගුවන් නාවුක අධ්‍යයන සඳහා තක්සේරු පටිපාටිය පිළියෙළ කර ප්‍රකාශයට පත් කරන ලදී.

➢ **සෝදිසි කිරීම්**

- ශ්‍රී ලංකාවේ ජාතික හා ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් වල සෝදිසි ක්‍රියාකාරකම් ඉටු කිරීම, වාර්තා ඉදිරිපත් කිරීම හා අධීක්ෂණය

- ජල ගගන යාත්‍රාංගණ හා හෙලිකොප්ටර තොටුපොළ පරීක්ෂාවට ලක් කිරීම හා තාක්ෂණික උපදෙස් ලබා දීම

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පෙර වැස්මෙන් ඉන්ධන කාන්දුවීමේ දී ආරක්ෂිත පෙර වැස්ම ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා මෙන්ම E පෙර වැස්ම පුළුල් කිරීමේ II වන අදියරේ 2 පියවරේ දී ද ගුවන්තොටුපොළ අංශය මඟින් විශේෂඥ සහාය ලබා දෙන ලදී.

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ බිම් මෙහෙයුම් කටයුතු පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ද ඉදිරිපත් කරන ලදී.

➢ **දේශීය ගුවන් තොටුපොළ සංවර්ධනය**

- බණ්ඩාරවෙල ප්‍රදේශයේ දේශීය ගුවන් තොටුපොළක් ඉදිකිරීම වෙනුවෙන් පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) ලබා ගෙන ඉතිරි කටයුතු සිදු කරමින් පවතී.

- සිවිල් ගුවන් මෙහෙයුම් කටයුතු සඳහා හිඟුරක්ගොඩ ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමේ කටයුතු ආරක්ෂක අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන අතර ඇස්තමේන්තු සකස් කර අවසන් කර ඇත.

- පලාලි ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම සඳහා පිරිවැය ඇස්තමේන්තුව පිළියෙළ කිරීමට සීමාසහිත ගුවන් තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) ලිමිටඩ් වෙතින් සහාය ඉල්ලා සිටින ලදී. පිරිවැය ඇස්තමේන්තුව රු. මි. 1,950 ක් වී තිබුණි. මෙම අරමුදල් සිවිල් ගුවන්සේවා අධිකාරියෙන් රු.මි. 950 ක් හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් රු.මි. 1,000 ක් දරන අතර ඉදි කිරීම් කටයුතු ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් සිදු කිරීමට නියමිතය.

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ දෙවන ගුවන්යානා ධාවන පථයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අවශ්‍ය යෙදවුම් මෙගාපොලිස් අමාත්‍යංශයට ලබා දෙන ලදී.

## 2. ගුවන් නාවිකසේවා අංශය

සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් යවන ලද රාජ්‍ය ලිපිලේඛනවල ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම එම ලිපි සඳහා ලබා දිය හැකි ප්‍රතිචාර සම්බන්ධයෙන් ද ගුවන් නාවිකසේවා අංශය (ANS) කටයුතු කරන ලදී.

### ➢ නියාමන සංවර්ධනය

2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනතට අනුව, විශේෂයෙන්ම පනතේ 120 වන වගන්තියට අනුකූලව, 2018 වර්ෂය තුළ කාර්යසාධන සමාලෝචන කාල පරිච්ඡේදය තුළ ගුවන් නාවිකසේවා සැපයුම්කරු සහතිකය සඳහා තෘප්තිමත් කළ යුතු අවශ්‍යතා පිළිබඳ රෙගුලාසි (ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති 087 මූලික නිකුත් කිරීම සහ සංශෝධන 1) සහ ගුවන් නාවිකසේවා විධිමත් කිරීම සඳහා ගුවන් රීති පිළිබඳ සංශෝධිත රෙගුලාසි (ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති 026) ප්‍රකාශයට පත් කිරීමට ගුවන් නාවිකසේවා අංශය සමත් විය.

### ➢ සහතිකකරණ

තවද, නිරුපද්‍රිත ගුවන් ගමන් මෙහෙයුම් සඳහා නිකුත් කරන ලද ගුවන් නාවික තොරතුරු ප්‍රකාශනය (AIP) යාවත්කාලීන කිරීම සඳහා සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ සංශෝධන දෙකක් නිකුත් කිරීම ද, ගුවන් මෙහෙයුම් කටයුතුවල නිරුපද්‍රිතතාව විධිමත් කිරීම සඳහා ගුවන් නැවියන් වෙත දැනුම් දීම (NOTAM) 295 නිකුත් කිරීම සහ උපලේඛනගත නොවූ ගුවන් යානා 641 කට ශ්‍රී ලංකා දේශයට ඉහළින් පියසාර කිරීමේ අවසරය සහ උපලේඛනගත නොවූ ගුවන් යානා 498 කට ශ්‍රී ලංකා භූමිය මත ගොඩබෑම සඳහා අවසර ලබා දී ඇත.

### ➢ සෝදිසි කිරීම්

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද "ගුවන් නාවික සේවා සෝදිසි සැලසුම 2018" ට අනුකූලව මෙම අංශය අඛණ්ඩ සෝදිසි කිරීම් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ නිරුපද්‍රිතතා අධීක්ෂණ පද්ධතියේ සඵලදායිතාවය තහවුරු කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, රත්මලාන සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ මෙහෙයුම් මධ්‍යස්ථානවල ද, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ රත්මලාන ගුවන් තොටුපොළේ ගුවන් නාවික තොරතුරු සේවා (AIS) මධ්‍යස්ථානවල දී සහ රත්මලාන, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ අත්තිඩිය, පිදුරුතලාගල සහ කන්දපොළ පිහිටි ගුවන් සංතරණ සහ සෝදිසි කිරීමේ (CNS) මධ්‍යස්ථානවල ද, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, රත්මලාන සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ MET මධ්‍යස්ථානවල ද, ගුවන් සංතරණ සේවා පටිපාටිය-ගුවන් යානා මෙහෙයුම් ඒකකයේ දී ද ලේඛනගත විධිමත් පරීක්ෂණ 107 න් 104 ක්ම සිදු කරන ලදී.

3. ගුවන් යානා මෙහෙයුම් අංශය

➢ **නියාමන සංවර්ධනය**

2018 වර්ෂයේ දී මෙහෙයුම් අංශය මඟින් කර්මාන්තයේ අනුකූලතාවය සඳහා රෙගුලාසි, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති, නියෝග සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම / ප්‍රතිශෝධනය කිරීම සිදු කර ඇත.

➢ **විදේශීය ගුවන් මෙහෙයුම්කරුවන්**

මෙහෙයුම් අංශයෙන් පහත සඳහන් ගුවන්සේවා සමාගම් සඳහා මූලික විදේශීය ගුවන් මෙහෙයුම් සහතික හයක් නිකුත් කර ඇත.

- එන්ටර් එයාර්
- එඩල්වයිස්
- ඒරොප්ලොට්
- රොසියා
- තායි එයාර් ඒෂියා
- තායි ලයන්

මෙහෙයුම් අංශය මඟින් ශ්‍රී ලංකාව වෙත වර්තමානයේ මෙහෙයවනු ලබන ගුවන්සේවා සමාගම් සඳහා නිකුත් කරන ලද විදේශ ගුවන් මෙහෙයුම්කරු සහතික විසි අටක් අළුත් කර ඇත.

➢ **අන්තරායකාර භාණ්ඩ ප්‍රවාහනය**

2018 වර්ෂය තුළ මෙම අංශය මඟින් අන්තරායකාර භාණ්ඩ රෙගුලාසි අවසරපත් 13 ක් අලූත් කර ඇත.

➢ **නම් කළ පරීක්ෂණ නියමුවන් (DCP) අධීක්ෂණය කිරිම සහ නියමු ප්‍රවීණතා පරීක්ෂණ (PPC) අනුමති**

මුල් නම් කළ පරීක්ෂණ නියමු (DCP) අනුමත කිරීම් පියසර කාර්ය මණ්ඩල සාමාජිකයින් හත්දෙනෙකු සඳහා නිකුත් කරන ලද අතර සහ එයින් විසි හතරක් අලූත් කරන ලදී. නියමු ප්‍රවීණතා පරීක්ෂණ තිස් හතක් සිදු කරන ලදී.

➢ **සෝදිසි කිරීම**

ශ්‍රී ලංකාවේ සඵලදායි නිරුපද්‍රිතතා අධීක්ෂණ පද්ධතියක් පැවතීම තහවුරු කිරීම සඳහා අනුමත සෝදිසි සැලැස්මට අනුකූලව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ නියාමන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කිරීම සඳහා මෙහෙයුම් අංශය මඟින් නිරන්තරයෙන් දේශීය හා විදේශීය ගුවන් මෙහෙයුම්කරුවන් පිළිබඳ සෝදිසි කිරීම් අඛණ්ඩව සිදු කරනු ලැබේ.

මේ යටතේ සෝදිසි කිරීමේ ක්‍රියාකාරකම් 206 ක් මෙහෙයුම් අංශය මඟින් 2018 වසරේ දී සිදු කරන ලදී.

➢ **ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) විශ්ව නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන වැඩසටහන (USOAP)**

2018 ජූනි මාසයේ දී, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) මඟින් විශ්ව නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණන වැඩසටහන (USOAP) යටතේ මෙහෙයුම් අංශය විගණනයට භාජනය කරන ලදී. සමස්තයක් වශයෙන් මූල පත්‍රිකා ප්‍රශ්න 462 කට පිළිතුරු ලබා දිය යුතු වූ අතර එයින් මූල පත්‍රිකා ප්‍රශ්න 146 කට මෙහෙයුම් අංශය පිළිතුරු ලබා දුන් අතර එමඟින් සඵලදායි ක්‍රියාත්මක කිරීම සඳහා 89.13% ක් අත්පත් කර ගැනිමට මෙහෙයුම් අංශය සමත් විය. 2010 වසරේ දී සිදු කරන ලද පූර්ව විගණනයට සාපේක්ෂව මෙය 4.83% ක වර්ධනයකි.

### 4. ගුවන්යානා ලියාපදිංචි කිරීම හා ගුවන් යෝග්‍යතා අංශය

සිවිල් ගුවන්සේවා අධිකාරියේ ගුවන්යානා ලියාපදිංචි කිරීම හා ගුවන් යෝග්‍යතා අංශය ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය මඟින් නියම කර ඇති ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්වලට අනුකූලව ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් යානා ලියාපදිංචි කිරීම සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන්යානාවල ගුවන් යෝග්‍යතාව අධීක්ෂණය කිරීම සඳහා රීති හා ක්‍රියාපටිපාටි හුවමාරු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් වගකිව යුතු වේ. ගුවන් යානා නඩත්තු සංවිධාන සඳහා අනුමැතිය ලබා දීම සහ ඒවායේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම මෙයට ඇතුළත් වේ.

➢ **ගුවන් යෝග්‍යතාව සහතික කිරීම**

2018 ජනවාරි සිට 2018 දෙසැම්බර් දක්වා කාල සීමාව සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් ලැබී ඇති අයදුම්පත් සහ අනෙකුත් අදාළ ලියකියවිලි ඇගයීමෙන් අනතුරුව පහත දක්වා ඇති අනුමැතීන් ලබා දී ඇත.

| | | මුල් | අලුත් කිරීම් |
|---|---|---|---|
| 1. | ගුවන්යානාවල ගුවන් යෝග්‍යතාව | 06 | 69 |
| 2. | නඩත්තු පුහුණු සංවිධාන | | 05 |
| 3. | අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණය සංවිධාන | | 03 |
| 4. | ගුවන්යානා ලියාපදිංචි කිරීම | 04 | 67 |
| 5. | අනුමත නඩත්තු ආයතන | | 71 |

➢ **නිරුපද්‍රිතතා අධීක්ෂණය**

සමස්තයක් වශයෙන් රැම්ප් පරීක්ෂණ 93 ක් සහ රාත්‍රී පරීක්ෂණ 40 ක් සිදු කරන ලදී. කර්මාන්තයෙන් සමස්තයක් වශයෙන් සිදුවීම් පිළිබඳ වාර්තා 138 ක් ලැබුණු අතර නිරුපද්‍රිතතා අධීක්ෂණ වැඩසටහනේ කොටසක් වශයෙන් ඒවා විශ්ලේෂණය කරන ලදී.

➢ **අනෙකුත් කාර්යයන්**

වීසා නිකුත් කිරීම සඳහා නිර්දේශ ලබාදීම, අමතර කොටස් සඳහා අනුමැතිය ලබා දීම මේ යටතේ සිදු කර ඇත.

### 5. ගුවන් සේවා සුරක්ෂිතතා අංශය

➢ **නියාමන සංවර්ධනය**

2018 වසරේ දී, ගුවන් සේවා සුරක්ෂිතතා අංශය සිවිල් ගුවන්සේවා රෙගුලාසි පැනවීමේ ක්‍රියාවලියේ ප්‍රධාන වශයෙන්ම නිරතව සිටි අතර මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ අඛණ්ඩව රැස්වීම් සහ සාකච්ඡා පවත්වන ලදී.

➢ **සහතිකකරණ ක්‍රියාකාරකම්**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ගුවන්සේවා සුරක්ෂිතතා සේවා සැපයුම්කරුවන් සහතික කිරීම, ගුවන්සේවා සුරක්ෂිතතා පිරිස් සහතිකකරණය, ගුවන්සේවා සුරක්ෂිතතා පිරික්සුම් උපකරණ සහතිකකරණය, ගුවන් මෙහෙයුම්කරු සහතිකකරණය අඛණ්ඩව සිදු කරන ලදී.

- **සෝදිසි කිරීමේ ක්‍රියාකාරකම්**

2018 වර්ෂයේ අනුමත සෝදිසි කිරීමේ සැලැස්මට අනුකූලව අංශයේ පරීක්ෂකවරුන් විසින් පිරික්සුම් - 39 ක්, පරීක්ෂා - 04 ක් හා විගණන - 01 ක් සිදු කර ඇති අතර මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ දී සවිස්තරාත්මක පරීක්ෂණයක් පවත්වන ලදී.

- **වෙනත් තොරතුරු**
  - **ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා කමිටුව**

ගුවන්සේවා සුරක්ෂිතතා ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් මුලසුන දරන ලද ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා කමිටු (NCASC) රැස්වීම් දෙකක් 2018 පෙබරවාරි හා ඔක්තෝබර් මාසවල දී කැඳවන ලදී.

- **ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයට (ICAO) ප්‍රවීණතාව ලබා දීම**

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ආරාධනයට අනුව, ගුවන්සේවා සුරක්ෂිතතා අධ්‍යක්ෂ, පී. ඒ. ජයකාන්ත මහතා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ ගුවන්සේවා සුරක්ෂිතතා විගණකයකු (ICAO) වශයෙන් 2018 මැයි සහ නොවැම්බර් යන මාසවල මියන්මාර් ඒකාබද්ධ රාජ්‍ය සහ බංගලාදේශ මහජන සමූහාණ්ඩුව යන රටවල ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) විශ්ව සුරක්ෂිතතා විගණන දූත මෙහෙවර දෙකක් සඳහා සහභාගී විය.

- **ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ආසියා පැසිපික් සහයෝගීතා ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහනේ (CASP-AP) ක්‍රියාකාරකම්**

දිවයිනේ සිවිල් ගුවන්සේවයේ මානව සම්පත් සම්බන්ධ ගුවන්සේවා සුරක්ෂිතතා අවදානම් කළමනාකරණ හැකියාවන් ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙනුවෙන් ගුවන්සේවා සුරක්ෂිතතා අංශයේ දායකත්වය මගින් 2018 ඔක්තෝබර් මස 09 සිට 12 දක්වා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) අවදානම් කළමනාකරණ වැඩමුළුව සඳහා ද, 2018 ඔක්තෝබර් මස 15 සිට 17 දක්වා ආසියා පැසිපික් සහයෝගීතා ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහනේ (CASP-AP) ජාතික අවදානම් සන්දර්භ ප්‍රකාශන වැඩමුළුව සඳහා ද සත්කාරකත්වය ලබා දීම මඟින් පහසුකම් සපයන ලදී. මෙම වැඩමුළුවල ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාව සඳහා අවදානම් සන්දර්භ ප්‍රකාශනය සකස් කිරීම සඳහා දේශීය සහභාගීවන්නන් සමඟ කණ්ඩායමක් ස්ථාපනය කරනු ලැබීය.

- **ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ජාත්‍යන්තර පුහුණු / රැස්වීම් / වැඩමුළු සඳහා සහභාගී වීම**

ගුවන්සේවා සුරක්ෂිතතා අංශයට අනුයුක්ත කරන ලද සේවකයින්ට විෂය කරුණු සම්බන්ධයෙන් පුළුල් දැනුමක් සහ අත්දැකීම් ලබා ගැනීම සඳහා විදේශ රටවල පවත්වන ලද පුහුණුවීම්, සම්මන්ත්‍රණ සහ රැස්වීම් සඳහා සහභාගී වීමේ අවස්ථා ලබා දී ඇත.

- **ගුවන් යානයක් තුළ ආයුධ / ගුවන් භාණ්ඩ රැගෙන යාම සඳහා අනුමැතිය ලබා දීම**

ශ්‍රී ලංකාවේ ගුවන් අවකාශය තුළ ශ්‍රී ලංකාව තුළ පිහිටි ගුවන් තොටුපොළ වෙත / තොටුපොළවලින් යුද්ධායුධාදි යුද්ධෝපකරණ රැගෙන යෑම සඳහා අනුමැතිය ලබා දීම සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරී ඇති අතර ගුවන් යානයේ ගුවන් භාණ්ඩ රැගෙන යන ස්ථානවල යුද්ධෝපකරණ රැගෙන යෑම සඳහා අනුමති 163 ක් ද, ගුවන් යානය තුළ යුද්ධෝපකරණ රැගෙන යෑම සඳහා අනුමති 53 ක් ද ලබා දෙන ලදී.

### 6. පුහුණු ආයතන සහ පිරිස් බලපත්කරණ අංශය

අදාළ ජාත්‍යන්තර ප්‍රමිති හා නිර්දේශිත පරිචයන් වලට අනුකූලව, සිවිල් ගුවන්සේවා ආශ්‍රිත නිරුපද්‍රිතතා සංවේදී ක්‍රියාකාරකම්වල නිරත වන පුහුණු සංවිධාන සහ පුද්ගලයන් පිළිබඳ සහතිකකරණය සහ සෝදිසි කිරීමට අදාළ වන රීති සහ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පුහුණු ආයතන සහ පිරිස් බලපත්කරණ අංශය ක්‍රියාත්මක වේ. මේ යටතේ නියාමන කටයුතු, සහතිකතරණය හා සෝදිසි කිරීම් සිදුවන අතර ප්‍රථමාධාර පුහුණුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ කාර්ය මණ්ඩලය සඳහා දැනුම් විභාග පැවැත්වීම සිදු කරනු ලැබේ.

### 6.2.2 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ තාක්ෂණික නොවන අංශ

1. **ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය**

   ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය ශ්‍රී ලංකා ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීමේ වගකීම දරන සිවිල් ගුවන්සේවා අධිකාරියේ ආයතනික අංශයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ගුවන් සේවා සාකච්ඡා සහ ගිවිසුම්, ගුවන් ගමන් කාලසටහන අනුමත කිරීම්, ගුවන්සේවා සමාගම්වල සේවය කරන විදේශිකයන් සඳහා වීසා නිර්දේශ කිරීම, ගුවන් ප්‍රවාහන සේවා සපයන්නන් සඳහා බලපත්‍ර ලබා දීම, පාරිභෝගික ආරක්ෂණය මෙම ක්‍රමෝපායික අරමුණු සපුරා ගැනීම සඳහා සිදු කරනු ප්‍රධාන ක්‍රියාකාරකම් මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

   - **ගුවන් සමාගම්වල මෙහෙයුම් කටයුතු**

     අදාළ වසර තුළ, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් සමාගම ද ඇතුළත්ව ලේඛනගත ගුවන් සමාගම් 35 ක් ශ්‍රී ලංකාව වෙත / ශ්‍රී ලංකාවෙන් පිටතට ගුවන් යානා මෙහෙයවන ලදී. ඉන්ඩිගෝ එයාර්ලයින්ස්, ඒරොෆ්ලොට්, එඩල්වීස්, තායි එයාර් ඒෂියා, චොංකින්ග් ගුවන් සමාගම් මෙම වසර තුළ මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතය.

   - **ප්‍රඥප්තිය, තත් කාර්ය සහ ව්‍යාපාරික ජෙට් මෙහෙයුම්කරුවන්**

     2018 IATA ශීත ඍතුවේ සිට කුලී ගුවන් සමාගම් හයක් ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරන ලද අතර එම කුලී ගුවන් සමාගම් අසර් එයාර් (රුසියාව), එන්ටර් එයාර් (පෝලන්තය), රෝයල් ෆ්ලයිට්ස් (රුසියාව), තෝමස් කුක් එයාර්ලයින්ස් (එක්සත් රාජධානිය), ට්‍රැවල් සර්විස් පොල්ස්කා (එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රාස් අල් කයිමාහ් ජාත්‍යන්තර ගුවන් තොටුපොළ) සහ TUI එයාර්ලයින්ස් (එක්සත් රාජධානිය).

   - **ලක්සම්බර්ග් නගරයේ බලධාරීන් සමඟ ද්විපාර්ශ්වික ගුවන් සේවා හමුවීම්**

     ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2018 ජූලි මස 25 සහ 26 යන දිනයන්හි ලක්සම්බර්ග් නගරයේ බලධාරීන් සමඟ පැවති රැස්වීම් මඟින් පහත සඳහන් කාර්යයන් ඉටු කර ගත හැකි විය.

1. ලක්සම්බර්ග් සමග ප්‍රථම වරට ගුවන්සේවා ගිවිසුමක් ආරම්භ කිරීම සහ මගීන් සහ භාණ්ඩ සඳහා සීමාරහිත තුන්වන හා සිව්වැනි නිදහස් ගුවන් ගමන් අයිතිවාසිකම් ලබා ගත හැකි වන පරිදි අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

2. අවබෝධතා ගිවිසුම මඟින් දෙපාර්ශ්වයම සඳහාම ගුවන් භාණ්ඩ සඳහා පමණක් සීමා කර ඇති 5 වන නිදහස් ගුවන් ගමන් අයිතිවාසිකම ද ලබා දී ඇත.

3. ශ්‍රී ලංකාවෙන් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් සමාගම සහ ලක්සම්බර්ග් සඳහා කාර්ගොලක්ස් සහ ලූක් එයාර් ලක්සම්බර්ග් ගමනාන්තය දක්වා ගමන් කිරීම.

- ICAN 2018

අප්‍රිකානු මහාද්වීපයේ පැවැත්වීමට නියමිත 2 වන ICAN සමුළුව කෙන්යාවේ ජනාධිපති අතිග රු උහුරු කෙන්යාටා මැතිතුමා විසින් විවෘත කරන ලදී. ICAO කවුන්සිලයේ සභාපතිවරයා සහ ICAO හි ගුවන් ප්‍රවාහන කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා ද සහභාගී වූහ. අධ්‍යක්ෂ (ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන) ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය නියෝජනය කරන ලදී.

- **ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන් (මගී) බලපත්‍ර (සංචාරක නියෝජිතායතන බලපත්‍ර)**

1992 අංක 55 දරණ ගුවන් සංතරණ පනතේ විධිවිධාන මඟින් සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත මගින් ගුවන් මගීන්, භාණ්ඩ හා ගුවන් තැපැල් රැගෙන යෑමට බලපත්‍ර ලාභීන්ට අවසර දෙනු ලැබේ. 2018 වර්ෂය තුළ, A කණ්ඩායමේ නියෝජිතයන් සඳහා බලපත්‍ර 24 ක් ද, B කණ්ඩායමේ නියෝජිතයන් සඳහා බලපත්‍ර 26 ක් නිකුත් කරන ලද අතර ඒ අනුව, නව බලපත්‍ර 50 ක් නිකුත් කරන ලදී.

- **වලංගු කාලය ඉකුත් වූ බලපත්‍රලාභීන්ගේ ව්‍යාපාර අවසන් කිරීම**

GDS සපයන්නන් දැනුවත් කිරීම මඟින් කල් ඉකුත් වූ බලපත් හිමියන්ගේ GDS පහසුකම් විසන්ධි කිරීමට මෙම අංශය පියවර ගෙන ඇත.

- **ප්‍රවාසිකයන් සඳහා වීසා නිර්දේශ (සිසුන් හැර)**

මෙම අංශයෙන් නව වීසා බලපත්‍ර ඉල්ලීම් 54 ක් ද, කලත්‍රයා සහ දරුවන් ඇතුළත්ව වීසා අලුත් කිරීම සඳහා ඉල්ලීම් 48 ක් ද ලෙස කර්මාන්තය සඳහා නිර්දේශ 102 ක් නිකුත් කර ඇත. ඉහත නිර්දේශ අතරින් ප්‍රවාසිකයන් 36 දෙනෙකු තාක්ෂණික කාර්ය මණ්ඩලය ලෙස ද, ප්‍රවාසිකයන් 40 දෙනෙකු තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලය ලෙස ද නිර්දේශ කර ඇත.

- **සංචාරක නියෝජිතයින් සහ ගුවන් සමාගම්වලට එදිරිව පාරිභෝගික පැමිණිලි**

සමාලෝචිත වසර තුළ, මගීන්ගෙන් පැමිණිලි 52 ක් ලැබී ඇති අතර වසර අවසානයේ දී, පැමිණිලි 15 ක් විසඳා සමථයකට පත් කිරීමට එම අංශයට හැකියාව ලැබුණි. අනෙකුත් පැමිණිලි විමර්ශනය කරමින් පවතින අතර එම පැමිණිලි සතුටුදායක අන්දමින් විසඳීමට අපේක්ෂා කෙරේ.

- **භූමි සහායක සේවා අවසරපත් - (ස්ථාවර දුරකථන ක්‍රියාකරු බලපත්‍ර)**

සමාලෝචනයට භාජනය වන අදාළ වර්ෂය තුළ, හසුරුවන්නන් සඳහා භූමි සහායක සේවා අවසරපත් 4 ක් නිකුත් කරන ලද අතර තවත් 4 ක් අලුත් කරන ලදි.

- **ගුවන් සමාගම් බලපත්කරණය**

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්, සිනමන් එයාර්, හෙලි ටුවර්ස් සහ ෆිට්ස් ඒවියේෂන් ගුවන් සමාගම ඔවුන්ගේ ගුවන් සමාගම් බලපත්‍රය අලූත් කර ඇති අතර මෙම කාල පරිච්ඡේදය තුළ නව ගුවන් සමාගම් බලපත්‍ර නිකුත් කර නොමැත.

සීමාසහිත ඒඩබ්එස් ඇවියේෂන් පුද්ගලික සමාගම වෙත 2018 වර්ෂයේ දී නව කුලී ගුවන් ගමන් බලපත්‍රයක් ලබා දී ඇත. එමෙන්ම, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ෆිට්ස් ඇවියේෂන්, දයා ඇවියේෂන්, එෆ් එයාර්, ෆ්ලයි සදර්න් ඇවියේෂන්, මිලේනියම් ඇවියේෂන්, ස්කයිලාර්ක් ඇවියේෂන්, සකුරායි ඇවියේෂන් සහ එයාර් සෙනොක් යන ගුවන් සමාගම් ඔවුන්ගේ කුලී ගුවන් ගමන් බලපත්‍ර 2018 වර්ෂයේ දී අලූත් කර ඇත.

පෞද්ගලික ගුවන් ගමන් මෙහෙයවීම සඳහා බලය ලබා දී ඇති එකම ගුවන් සමාගම වන්නේ දයා ඇවියේෂන් ගුවන් සමාගමයි. එම ගුවන් සේවා සමාගම සඳහා ලබා දි ඇති බලය මෙම වසර තුළදී අලුත් කර ඇත.

- **ගුවන් ගමන් වාර සමායෝජනය**

2018 IATA ගිම්හානය සහ 2018/19 IATA ශීත කාලය සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ (BIA) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ (MRIA) ගුවන් ගමන් වාර සමායෝජනය සඳහා රැස්වීම් 2 ක් පවත්වන ලදී. විවිධ සීමා කිරීම් මත පදනම්ව, පැයකට වාර වෙන් කිරීමේ උපමානය වන්නේ ගුවන් යානා පැමිණීම් 10 ක් සහ පිටත්ව යෑම් 12 කි. කෙසේ වුවද, ඕනෑම පැයක් තුළ, මුළු සංචලන ප්‍රමාණය 15 කට සීමා වී ඇත. නිත්‍ය වශයෙන් සිදු කරන ගුවන් යානා ධාවන පථය නඩත්තු කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා ගුවන් යානා මෙහෙයුම් කටයුතු සඳහා බදාදා (තෙවන දිනය) දින පැය 14:30 සිට 17:00 දක්වා ඉඩ ලබා දී නොමැත.

- **නව රෙගුලාසි සහ උපදෙස් හඳුන්වා දීම**

ගුවන් යානාවල ආසන වෙන් කිරීමේ මෙහෙයුම් කටයුතු සඳහා සුදුසුකම් ලබා ගැනීමට සඵලදායක IATA මෙහෙයුම් නිරුපද්‍රිතතා විගණන වාර්තා පවත්වා ගැනීම සඳහා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් "ගුවන් යානාවල ආසන වෙන් කිරීමේ හවුල්කරුවන් සඳහා IATA මෙහෙයුම් නිරුපද්‍රිතතා විගණනය පිළිගැනීමේ වැඩසටහන" පිළිබඳව ශ්‍රී ලාංකික ගුවන් මෙහෙයුම්කරු සහතිකලාභීන්ට මෙන්ම සියලූම විදේශීය ගුවන්යානාවල ආසන වෙන් කිරීමේ හවුල්කරුවන් සඳහා අංක AT/01/2018 දරණ 2018 මැයි මස 10 දිනැති නියෝගයක් නිකුත් කරන ලදී.

- **ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තිය**

ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තියේ කෙටුම්පත් පිළියෙළ කිරීම සහ උපදේශනාත්මක ක්‍රියාවලිය සම්බන්ධයෙන් මෙම අංශය සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGCA) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (CAER) සමග එක්ව කටයුතු කරන ලදී. මෙම වසර තුළ පාර්ශ්වකරුවන් විසින් අවසානයේ දී එකඟ වී ඇති කෙටුම්පත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2. **පර්යේෂණ, සංවර්ධන සැලසුම් සහ විශේෂ වැඩසටහන් අංශය**

- **ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය සඳහා සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ දායකත්වය පිළිබඳ පර්යේෂණ**

2017 වර්ෂයේ දී, මෙම අධිකාරිය මඟින් "ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය සඳහා සිවිල් ගුවන්සේවා අංශයේ දායකත්වය නිර්ණය කිරීම" යන තේමාවෙන් පර්යේෂණයක් සිදු කිරීම ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) විසින් පර්යේෂණ සඳහා වඩාත් සුදුසු උපදේශන ආයතනය තෝරා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම (RFP) පිළියෙළ කිරීම සම්පූර්ණ කරන ලදී.

යෝජනා ඉදිරිපත් කරන ලෙස සිදු කරන ලද ඉල්ලීමට අනුව, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) වෙත යෝජනා ලැබී තිබුණි. මෙම යෝජනා තාක්ෂණිකව සහ මූල්‍ය වශයෙන් තක්සේරු කරන ලද අතර මේ වන විට සීමාසහිත මාස්ටර් හෙලීස් ඉංජිනියරින් කන්සල්ටන්ට් (පුද්) සමාගම පර්යේෂණ උපදේශන ආයතනය වශයෙන් තෝරා ගන්නා ලදී.

➢ **ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ලේඛන, වාර්තා සහ සඟරා ප්‍රකාශයට පත් කිරීම**

සංස්ථාපිත සැලැස්ම වැඩි දියුණු කිරීමේ කටයුතු සහ සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තා සම්පාදනය කිරීමේ කටයුතු ද එම වාර්තා ප්‍රසිද්ධ කරමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, අදාළ රජයේ ආයතන සහ කර්මාන්තයේ වෙනත් පාරිභෝගිකයන් වෙත එම වාර්තා ඉදිරිපත් කිරීමේ කටයුතු ද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) මඟින් සම්පූර්ණ කර ඇත.

➢ **සංඛ්‍යාලේඛන හා පුරෝකථනය**

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සියලුම අංශ නියෝජනය කරමින් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන සංඛ්‍යාලේඛන දත්ත පදනම 2018 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබීය.

රූ. මි. 803 ක පිරිවැයක් දරමින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සම්පූර්ණ කරන ලදී. කටුනායක, නයිකන්ද ප්‍රදේශයේ ඉදිකළ මෙම ගොඩනැගිල්ල 2018 මාර්තු මස 29 වන දින විවෘත කරන ලදී.

➢ **ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මාධ්‍ය හැසිරවීම සහ ප්‍රවර්ධනය**

ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ, පාසැල් වැඩසටහන් අටක් පවත්වන ලද අතර 2018 දෙසැම්බර් මාසයේ අවසානය වන විට පාසැල් ගුවන් සේවා සමාජ 584 ක් ආරම්භ කිරීමට සහාය ලබා දෙන ලදී. "ගුවන්සර" ගුවන්සේවා සඟරා දෙකක් නිකුත් කරන ලද අතර ඒවා පාසැල් 3,100 ක් අතර නොමිලයේ බෙදා දෙන ලදී. මීට අමතරව, සෑම සෙනසුරාදා දිනකම "ගුවන් සැරිසර" රූපවාහිනී වැඩසටහන් විකාශනය කරන ලදී.

➢ **තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය**

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ තත්ත්ව කළමනාකරණය වැඩිදියුණු කිරීම, තත්ත්ව හා අභ්‍යන්තර විගණන අංශය ස්ථාපනය කිරීමේ ප්‍රධාන අරමුණ වේ. සලකා බලන ලද කාල පරිච්ඡේදය තුළ විවිධ විගණන 103 ක් පවත්වා ඇත.

3. **මානව සම්පත් සහ කාර්යාල කළමනාකරණ අංශය**

➢ **සංවිධානාත්මක ප්‍රතිසංස්කරණ හා කාර්ය මණ්ඩලීකරණය**

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා නිරුපද්‍රිතතා නියාමකයා වශයෙන් ක්‍රියා කිරීමේදී අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මානව සම්පත් සහ අනෙකුත් සම්පත් කළමනාකරණය කිරීමේ දී මානව සම්පත් සහ කාර්යාල කළමනාකරණ අංශය අධිකාරිය වෙත ස්වකීය සහාය ලබා දෙනු ලබයි. අධිකාරියේ කාර්යයන් මෙහෙයවීම සඳහා අධිකාරිය වෙත පුහුණු දක්ෂ ශ්‍රම බලකායක් සැපයීම සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය විසින් උත්සාහ දරා ඇත. මෙම ප්‍රතිසංස්කරණය කරන ලද ආයතනික ව්‍යුහය අනුගමනය කරමින්, පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් 2018 වසරේ දී සිදුවූ අතර එමඟින් කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 181 ක් දක්වා ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබුණි. සමාලෝචිත වර්ෂය තුළ, අනුමත වූ සංවිධාන ව්‍යුහයට අනුකූල වන පරිදි, කාර්ය මණ්ඩලය සඳහා නව බඳවා ගැනීම් 14 ක් සිදු කරන ලදී.

➢ **පුහුණු කිරීම්, සමුළු, වැඩමුළු, රැස්වීම් සහ සම්මන්ත්‍රණ**

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය රැකියා කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය පිළිබඳ සීමා පනවා තිබියදීත්, දේශීය හා විදේශීය වශයෙන් මානව සම්පත් සංවර්ධන කටයුතු සඳහා වැය කර ඇති මුදල 16,769,615.05 ක් වේ.

**6.2.3 ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ඒකක**

1. **ගුවන්යානා අනතුරු විමර්ශන ඒකකය**

නීතිපතිවරයා විසින් සහතික කරන ලද ගුවන්යානා අනතුරු විමර්ශන කාර්යාංශය පිළිබඳ සම්පූර්ණ කරන ලද අවසන් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

නියමුවන් රහිත ගුවන් යානා පද්ධති මෙහෙයවීම පිළිබඳ රෙගුලාසි හා ගුවන්සේවා ආපදා පවුල් සහාය පිළිබඳ රෙගුලාසි කෙටුම්පත් කරන ලදී.

2018 වසරේ දී, ICAO-USOAP සම්බන්ධයෙන් හදිසි අනතුරු විමර්ශන ක්ෂේත්‍රය යටතේ අවශ්‍ය කටයුතු සම්පූර්ණ කරන ලදී. මේ සම්බන්ධව රාජ්‍ය ගුවන්සේවා විගණන ප්‍රශ්නාවලිය, අනුකූලතා පිරික්සුම් ලැයිස්තුව, නිවැරදිකිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සහ හදිසි අනතුරු විමර්ශනය (AIG) විගණන ක්ෂේත්‍රය තුළ ස්වයං තක්සේරු කිරීම සමග සන්ධාන ප්‍රශ්න සම්පූර්ණ කිරීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා ගුවන් නාවික තොරතුරු ප්‍රකාශයේ (AIP) දක්වා ඇති "ගුවන්යානා හදිසි අනතුරු සහ සිදුවීම් පිළිබඳ නිවේදනය" පිළිබඳ නාවික තොරතුරු චක්‍රලේඛය (AIC) ශ්‍රී ලංකා ගුවන් නාවික තොරතුරු ප්‍රකාශයේ (AIP) දක්වා ඇති පරිදි "ගුවන් යානා ක්‍රියාකරුවන්, ගුවන්තොටුපොළ ක්‍රියාකරුවන් සහ ගුවන් නාවික සේවා සපයන්නන්ගේ ගුවන්යානා හදිසි අනතුරු සහ බරපතල සිදුවීම් පිළිබඳ අනුකූලතා අවශ්‍යතා" පිළිබඳ නාවික තොරතුරු චක්‍ර ලේඛයක් (AIC) වශයෙන් ප්‍රතිශෝධනය කර ප්‍රකාශයට පත් කරන ලදී.

2012 වර්ෂයේ දී සිංගප්පූරුවේ ගුවන් හදිසි අනතුරු විමර්ශන කාර්යාංශය සමඟ අත්සන් තබන ලද ප්‍රතිඥානය ප්‍රතිශෝධනය කරන ලද අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය සහ සිංග ප්පූරුව ප්‍රවාහන නිරුපද්‍රිතතා විමර්ශන කාර්යාංශය යන දෙපාර්ශවය විසින් 2018 අප්‍රේල් මාසයේදී සිංගප්පූරුවේ දී අත්සන් තබන ලදී.

AIU ප්‍රතිපත්ති සංග්‍රහය පිළිබඳ SLCAP 9990, ගුවන්යානා හදිසි අනතුරු විමර්ශන ක්‍රියාපටිපාටි පිළිබඳ SLCAP 9990 සහ හදිසි අනතුරු විමර්ශන කළමනාකරණ පද්ධතිය පිළිබඳ SLCAP 9990_10 යන ඒකකය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අත්පොත් සමාලෝචනය කරන ලද අතර ඒ අනුව ඒවා සංශෝධනය කරන ලදී.

පසුගිය වසරේදී ශ්‍රී ලංකා භූමිය තුළ නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් සඳහා අනුමති 390 ක් නිකුත් කරන ලද අතර මිනිසුන් රහිත ගුවන් යානා (drones) 503 ක් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ලියාපදිංචි කර ඇත.

2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද ගුවන් යානා හා විදේශීය රටවල ලියාපදිංචි කරන ලද ගුවන් යානාවලට අදාළව ශ්‍රී ලංකා භූමිය තුළ ගුවන් ගමන් සිදුවීම් 295 ක් වාර්තා වී තිබුණි. මේ අතරින්, සිදුවීම් 293 ක් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වූ ගුවන් යානා ආශ්‍රිත සිදුවීම් වූ අතර ඉතිරි සිදුවීම් 2 විදේශීය රටවල ලියාපදිංචි කරන ලද ගුවන් යානා මඟින් ශ්‍රී ලංකා දේශසීමාව තුළ සිදු වූ සිදුවීම් විය.

සිදුවීම් අතුරින්, එක් කාණ්ඩයකින් වාර්තා වී ඇති වැඩිම සිදුවීම් සංඛ්‍යාව වශයෙන් ATM / සන්නිවේදන ආශ්‍රිත සිදුවීම් 85 ක් වාර්තා වී තිබුණි. පක්ෂීන් ගැටීම් 83 ක් සහ පද්ධති / සංරචක බිඳවැටීම් හෝ ක්‍රමවත්ව ක්‍රියා නොකිරීම් 41 ක් වාර්තා වී තිබුණි. වාර්තා වූ පක්ෂීන් ගැටීම් පිළිබඳ සිදුවීම් අතරින් 42 ක්ම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේදී සිදු වී තිබුණි.

ATM / සන්නිවේදන සිදුවීම් 85 අතරින් සිද්ධීන් 84 ක් වාර්තා වී ඇත්තේ ගුවන් ප්‍රවාහන සේවා ඒකක (ATS units) සම්බන්ධ නොවීම හේතුවෙන් වන අතර එම සිදුවීම් අතරින් වැඩිම සිදුවීම් සංඛ්‍යාව මුම්බායේ පියාසර තොරතුරු කලාපය (FIR) සමඟ "සම්බන්ධතා නොමැති වීම" හේතුවෙන් ඇති වූ සිද්ධීන් විය.

පද්ධති බිඳ වැටීම් / සංරචක ක්‍රියා නොකිරීම් හෝ ක්‍රමවත්ව ක්‍රියා නොකිරීම් අතරින් 38 ක්ම ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් සමාගමට අයත් ගුවන්යානා සම්බන්ධයෙන් වාර්තා වී තිබුණි.

**2. නීති කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකය**

2018 වර්ෂය තුළ දී, නීති කටයුතු හා බලාත්මක කිරීමේ ඒකකය පහත දැක්වෙන ජයග්‍රහණ ලබා ගැනීමට සමත් විය.

- 2010 අංක 14 දරණ සිවිල් ගුවන්සේවා පනත සංශෝධනය කිරීම
- 2018 අංක 29 දරණ ගුවනින් ප්‍රවාහනය කිරීමේ පනත සම්පාදනය කර සම්මත කර ගැනීම
- 2010 බෙයිජිං සම්මුතිය හා 2010 කේප් ටවුන් සම්මුතිය බලාත්මක කිරීම සඳහා නීති සම්පාදනය කිරීමට හැකි වන පරිදි නීති කෙටුම්පත් සම්පාදකවරයාට ජාත්‍යන්තර සම්මුතීන් දෙකක් ඉදිරිපත් කිරීම.
- යානා හදිසි අනතුරු විමර්ශන කාර්යාංශයේ (AAIB) අවසන් පනත් කෙටුම්පත භාෂා තුනෙන් ම සම්පාදනය කර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම සහ ඉන් අනතුරුව එම පනත් කෙටුම්පත සඳහා නීතිපතිවරයාගේ සහතිකය ලබා ගැනීම
- 2018 නිරුපද්‍රිතතා කළමනාකරණ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම
- 2018 පුද්ගල බලපත්කරණ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම
- 2018 වර්ෂයේ ගුවන් තොටුපොළ වර්ගීකරණ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම
- ජල ගගන යාත්‍රාංගණ රෙගුලාසි කෙටුම්පත සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ (CAASL) නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා ගුවන් නාවික සේවා සැපයුම්කරු බලපත්කරණ රෙගුලාසි පිළිබඳ අවසාන කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම.
- ගුවන් සේවා සුරක්ෂිතතා රෙගුලාසි පිළිබඳ කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කිරීම.
- ගුවන් යානය අයත් දේශය හා පොදු සලකුණු රෙගුලාසි පිළිබඳ කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කිරීම.

3. **තොරතුරු තාක්ෂණ ඒකකය**

අදාළ කාලපරිච්ඡේදය තුළ තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් පහත සඳහන් ව්‍යාපෘති සම්පූර්ණ කරන ලදී.

**නිම කරන ලද ව්‍යාපෘති**

- මාර්ගගත ගෙවීම් පද්ධතිය
- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) සමග ගුවන් බස් ලෝක තාක්ෂණික ප්‍රකාශන පද්ධතිය ඒකාබද්ධ කිරීම
- ගංගාරාමය කාර්යාල ජාලය සහ සේවාදායකය කටුනායක නව ගොඩනැගිල්ල වෙත ගෙන යෑම
- විභාග මධ්‍යස්ථානය ස්ථාපනය සම්පූර්ණ කිරීම
- මාර්ගගත නියමුවන් රහිත ගුවන් යානා ලියාපදිංචි කිරීමේ පද්ධතිය
- UCSC භාවිතයේ නොමැති වීම නිසා PEL පද්ධතිය යාවත්කාලීන කිරීම සම්පූර්ණ කරන ලදී.

## 6.3 වර්තමාන සුභසාධන කටයුතු


වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සේවකයන් හා ඔවුන්ගේ පවුලේ සමීපතම සාමාජිකයන් සඳහා පිරිනමනු ලබන ඉහළම ප්‍රතිලාභ ලබා දෙන සුබසාධන පහසුකම බවට පත් වී ඇත.


සමාලෝචිත වර්ෂයේ බාහිර රෝගී අංශය යටතේ 2018 ජනවාරි මස සිට 2018 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ රු.5,522,218.54 ක් වටිනා ප්‍රතිලාභ මුළු රක්ෂණ ප්‍රතිලාභ හිමිකම් ඉල්ලීම් 1688 ක ප්‍රමාණයක් සඳහා ලබා දී තිබේ. එමෙන් ම, වෛද්‍ය රක්ෂණයේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගැනීමේ පහසුකම් ද එම කාලසීමාව තුළ දී සේවකයන්ට ලබා දෙන ලදී.


සේවක ණය සහන ලබා දීම ඇතුලු ප්‍රධාන සුබසාධන පහසුකම්වලට අමතරව, වීරවිල සංචාරක නිවාසය කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා වන සුබසාධන පහසුකමක් ලෙස පිරිනමන ලදී.

## 6.4 මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීම

**2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා**



# 7.

# සීමාසහිත ගුවන්තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) පෞද්ගලික සීමිත සමාගම

## 7.1 හැඳින්වීම

**දැක්ම**

"ආසියානු කලාපය තුළ කාර්යක්ෂම බවින් හා සුහදත්වයෙන් ප්‍රමුඛතම ගුවන්සේවා කේන්ද්‍රස්ථානයක් වීම"

**මෙහෙවර**

"අප විසින් මහත් පරිශ්‍රමයක් දරනුයේ ප්‍රශස්ථ ක්‍රියාකාරකම් තුළින් තරඟකාරී ගුවන්සේවා පහසුකම් සැපයීම මෙන්ම අපගේ ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ සංතෘප්තිය තහවුරු කිරීමටයි."

## 7.2 ආයතනික මෙහෙයුම්/ ක්‍රියාකාරකම්

කොළඹ ගුවන් තොරතුරු කලාපය තුළ ගුවනේදී මෙන්ම භූමියේදීද ගුවන් යානාවල හා ගුවන් මගීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගගන නාවික සේවා, ගිනි නිවීම් සේවා හා ආරක්ෂක සේවා සැපයීමත්, පර්යන්තය හා ඒ ආශ්‍රිත මගී පහසුකම් සැලසීම, එහි නඩත්තු කටයුතු කිරීමද ඇතුළුව අනෙකුත් සිවිල් ගුවන් තොටුපොළ සේවා සැපයීමත්, රජයේ ව්‍යවස්ථාපිත අනුයෝජිත සේවා සපයන්නා ලෙස සමාගමේ අරමුදල් හා ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන විදේශීය ණය හා අධාර මුදල් භාවිතයෙන් ගුවන් තොටුපොළ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ඉටු කිරීමත් සමාගමේ මූලික ක්‍රියාකාරකම් වේ.

## 7.3 2018 වසර තුළ ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

### 7.3.1 භෞතික ප්‍රගතිය

#### 7.3.1.1 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි (බ.ජා.ගු.) ගුවන් සංචලන (ගුවන් යානා, මගීන් හා ගුවන් භාණ්ඩ)

2018 වසර තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (බ.ජා.ගු) විසින් ගුවන් යානා සංචලන 74,512 ක් මෙහෙයවනු ලැබූ අතර, ජාත්‍යන්තර ගුවන් යානා 66,974 ක් සහ දේශීය ගුවන් යානා 7,538 ක් එයට අයත් විය. පැමිණීම්, පිටවීම් සහ සංක්‍රමණික මගීන් ඇතුළුව වසර තුළ ගුවන් මගීන් 10,890,646 ක් ගුවන් තොටුපොළ භාවිතා කර ඇති අතර එයින් 9,636 ක් දෙනා දේශීය මගීන් වේ. මෙම කාලය තුළ බ.ජා.ගු විසින් මෙහෙයවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 281,605 කි. පසුගිය කාලය හා සසඳා බලන කළ ගුවන්සේවා ඉතිහාසයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි වැඩිම ගුවන් ගමන් මෙහෙයුම් සංඛ්‍යාවක් පසුගිය වසරේ වාර්තාගත වී ඇති අතර 2017 වසරට සාපේක්ෂව, ගුවන් යානා සංචලන, මගී සංචලන හා ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ ප්‍රතිශතාත්මක වර්ධනය පිළිවෙළින් 9.7%, 9.7% සහ 1.3% ක් විය.

#### 7.3.1.2. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි (ම.රා.ජ.ගු.) ගුවන් සංචලනා

2017 වසරේදී ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා බ.ජා.ගු. ගුවන් පථය වසා දැමීම හේතුවෙන් මත්තල ගුවන් තොටුපොළෙහි මෙහෙයුම් කටයුතු තාවකාලික වර්ධනයක් පෙන්නුම් කල නමුත්, 2018 දී පළමු අර්ධ වර්ෂය තුළ එහි අඩුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි.

2018 වසර තුළදී මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ මඟින් මෙහෙයවා ඇත්තේ ගුවන් යානා 709 ක් පමණි (ජාත්‍යන්තර ගුවන් යානා 334 ක් සහ දේශීය ගුවන් යානා 375 ක්). එය පසුගිය වසරට සාපේක්ෂව 50% ක අඩුවීමක් පෙන්නුම් කරයි. ඉහත කාලය තුළ ම.රා.ජ.ගු. විසින් 3,403 ක් වූ මගීන් සංඛ්‍යාවක් හා මෙ.ටො. 450 ක භාණ්ඩ ප්‍රමාණයක් මෙහෙය වූ අතර එය 2017 වසර හා සසඳන විට, පිළිවෙලින් 85% ක 99% ක පහත වැටීමක් වාර්තා කරයි.

කෙසේවෙතත්, 2018 ගුවන් දත්ත සංඛ්‍යාවන් 2017 හා සංසන්දනය කිරීමේදී, බ.ජ.ගු. ගුවන් පථය ප්‍රතිසංස්කරණ කටයුතු අතරතුර සැලකිය යුතු ගුවන් යානා සංඛ්‍යාවක් ම.රා.ජ.ගු. වෙත යොමුකිරීමට සිදුවූ හෙයින්, 2017 වසරේ මුල් තෙමස තුළ එහි මෙහෙයුම් කටයුතුවල තාවකාලික උත්පාතයක් ඇතිවූ බව සැලකිය යුතුය.

#### 7.3.1.3 මඩකලපුව ගුවන් තොටුපොළ නැවත විවෘත කිරීම

2018 මාර්තු මස 25 වන දින මඩකලපුව ගුවන් තොටුපොළ ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා ඇමතිතුමන් විසින් මහජනතාව සඳහා නැවත විවෘත කෙරුනු අතර අප සමාගම ගුවන් තොටුපොළේ ගුවන්සේවා සැපයුම්කරු ලෙස වගකීම භාරගත්හ. ඒ අනුව, අප සේවකයින් අවශ්‍ය පරිදි දෛනික සහ වැඩ මුර කාලසටහන් අනුව මඩකලපුව ගුවන් තොටුපොළෙහි සේවය සඳහා අනුයුක්ත කර ඇත.

මඩකලපුව ගුවන් තොටුපොළ නැවත විවෘත කිරීමෙන් පසුව, 2018 වසරේ දී ගුවන් යානා සංචලන 1,176 ක්, මගී සංචලන 3,854 ක් හා ගුවන් භාණ්ඩ මෙ.ටො. 47.8 ක් හැසිරවනු ලැබිණි. මෙම ගුවන් යානා හා මගී සංචලනයන් වර්ධනයවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

#### 7.3.1.4 ගුවන් සංතරණ ඉංජිනේරු ව්‍යාපෘති

කොළඹ - පියාසර තොරතුරු කලාපය තුළ (Colombo FIR) ගමන් ගන්නා ගුවන් යානා වල සුරක්ෂිතභාවය තහවුරු කරනු වස්, වේගයෙන් වෙනස්වන ගගන නාවික මෙහෙයුමේ තාක්ෂණයන්ට සමගාමීව ඉහළ සේවාවක් සැපයීම සඳහා ඇවසි තාක්ෂණික වෙනස්කම් සිදුකිරීමට අදාළ ව්‍යාපෘති ගණනාවක් 2018 වසර තුළදී ආරම්භ කරන ලද අතර ඒවායේ වැඩ ඉදිරි වසර කිහිපය තුළදී අවසන් කිරීමට අපේක්ෂිතය.

| ව්‍යාපෘතිය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | 2018 වසරට අදාළ අයවැය ප්‍රසම්පාදන (රු.මි.) |
|---|---|---|
| 1. ගගන නාවික තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIM) | 711 | 154 |
| 2. ගුවන් සංචලන කළමනාකරණ පද්ධතිය (ATM) | 665 | 144 |
| 3. ස්වයංක්‍රිය කාලගුණ නිරීක්ෂණ පද්ධතිය (AWOS) සහ ගුවන් තොටුපොළ පර්යන්ත තොරතුරු පද්ධතිය (ATIS) | 200 | 60 |

| ව්‍යාපෘතිය | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | 2018 වසරට අදාළ අයවැය ප්‍රසම්පාදන (රු.මි.) |
|---|---|---|---|
| 4. | උපකරණානුසාර ගොඩබැස්වීමේ පද්ධතිය (ILS) | 240 | 65 |
| 5. | ද්විතියික අවේක්ෂණ රේඩාර් යන්ත්‍ර (SSR) - පිදුරුතලාගල | 1,000 | 10 |
| 6. | අධි-සංඛ්‍යායාත ගගන ජංගම සන්නිවේදන මධ්‍යස්ථානය (HF Communication) | 100 | 80 |
| 7. | බ.ජා.ගු. හා රත්මලාන ගුවන් තොටුපොළේ සන්නිවේදන පද්ධතිය වැඩි දියුණු කිරීම | 420 | 210 |

මෙම ව්‍යාපෘති මූල්‍යනය කරනු ලබන්නේ ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම විසිනි.

#### 7.3.1.5 වසර 2030 දක්වා වූ රත්මලාන ගුවන් තොටුපොළෙහි ප්‍රධාන සැලැස්ම

2017 ඔක්තෝබර් මාසයේ දී සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද රත්මලාන ගුවන්තොටුපොළ සංවර්ධනය කිරීමේ ප්‍රධාන සැලැස්මට, 2030 දක්වා කාල සීමාව තුළ ගුවන්සේවා කර්මාන්තය තුළ ඇතිවිය හැකි ව්‍යාපාරික අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම සඳහා සැකසුනු භූමි සැලැස්මක් මෙන්ම ව්‍යාපාරික සැලැස්මක්ද ඇතුළත් කර තිබේ. ඒ අනුව, මේ සම්බන්ධයෙන් 2018 පෙබරවාරි මස 14 වන දින අප විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව සඳහා කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. මෙයට අමතරව, රත්මලාන ගුවන් හමුදා කඳවුර, ගුවන් ධාවන පථයේ උතුරු පැත්තට වන්නට ස්ථානගත කිරීම සම්බන්ධයෙන් සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවට ද කැබිනට් අනුමැතිය ලැබුනි. මේ වනවිට රත්මලාන ගුවන් තොටුපොළෙහි ප්‍රධාන සැලැස්ම ක්‍රියාවට නැංවීම සිදු කෙරෙමින් පවතී.

2018 දෙසැම්බර් මස වන විට මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය ලෙස, ගුවන් තොටුපොළ සඳහා වූ සහතිකය ලබා ගැනීමට එහි මූලික සැලසුම සහිත කෙටුම්පතක් සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත ඉදිරිපත්කර ඇති අතර ගුවන් තොටුපොළ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ඉංජිනේරු සැලසුම් සකසමින් පවතී. තවද මගී පර්යන්ත පහසුකම් ඉදිකිරීම, බැහැරුම් පථ ඉදිකිරීම, යාත්‍රාංගන ආස්තරණය කිරීම හා ගුවන් පථ ඉදිකිරීමේ වැඩ මේ වනවිට ආරම්භ කර ඇත. මීට අමතරව ගුවන් සංතරණ සේවා පහසුකම් සැපයීමේ උපාංග නවීකරණය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයන් සිදුකරමින් ද පවතී.

#### 7.3.1.6 මගීන් සඳහා වූ ක්ෂණික ප්‍රතිපෝෂණ ක්‍රමවේදය සහ පැමිණිලි කළමනාකරණ පද්ධතිය

පාරිභෝගික (මගී) තෘප්තියේ වැදගත්කම හඳුනාගත් මෙම සමාගම ක්ෂණික මගී ප්‍රතිපෝෂණ පද්ධතියක් (Instant Feedback System) සහ පැමිණිලි කළමනාකරණ පද්ධතියක් (Complaint Management System) හඳුන්වා දීමට පියවර ගෙන ඇත.

මගීන්ගෙන් ක්ෂණිකව ප්‍රතිචාර ලබාගැනීම තුළින් සමාගමේ විවිධ අංශ මඟින් සැපයෙන සේවාවන් හි ඇති දුර්වලතා හඳුනාගෙන ඒ සඳහා වඩාත් ඵලදායී විසඳුම් ලබාදීම මෙයින් බලාපොරොත්තු වේ. ඒ අනුව මගීන්ගෙන් තත්කාලීන ප්‍රතිචාර ලබාගැනීම සඳහා අවශ්‍ය උපාංග ස්ථාපිත කිරීමට සුදුසු ස්ථාන 50 ක් පමණ බ.ජා.ගු. තුළ මේ වනවිටත් හඳුනාගෙන ඇත. ඒ සඳහා අවශ්‍ය මෘදුකාංග අප සමාගමේ තොරතුරු තාක්ෂණ අංශය විසින් සංවර්ධනය කර ඇති

අතර දැනට එය පරීක්ෂණාත්මක තත්ත්වයේ පවතී. නුදුරු අනාගතයේදී මෙම ප්‍රතිපෝෂණ රැස්කිරීමේ මෘදුකාංග භාවිතා කිරීම සඳහා අවශ්‍ය දෘඩාංග ස්ථාපිත කිරීමට නියමිතය.

පැමිණිලි කළමනාකරණ පද්ධතිය මඟින් සියලූ ගුවන් තොටුපොළ භාවිතා කරන්නන්ට පැමිණිලි ඉදිරිපත් කිරීමටත් හැකි ඉක්මනින් ප්‍රතිපෝෂණ ලබා දීමටත් පහසුකම් සපයා දී ඇත. සමාග මේ, තොරතුරු තාක්ෂණ අංශය මඟින් නිර්මාණය කළ මෙම පැමිණිලි කළමනාකරණ පද්ධතිය 2018 නොවැම්බර් මස සිට භාවිතයට අවශ්‍ය පහසුකම් සලසා ඇත. එය ක්‍රියාත්මක කිරීමෙන් පසු අප වෙත ලැබෙන පැමිණිලි සඳහා ඵලදායීව විසඳුම් සෙවීමත්, මගී අපේක්ෂාවන් හඳුනා ගෙන ඊට නිසිලෙස ප්‍රතිචාර දැක්වීමද කළ හැක.

#### 7.3.1.7 අන්තර් ජාතික සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ආරක්ෂක අධීක්ෂණ විගණනය

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංගමය (ICAO) තම සාමාජික රටවල ගුවන්සේවා ආරක්ෂණ හැකියාව නිර්ණය කිරීමටත්, ගුවන්සේවා ආරක්ෂාවේ ඵලදායිතාවයත් එහි සංවර්ධනය පිළිබඳ පරිපූර්ණ විශ්ලේෂණයක් කිරීමටත්, ගුවන් ආරක්ෂාව පිළිබඳ විගණන වැඩසටහන කාලීනව සිදුකරණු ලබයි. වසර 2010 න් පසුව, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් 2018 වසරේදී මෙම සමාගම හා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියත් ඉලක්ක කරගනිමින් ඉහත විගණනය සිදු කරන ලදී. ඒ අනුව, එම සංගමයේ විශේෂ විගණන කණ්ඩායමක් රත්මලාන ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථානය හා බ.ජා.ගු. හි ගුවන් ක්ෂේත්‍රයේ හා ගගන සේවා සංකීර්ණයේ පවත්නා පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූලව පවතීද යන්න තක්සේරු කිරීම සඳහා පැමිණියහ. මෙම විගණනය අවසානයේ නිකුත් කරන ලද වාර්තාවට අනුව, ශ්‍රී ලංකාව කලාපයේ අනිකුත් රටවලට සාපේක්ෂව ගුවන් ආරක්ෂාව අතින් වඩා ඉදිරියෙන් සිටින බව තහවුරු කෙරිණි.

#### 7.3.1.8 ගුවන් ගමනාගමන පාලක පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම

රත්මලානේ පිහිටි සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය මඟින් එහි වූ පැරණි පුහුණු විඩම්බකය (Simulator) වෙනුවට නවීන තාක්ෂණයෙන් සමන්විත නව ගුවන් ගමන් පාලක පුහුණු විඩම්බකයක් 2018 ජුනි මාසයේ දී ස්ථාපිත කරන ලදී. එහි පිරිවැය රු. මි. 321 ක් වූ අතර එමගින් ගුවන් තොටුපොළ හා ගුවන්සේවා සමාගම මඟින් පමණක් සේවා නියුක්ත කරනු ලබන ගුවන් ගමන් පාලකවරුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට අපේක්ෂා කෙරේ.

#### 7.3.1.9 ගුවන් තොටුපොළ හා ගුවන්සේවා සමාගමේ 35 වන සංවත්සරය

ගුවන් තොටුපොළ හා ගුවන්සේවා සමාගමේ සිය 35 වන සංවත්සරය 2018 මාර්තු මස 24 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පරිශ්‍රයේ දී සමරනු ලැබීය. ඉහළ කළමනාකාරිත්වයේ හා සේවකයින්ගේ සහභාගීත්වයෙන්, බහු ආගමික වතාවත් වලින් සංවත්සර සැමරුම ආරම්භ කෙරුනු අතර මෙහිදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සඳහා සන්නම් පොරොන්දුවක් දියත් කෙරුණි.

#### 7.3.1.10 නව ගුවන් සමාගම් සේවාවන් ඇරඹීම

- **ඉන්ඩිගෝ ගුවන්සේවය ආරම්භ කිරීම**

ඉන්දියාවේ විශාලතම ගුවන් සමාගම වන ඉන්ඩිගෝ ගුවන්සේවය චෙන්නායි, බෙන්ගලූර් හා කොළඹ අතර ගුවන් ගමන් 2018 ජනවාරි 20 වැනිදා සිට ආරම්භ කෙරුණි.

- **එරෝප්ලොට් රශියා ගුවන් සමාගම මොස්කව් හා කොළඹ අතර ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම**

ශ්‍රී ලංකාව හා රුසියාව අතර සබඳතා ශක්තිමත් කරමින් එරෝෆ්ලොට් සිය ඍජු ගුවන් ගමන් සේවා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ දක්වා 2018 අප්‍රේල් 29 වන දින නැවත අරඹන ලදී. ඒ අනුව, සතියකට කොළඹ හා මොස්කව් අතර ඍජු ගුවන් ගමන් වාර පහක් (5) නවීන තාක්ෂණයෙන් යුතු ගුවන්යානා වන එයාබස් A330 යොදා ගනිමින් බදාදා හා බ්‍රහස්පතින්දා යන දිනයන්හි සිදුකිරීමට නියමිතය.

- **එඩ්ල්වයිස් ගුවන් සමාගම ඍජු-අඛණ්ඩ ගුවන් ගමන් සේවාවක් ශ්‍රී ලංකාව හා ස්වීඩනය අතර ආරම්භ කිරීම**

මේ යටතේ කොළඹ හා ෂූරිච් අතර සිකුරාදා හා ඉරිදා දිනවල සතියකට ගුවන් ගමන් වාර දෙකක් ක්‍රියාත්මක වීමට නියමිතය. මේ සඳහා මැතකදී පරිවර්තිත ආසන 314 කින් සමන්විත එයාබස් A 340 ගුවන්යානා යොදාගනු ලබයි.

- **චොංක්වින් ගුවන්සේවය කොළඹ දක්වා අඛණ්ඩ ගුවන් ගමන් වාර ඇරඹීම**

2018 දෙසැම්බර් 28 වන දින සිට චොංක්වින් ගුවන්සේවය මඟින් කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ හා චොංක්වින් හි චොංක්වින් ජියැංග්බි ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (Chongqing Jiangbei International Airport) අතර සතියකට ගුවන්වාර තුනක් බැගින් වූ ගුවන් ගමන් සේවාවක් අරඹන ලදී. මෙම ගුවන් ගමන් සඳුදා, බදාදා සහ සිකුරාදා යන දිනවල ක්‍රියාත්මක වීමට නියමිත අතර මේ සඳහා එයාබස් 320 වර්ගයේ ගුවන් යානා යොදාගනු ඇත.

### 7.3.1.11 මූලික නොවන ව්‍යාපාරික කටයුතු බාහිරකරණය කිරීම

ගුවන් තොටුපොළ භාවිතා කරන සැමට වඩා කාර්යක්ෂම සේවාවක් සැපයීම හා සමාගමේ සම්පත් වඩා ඵලදායී ලෙස භාවිතා කිරීමත් අරමුණු කර ගනිමින් බ.ජා.ගු. විසින් පවත්වා ගෙන ගිය රථ ගාල් 3 ක මෙහෙයුම් කටයුතු වෙනත් පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත් පදනම මත ලබා දීමට ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ කළමනාකාරිත්වය විසින් තීරණය කලහ. මෙමඟින් සමාගමේ රථගාල් වලින් ලැබෙන ආදායම ඊලඟ වසර තුන තුළදී රු. මි. 100 කින් පමණ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ සඳහා අමාත්‍යංශ ප්‍රතිපාදන කමිටුවේ අනුමැතිය දැනටමත් ලැබී ඇති අතර තෝරාගත් පාර්ශ්වය විසින් රථගාල් මෙහෙයුම් කටයුතු අගෝස්තු මාසයේ සිට ආරම්භ කරන ලදී.

### 7.3.1.12 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ඇති සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම

සංචාරකයින්ට වඩා වේගවත් හා ඵලදායී ලෙස සේවා සපයනු වස්, වසර 20ක් පැරණි බණ්ඩාරනායක ගුවන්තොටුපොළෙහි පිහිටි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කොට මහජනතාව වෙනුවෙන් විවෘත කරනු ලැබීය.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ පැමිණීමේ පර්යන්තයෙහි පිහිටි සංචාරක තොරතුරු කවුලුව ලංකාවට පැමිණෙන සංචාරකයින් සේවා ලබාගැනීම සඳහා මුලින්ම යොමුවන ස්ථානයයි. මෙම සංචාරක තොරතුරු කවුලුව වෙතින් ලංකාවේදී කළ හැකි දේ, ලංකාවට සුවිශේෂ වූ නිශ්පාදන හා සේවා, සහ ඒවා ලබාගත හැකි ප්‍රදේශ වැනි තොරතුරු

විමසා දැනගත හැක. තවද, මෙම ප්‍රතිසංස්කරණයත් සමග මෙහි සිටින නිලධාරින්හට ලංකාවේ ඉතිහාස පිළිබඳව තොරතුරු හා වෘතාන්ත, එකිනෙක ප්‍රදේශවල ඇති සුවිශේෂතා, කර්මාන්ත, ආකර්ෂණ දේ සහ මිනිසුන් සතු දක්ෂතා පිළිබඳව තොරතුරු වඩාත් ඵලදායී ලෙස ලබාදිමට හැකිවී ඇත.

#### 7.3.1.13 2018 වසරේ ජාතික ව්‍යාපාර විශිෂ්ටතා රිදී සම්මාන දිනාගැනීම

2018 වසරේ දෙසැම්බර් මස පස් වන දින ගුවන්තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) පෞද්ගලික සීමිත සමාගමට, මෑතකදී පවත්වන ලද ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන - 2018 උලෙලේ රාජ්‍ය සේවා අංශයේ අනුශුරතාවය හිමිවිය. මෙහිදී, නායකත්වයේ විශිෂ්ටත්වය, ආයතනික යහපාලනය පිළිබඳ විශිෂ්ටත්වය, ශක්‍යතා ගොඩනැගීමේ විශිෂ්ටත්වය, කාර්ය සාධන කළමනාකරණය පිළිබඳ විශිෂ්ටත්වය, දේශීය හා ගෝලීය වෙළෙඳපොළ තුළ විශිෂ්ටත්වය, ආයතනික සමාජ වගකීම් සහ පාරිසරික තිරසාරභාවය පිළිබඳ විශිෂ්ටත්වය, ව්‍යාපාරික හා මූල්‍ය ප්‍රතිඵල වල විශිෂ්ටතාවය යන පැතිකඩ හත (7) සලකා බලමින් සමස්ත ව්‍යාපාරික විශිෂ්ටතාවය නිර්ණය කෙරේ.

## 7.4 2018 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

### 7.4.1 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි දෙවැනි ගුවන් මගී පර්යන්ත ව්‍යාපෘතිය

2018 වසරේ වැඩ ආරම්භ කිරීමට නියමිතව තිබූ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි දෙවැනි ගුවන් මගී පර්යන්ත ව්‍යාපෘතිය තව දුරටත් ප්‍රමාද වී තිබේ. කොන්ත්‍රාත් කරුවන්ගෙන් ලැබුනු මිල ගණන් ඉංජිනේරු ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා තිබීම මීට හේතුවිය. ලැබුනු අඩුම මිල ගණන් ද ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා 43% ක් පමණ ඉහළ අගයක් ගනු ලැබීය. මෙම මිල ගණන් පහත හෙළීම සඳහා කළ සාකච්ඡා ද අසාර්ථක වීමෙන් පසු අදාළ ටෙන්ඩරය අවලංගු කිරීම සඳහා කැබිනට් මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ ද අනුමැතිය ඇතිව අප අමාත්‍යාංශය විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කැබිනට් මණ්ඩලය විසින් 2018 මැයි මස 15 වැනි දා ලංසු තැබීමේ ක්‍රියාවලිය අවලංගු කිරීමට හා කැබිනට් මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා ඒජන්සියේ (JICA) එකඟතාවයට යටත්ව,සමස්ත පැකේජය කොටස් වලට වෙන්කොට අලූතින් මිල ගණන් කැඳවීමට අනුමැතිය ලබාදුන්හ.

කෙසේ වෙතත්, එපිටින් පිහිටි යාත්‍රාංගනය සහ බැහැරුම් පථ ඇතුළත් 'බී' පැකේජයේ වැඩ කෙරෙමින් පවතින 2018 දෙසැම්බර් 31 දින වනවිට එය 17% ක ප්‍රගතියක් පෙන්වීය. මෙම කොන්ත්‍රාත්තුව "හෂාමා ඇන්ඩු කෝපරේෂන්" (Hazama Ando Corporation) නැමති කොන්ත්‍රාත් සමාගමට ප්‍රදානය කර ඇති අතර, එහි සමුච්චිත අගය ජපන් යෙන් 1,152,273,761 ක් සහ ශ්‍රී ලංකා රුපියල් 4,456,377,248 කි. කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය මාස 30 කි. කොන්ත්‍රාත්තුවේ වැඩ 2017 අප්‍රේල් 25 වැනි දා ආරම්භ කෙරුණු අතර 2019 ඔක්තෝබර් වන විට එය නිම වීමට නියමිත යි.

### 7.4.2 ගුවන් තොටුපොළ හෝටලය

සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ඉදිරිපසින් පිහිටි පරිශ්‍රයෙහි ගුවන් තොටුපොළට අයත් අක්කර තුනක පමණ භූමිය භාවිතා කරමින් තරු 4 පන්තියේ හෝටලයක් ඉදිකිරීමට අදාළ මූලික කටයුතු සිදුකොට ඇත.

මෙම ගුවන් තොටුපොළ හෝටලය අවම වශයෙන් කාමර 100 කින් සමන්විත වන අතර, පිළිගත් ප්‍රමිතීන්ට අනුව ව්‍යාපාරික මධ්‍යස්ථාන, විනෝද හා ක්‍රීඩා පහසුකම්, සම්මන්ත්‍රණ / සම්මේලන පහසුකම්, සාප්පු පෙළකින් හා අනෙකුත් අදාළ පහසුකම් සහිතව, ශ්‍රී ලංකා සංචාරක රෙගුලාසි හා මාර්ගෝපදේශයන්ට අනුකූලව ඉදිවනු ඇත. මෙම හෝටලය ඉදිවන ඉඩම පිරිනමනු ලබන්නේ අවුරුදු 40 ක කල්බදු ක්‍රමයට නැවත අලූත් කිරීමට හැකි පදනම මතය.

### 7.4.3 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි පවතින ගුවන් මගී පර්යන්ත ගොඩනැගිල්ල

**(PBT) ප්‍රතිව්‍යුහගත කිරීම හා එහි ආකෘතිය නැවත පිළිසකර කිරීම**

මේ වනවිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි මෙහෙයවන ගුවන් මගීන් ගණන, එහි සැලසුම්ගත ධාරිතාවය ඉක්මවා ගොස් ඇති බැවින්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පවතින ගුවන් මගී පර්යන්ත ගොඩනැගිල්ල නොකඩවා උපරිම ලෙස පරිහරණය කිරීමට සිදුවී ඇත. එනිසා පවතින ගුවන් මගී පර්යන්ත ගොඩනැගිල්ලෙහි ආකෘතිය නැවත පිළිසකර කර, ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘතියේ වැඩ දැනටමත් කෙරීගෙන යමින් පවතී.

2018 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වාර්තා විය.

- ගුවන් තොටුපොළේ පැමිණීමේ පර්යන්තයේ ආගමන පෙදෙසෙහි "L'' ආකෘතික කොටස නැවත පිළිසකර කොට "ආගමන ශාලාව" නැමැති සංකල්පය ක්‍රියාත්මක කර, එහි විදුලි හා විද්‍යුත් උපකරණ වලින් සමන්විත තීරුබදු රහිත සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම - 43% (ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මි. 374).
- පිටත්වීමේ පර්යන්තයේ මහජන ආලින්දය පුළුල් කිරීම - 86% (මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මි. 238).

## 7.5 2018 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2017 (රු.මි.) | 2018 (රු.මි.) |
|---|---:|---:|
| මුළු ආදායම | 23,377 | 28,186 |
| මුළු වියදම | 12,558 | 16,626 |
| බදු පසු ලාභය | 8,715 | 9,330 |

# 8.

# සීමාසහිත ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම

## 8.1 හැඳින්වීම

මෙම ආයතනයේ මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංගම බස් රථ අඩු වියදමකින් උසස් ප්‍රමිතියක් යටතේ අලුත්වැඩියා කොට පොදු ජන සේවයට එකතු කිරීමයි.

**දැක්ම**

"ශ්‍රී ලංකා වාසී ජනතාවට හොඳ ආකර්ශණීය ප්‍රවාහන සේවයක් සඳහා දායක වීම.

**මෙහෙවර**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හා පුද්ගලික බස් හිමියන්ගේ අබලන්වන මගී බස්රථ සහනදායී මිලකට උසස් තත්වයෙන් අලුත්වැඩියා කොට ධාවනයට එක් කිරීම

## 8.2 2018 වර්ෂය තුළදී ආයතනය ලබා ඇති ප්‍රගතිය (භෞතික හා මූල්‍ය)

| ආයතනය | අලුත්වැඩියා කළ බස් රථ ප්‍රමාණය | ලැබුණු මුදල (රු.) | නිෂ්පාදනය සඳහා වියදම (රු.) | ආයතනයට ලැබුණු ලාභය (රු.) |
|---|---|---|---|---|
| ශ්‍රී ලංගම | 87 | 127,330,487 | 91,702,431 | 35,628,055 |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 01 | 178,349 | 149,126 | 29,223 |
| සී/ස ගුවන් තොටුපොළ හා ගුවන්සේවා සමාගම | 01 | 1,232,554 | 852,283 | 380,271 |
| **එකතුව** | **89** | **128,741,390** | **92,703,840** | **36,037,549** |

## 8.3 2018 වර්ෂයේදී ආයතනයේ කාර්යසාධනය

පෙර වර්ෂවලදී මසකට බස් රථ 05 - 06 ත් අතර ප්‍රමාණයක් අලුත්වැඩියා කළ අතර, 2018 වර්ෂයේදී එය මසකට 08 -10 ත් අතර ප්‍රමාණයකින් ඉහළ දැමීමට හැකියාව ලැබී ඇත.

බස් රථ අලුත්වැඩියා කොට පෙර වර්ෂ වලට වඩා ඉතා ඉක්මනින් ඩිපෝවන් වෙත ලබාදීමට මෙම වර්ෂයේදී හැකියාව ලැබී ඇත.

අංගන භූමියේ වල්බිහිවී ඇති ප්‍රදේශ පිරිසිදු කොට එම ප්‍රදේශය ක්‍රමවත් වටපිටාවක් බවට පත්කිරීම, අංගනයේ අපිළිවෙළට ගාල් කොට තිබූ අලුත්වැඩියා කිරීමට නොහැකි අබලි බස් රථ නිසිලෙස අංගනයේ එක අන්තයකට ගාල් කිරීම ආදිය පිළිබඳ කාර්ය මණ්ඩලය තුළ ආකල්ප ගොඩ නංවා ඒ අනුව ආයතන පරිශ්‍රය ක්‍රමානුකූලව පවත්වා ගෙන යනු ලබයි.

## 8.4 ප්‍රගතිය

- වසර 35 කට වඩා පැරණි යන්ත්‍රෝපකරණ වෙනුවට නව උපකරණ මිලදී ගෙන අලුත්වැඩියාවන් වේගවත් සහ කාර්යක්ෂම කිරීම.
- අනාරක්ෂිතව තිබූ ආයතන භූමිය වටා තිබූ ආරක්ෂිත වැට වෙනුවට ස්ථිර බැම්මක් ඉදිකල අතර, එමෙන්ම ආයතන භූමියේ අනාරක්ෂිත වෙනත් ස්ථාන සඳහා ආරක්ෂිත වැටවල් ඉදිකිරීම.
- අබලන්ව පැවති ආයතනයේ සනීපාරක්ෂක ස්ථාන අලූත්වැඩියා කොට භාවිතයට ගැනීමට හැකිවන පරිදි ස්ථාපිත කිරීම.
- ලංගම බස් රථ අලූත්වැඩියාව මෙන්ම අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතන වල වාහන අලූත්වැඩියා කිරීමට හැකිවීම.
- මහා භාණ්ඩාගාරය මඟින් වැටුප් හා වේතන ගෙවීම සඳහා ලබාදුන් මුදල 2018 වර්ෂයේ පටන් ලබා නොගෙන ආයතනය මඟින් අලූත්වැඩියා කර ලැබෙන ආදායමෙන් සියලූම වැටුප් හා වේතන සහ අනෙකුත් වියදම් සිදුකිරීම.
- ආයතනයේ සියලූම සේවකයන්ගේ අභිප්‍රේරණය වැඩි කිරීම සඳහා විශේෂ පුහුණු උපදේශිකාවක් මඟින් පුහුණු වැඩමුළුවක් පැවැත්වීම සහ එහිදී තත්ත්ව කව ඇති කොට සේවකයින් විසින් ආයතනයේ දියුණුව සඳහා වූ වැඩපිළිවෙළක් සකස් කිරීම.
- ආයතනයේ සේවකයන් වෙනුවෙන් මෙතෙක් කල් නොතිබූ ආපන ශාලාවක් සහ ඇ ස්වීම් ශාලාවක් ස්ථාපිත කිරීම.

## 8.5 2019 වර්ෂයේ සිදුකිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘති

- අධිවේගී මාර්ගයේ ධාවනය කරන බස් රථ සහ තට්ටු දෙකේ බස් රථ අලූත්වැඩියා කිරීම.
- ආයතනයේ අබලන් වී ඇති ප්‍රධාන කර්මාන්ත ශාලාව ඇතුළුව අනෙකුත් ගොඩනැගිලි ඉවත්කොට නව ගොඩනැගිලි ඉදිකිරීම.
- බස් රථ අලූත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන තහඩු නැමීමේ උපකරණයක් කර්මාන්ත ශාලාව තුළ ස්ථාපිත කොට ආයතනයේ සේවකයන් එම යන්ත්‍රය සඳහා පුහුණු කිරීම.

# 9.

# මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

1998 අංක 05 දරණ මෝටර් වාහන සංශෝධන පනත මගින් ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ක්‍රියාත්මක වේ. සැමට සුරක්ෂිත මාර්ග පද්ධතියක් ඇති කිරීම යන තේමාව යටතේ ක්‍රියාත්මක වන එකම රාජ්‍ය ආයතනය වන්නේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවයි.

**දැක්ම**

"සැමට සුරක්ෂිත මාර්ග පද්ධතියක්.

**මෙහෙවර**

"තිරසර සංවර්ධනය උදෙසා මාර්ග අනතුරුවලින් තොර සමාජයක් බිහි කිරීම.

## 9.1 මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණු

- විනයගරුක හා නීතිගරුක රියදුරන් බිහිකිරීම තුළින් ඉහළ ගුණාත්මක රියදුරු සේවාවක් බිහි කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- හප්පා පලා යෑම නිසා වින්දිත වූ පවුල් සඳහා මූල්‍යාධාර ලබා දීම සහ එවැනි අනතුරු අවම කිරීමට ක්‍රියා කිරීම.
- මාර්ගය සහ එය භාවිතා කරන වාහන හා ගමන් ගන්නා මගීන් ඇතුළු පදිකයින්ගේ ආරක්ෂාව සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනිම සහ ක්‍රියාත්මක කිරිම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳ දත්ත එක් රැස් කිරීම, සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම සහ අන්තර් ජාතික සම්බන්ධීකරණය වර්ධනය කර ගැනීම.
- රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන සමඟ එක්ව ජාතික මාර්ග ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම හා පැන නැගෙන දුර්වලතා අවම කර ගැනීම.
- මාර්ග අනතුරු නිසා ආබාධිත වන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- ආර්ථික තාක්ෂණික සහ සමාජීය වශයෙන් ක්‍රියාත්මක කළහැකි ක්‍රියාකාරකම් සහ පරිසර හිතකාමී ආරක්ෂිත පියවර අනුගමනය කිරීම සඳහා මූල්‍යාධාර සහ උපදෙස් ලබා දීම.
- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සැකසීමට හා එහි ක්‍රියාකාරීත්වයට දායකත්වය ලබා දීම.
- මාර්ග ආරක්ෂාවට අදාළ නීති සැකසීම සංශෝධනය වැනි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

## 9.2 මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන් හා බලතල

මෝටර් වාහන පනතෙහි 213 "අ" වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවෙහි කර්තව්‍ය පහත පරිදි වේ.

(අ) පහත දැක්වෙන දෑ පිළිබඳ පරිගණක දත්ත ගබඩාවක් පවත්වාගෙන යෑම සහ එම තොරතුරු යාවත්කාලීන කිරීම.

- රථ වාහන ප්‍රමාණය සහ ඒවායේ ලක්ෂණ සහ සංයුතිය
- මාර්ග අනතුරු/මරණ
- මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශිය හා ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛන

(ආ) මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ අන්තර්ජාල පරිගණක පහසුකම් සහිත පුස්තකාලයක් පවත්වාගෙන යෑම

(ඇ) සම්බන්ධිත විෂයන් පිළිබඳව පර්යේෂණවලට ආධාර කිරීම.

(ඉ) සමාන ජාත්‍යන්තර ආයතන සමග සබඳතා පැවැත්වීම සහ පළපුරුදු ශිල්පීය දැනුම හුවමාරු කිරීම.

(ඊ) මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයානුබද්ධ ව්‍යාපෘති කෙරෙහි වගකීම දරණ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලට දැනුම හා තොරතුරු ලබා දීම.

(උ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාවට නැංවීම.

(ඌ) රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

(ඔ) හඳුනා නොගත් වාහනවලින් අනතුරට පත් තැනැත්තන්ට වන්දි ගෙවීම.

(ඕ) මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබා ගැනීම.

(එ) මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් දීම.

## 9.3 2018 වර්ෂය තුළ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්

- **පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

➢ පාසල් රිය නියාමක සේවය වඩාත් පුළුල් ක්‍රමවේදයකට යොමු කරමින් රිය අනතුරු වළක්වා ගැනීම සම්බන්ධව පාසල් සිසුන් දැනුවත් කිරීම දේශන පවත්වා අනතුරු සම්බන්ධ විඩියෝපට ප්‍රදර්ශනය කර අත්පත්‍රිකා බෙදාදීම සහ ශිෂ්‍ය රිය නියාමක වැඩසටහන අවට පාසල් 10 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වයෙන් 2018.01.11 දින කොළඹ ආනන්ද විද්‍යාලයේදී පැවැත්විණ. එම උත්සවයේ විශේෂ ආරාධිත දේශනය මා.ආ.පි.ජා. සභාවේ සභාපති වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතා විසින් සිදු කරන ලදී.

➢ එමෙන්ම බොරැල්ල යසෝදරා බාලිකා විද්‍යාලය ඉදිරිපිට සෝලර් නිවී දැල්වෙන විදුලි පහන් කණුව ස්ථාපිත කර පාසල් සිසුන් දැනුවත් කිරීම, අනතුරු සම්බන්ධ වීඩියෝපට ප්‍රදර්ශනය හා අත්පත්‍රිකා බෙදා දීම සමඟ ජාතික පාසල් ශිෂ්‍ය රිය නියාමක වැඩසටහන අවට පාසල් කිහිපයක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වයෙන් 2018.06.08 යසෝදරා බාලිකා විද්‍යාලයේදී පවත්වන ලදී.

- 2018.04.04 වන දින සිට පුරා තෙදිනක් මතුගම කඹුරාවල මහා විද්‍යාලයේ මාර්ග ආරක්ෂාව පිළිබඳව අධ්‍යාපනික ප්‍රදර්ශනයක් පැවැත්වූ අතර, එය පාසල් ළමුන්ගේ දැනුම වර්ධනය සඳහා වූ වැඩසටහන් ගණනාවකින් සමන්විත විය. 2018.07.07 වන දින මොරටුව විශ්ව විද්‍යාලය සමඟ එක්ව මාර්ග ආරක්ෂාව පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

- 2018.09.13 වන දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොතලාවල මහා විද්‍යාලයේදී 2018.09.14 වැල්ලව මධ්‍ය මහා විද්‍යාලයේදී සහ 2018.10.31 වන දින වයඹ රාජකීය විද්‍යාලයේදී පාසල් සිසුන් දැනුවත් කිරීම සිදුවූ අතර, මෙහිදී අනතුරු සම්බන්ධ වීඩියෝපට ප්‍රදර්ශනය හා අත්පත්‍රිකා බෙදා දීම ද සිදු කරන ලදී. පාසල ඇතුළත පරිශ්‍රයේදී සංඥා පුවරු සවි කිරීම ද සිදුවිය.

- **හෙද විදුහල්වල පුහුණු වන හෙද සිසුන් දැනුවත් කිරීම**

2018.07.12 වැනි දින මාර්ග ආරක්ෂාව පිළිබඳව හෙද සිසු සිසුවියන් දැනුවත් කිරීමේ වැඩසටහන් කඳාන හෙද විදුහලේදී සහ 2018.12.03 වන දින කළුතර හෙද විදුහලේදී පවත්වන ලදී.

- **ගුරු විද්‍යාලවල පුහුණු වන සිසු සිසුවියන් දැනුවත් කිරීම**

2018.07.21 වැනි දින ගුරු පුහුණු විද්‍යාලවල පුහුණුව ලබන ගුරු සිසුවියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ දී පැවැත්විණි. මේ සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් රු.21,630.00 ක මුදලක් වැය කරන ලදී.

- **පෞද්ගලික ආයතනවල රියදුරන් දැනුවත් කිරීම**

පෞද්ගලික ආයතනවල රියදුරන් අතින් සිදුවන අනතුරු අවම කර ගැනීම මූලික අරමුණ කර ගනිමින් ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 2018.02.26,.28, හා 2018.03.09 යන තෙදින තුළ මීරිගම, කටුනායක හා අවිස්සාවේල්ල බ්‍රැන්ඩික්ස් ආයතනයන්හි පවත්වන ලදී.

- **රාජ්‍ය ආයතනවල රියදුරන් දැනුවත් කිරීම**

2018.01.12 වැනි දින "කළ වරද නැවත සිදු නොකරන්නට නම් මනසින් ශක්තිමත් වෙමු" මැයෙන් රියදුරු පුනරුත්ථාපන වැඩසටහනක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරන් සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී. තවද, 2018.07.13 වැනි දින සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන්සේවා සමාගමේ රියදුරන් හා නිලධාරීන් සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

- **ත්‍රීරෝද රථ හා අනිකුත් නව රියදුරු බලපත්‍ර අයදුම්කරුවන් දැනුවත් කිරීම**

2018 වර්ෂයේ අගෝස්තු දක්වා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් වැඩසටහන් 10 ක් පවත්වා ඇති අතර, ඒ සඳහා රු. 74,570.00 ක වියදමක් දරා ඇත. සතියේ සෑම බ්‍රහස්පතින්දා දිනකම කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී මෙම දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීමට කටයුතු යොදා ඇත.

- **මොණරාගල මහ රෝහලේ වෛද්‍ය හා හෙද සේවා නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන**

මොණරාගල මහ රෝහලේ වෛද්‍ය හා හෙද සේවා නිලධාරින් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන රෝහල් අධ්‍යක්ෂතුමන් ප්‍රමුඛ වෛද්‍යවරුන්, හෙදියන්, ගිලන්රථ රියදුරන් ඇතුළු සේවකයින්ගේ සහභාගිත්වයෙන් 2018.01.09 වන දින පවත්වන ලද අතර, එදින පාපැදිකරුවන්ට රෝහල මඟින් පරාවර්ථිත ස්ටිකර් ලබා දීම සිදු කරන ලදී.

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පාපැදිකරුවන්ගේ ජීවිත සුරැකීමේ වැඩසටහන සිදු කළ අතර, අඳුරේදී පාපැදි අනතුරු සිදුවීම වැඩි හෙයින්, එම අනතුරු අවම කිරීම සඳහා දිවයින පුරා පාපැදිවල පරාවර්ථිත ස්ටිකර් ඇලවීමේ වැඩසටහන සිදු කරන ලදී. මේ සඳහා රු.25,160.00 ක මුදලක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් දරණ ලදි.

ජාතික වැඩසටහන් යටතේ 2018 අගෝස්තු මස 29,30,31 යන දිනයන්හි මොණරාගල එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයේදී මා.ආ.පි.ජා.ස. මඟින් ප්‍රදර්ශන කුටියක් ස්ථාපිතව තිබුණු අතර, එහිදී රාජ්‍ය සේවකයින්, සිවිල් වැසියන් සහ පාසල් ළමුන් මාර්ග ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලදී. මෙහිදී අනතුරු සම්බන්ධ වීඩියෝපට ප්‍රදර්ශනය හා අත්පත්‍රිකා බෙදා දීම ද සිදුවිය.

"අද වෙහෙසෙමු හෙට සතුටු වෙමු" යන තේමාව යටතේ එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ජාතික වැඩසටහනට සමගාමීව දිවයින පුරා පැවැත්වීමට නියමිත දිස්ත්‍රික් මාර්ග ආරක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහනේ සමාරම්භක වැඩසටහන මාතර දිස්ත්‍රික්කය මූලික කරගනිමින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම් ජී.එස්.විතානගේ මැතිතුමාගේ සහභාගීත්වයෙන් සනත් ජයසූරිය ක්‍රීඩාංගනයේදී 2018.09.29 වන දින පවත්වන ලදී. එහිදී පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

- රිය අනතුරුවලට ලක්වී ආබාධිත වූ පාසල් ළමුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය
- හප්පා පලා ගොස් ජීවිතක්ෂයට පත්වූ සහ ආබාධිත තත්ත්වයට පත්වූ වින්දිතයන් සඳහා වන්දි ප්‍රදානය
- ත්‍රිවිල් රථ රියදුරන්ගේ පවුල් ආර්ථික මට්ටමින් උසස් කිරීම සඳහා ඔවුන්ගේ භාර්යාවන් සඳහා ස්වයං රැකියා පුහුණු වැඩමුළු පැවැත්වීම
- රැකියා නොමැති තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම මඟින් ශ්‍රමබලකාය ශක්තිමත් කිරීම හරහා ඉදිරියේදී ත්‍රීවීලර් රථ රියදුරු බලපත්‍ර ලබාදීමේ වයස අවුරුදු 35 දක්වා ඉහළ දැමීමෙන් ඇතිවිය හැකි ගැටලු සහගත තත්ත්වයන් අවම කිරීම

- **දුම්රිය අනතුරු අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන**

දුම්රිය මඟින් අනතුරට ලක්වීම අඩුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ එක්ව සිදු කරන ලද මෙම වැඩසටහන යටතේ 2018.04.02 හා 2018.06.26 යන දෙදින තුළ රාගම, මොරටුව හා පයාගල දුම්රිය ස්ථානවලත්, 2018.09.13 මුත්තෙට්ටුගල දුම්රිය ස්ථානයේදීත් 2018.09.14 දින කුරුණෑගල වැල්ලව දුම්රිය ස්ථානයේත් 2018.09.29 වන දින මාතර දුම්රිය ස්ථානයේදීත් 2018.12.13 වන දින මහනුවර දුම්රිය ස්ථානයේදීත් 2018.12.14 වන

දින හිඟුරක්ගොඩ සහ අනුරාධපුර දුම්රිය ස්ථානවලදීත් දැනුවත් කිරීමේ පුවරු සවි කරන ලදි. ඒ සඳහා අනුග්‍රාහක ආයතන විසින් වියදම් දරණ ලදි.

- **පොදු මගී ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්**

2018.02.20 වන දින කැස්බෑව සම්බුද්ධාලෝක විහාරස්ථානයේදී ප්‍රධාන මාර්ග පුළුල් කිරීමේ දී මාර්ගය දෙපස ජනතාවට සිදුවන හානි අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන සමඟ පානදුර - කැස්බෑව මාර්ගය, අධිවේගී මාර්ගය තෙක් පුළුල් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාගා ආයතනයේ අනුග්‍රහයෙන් පවත්වන ලදි. එමෙන්ම 2018.02.24 වන දින මාලඹේ, මාළිගාගොඩැල්ල ප්‍රජා ශාලාවේ දී ද එවැනිම වූ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාගා ආයතනයේ අනුග්‍රාහක දායකත්වයෙන් පවත්වන ලදි.

- **සංචාරක සේවය වර්ධනය කිරීම සඳහා සුදුසු ත්‍රීරෝද රථ රියදුරන් පුහුණු කිරීම**

2018.03.10 වැනි දින සංචාරකයින්ට වඩාත් ඉහළ ප්‍රමිතියකින් යුත් සේවාවක් ලබා දීම සඳහා දස දහසක් රියදුරන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ මුදල් අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ත්‍රිරෝද රථ රියදුරන් පුහුණු කිරීම මේ වනවිට ආරම්භ කර සිදුකර ගෙන යමින් පවතී.

- **තාක්ෂණික රියදුරු පුහුණු ඒකකය ස්ථාපිත කිරීම**

2018.12.12 වන දින ජපානයේ NTK ආයතනයේ පරිත්‍යාගයක් වශයෙන් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමාට ලබා දුන් රුපියල් ලක්ෂ 150 ක් වටිනා විද්‍යුත් තාක්ෂණික රියදුරු පුහුණු යන්ත්‍ර සහිත ඒකකය එම ආයතනයේ සභාපතිතුමා විසින් විවෘත කිරීමේ සමාරම්භක උත්සවය මරදාන ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශ පරිශ්‍රයේදී පවත්වන ලදී.

- **ත්‍රීරෝද රථ මීටර් අනිවාර්ය කිරීම**

2018.04.20 වන දින ත්‍රීරෝද රථ මීටර් අනිවාර්ය කිරීම සම්බන්ධව මාධ්‍ය දැනුවත් කිරීම මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමා විසින් මරදාන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී සිදු කරන ලදී. එමෙන්ම මීටර් නිපදවන්නන් සහ ආනයනය කරන ආයතන දැනුවත් කිරීම සඳහා 2018.04.26 වන දින මීටර් අනිවාර්ය කිරිම සම්බන්ධව මීටර් නිපදවන්නන් සහ ආනයනය කරන ආයතන දැනුවත් කිරීම ද සිදු කරන ලදී.

- **CCTV කැමරා සවි කිරීම සම්බන්ධව චීන නියෝජිතයින් සමඟ සාකච්ඡා කිරීම**

2018.05.02 වන දින රිය අනතුරු බහුල ප්‍රදේශයන්හි CCTV කැමරා සවි කිරීම සම්බන්ධව චීන නියෝජිතයන් සමඟ සාකච්ඡාවක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමා විසින් සිදු කරන ලදී.

- **මාර්ග ආරක්ෂාවට නව ප්‍රවේශයක් යන මැයෙන් පැවැත්වූ විද්වත් සමුළුව**

ලෝක සෞඛ්‍යය සංවිධානයේ අනුග්‍රාහක දායකත්වය ඇතිව "නීතිය සවිබල ගැන්වීම තුළින් මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම" මැයෙන් 2018.05.08 වන දින ද "රථවාහන තදබදය අවම කිරීමට විද්‍යාත්මක කළමනාකරණයක්" මැයෙන් 2018.05.09 දින ද කමිටු රැස්වීම් දෙකක් පැවැත්වූ අතර, "මාර්ග ආරක්ෂාවට නව ප්‍රවේශයක්" යන මැයෙන් 2018.05.10 සහ 11 දෙදින ප්‍රධාන සමුළුව ජාතික සහ අන්තර් ජාතික විද්වතුන්ගේ සහභාගීත්වයෙන් කොළඹ

කිංග්ස්බරි හෝටලයේදී පවත්වන ලදී. මේ සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් රු.61,460.00 ක වියදමක් දරණ ලදි.

- **මාර්ග ආරක්ෂණ ඒකක පිහිටුවීමේ වැඩසටහන**

2018.05.15 වැනි දින සබරගමුව පළාත් මාර්ග ආරක්ෂණ ඒකකය හා 2018.11.29 වැනි දින නැගෙනහිර පළාත් මාර්ග ආරක්ෂණ ඒකකය පිහිටුවන ලදී.

- **හප්පා පළා ගිය, අනතුරුවලට ලක්වූ වින්දිතයන්හට වන්දි ලබා දීම**

2018.10.01 වන දින බත්තරමුල්ල ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යංශ ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර, මෙහිදී වින්දිතයන් 12 දෙනෙකු සඳහා වන්දි ප්‍රදානය කිරීම සිදු කරන ලදී.